# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2019.10.22

වර්ෂ 2019 ක් වූ ඔක්තෝම්බර් මස 22 වන අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ ඔක්තෝම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ධන්ස්ටන් මැතිතුමා
16. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
17. ගරු මන්ත්‍රිනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
18. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
19. ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
20. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
21. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
22. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**<u>1) 2019.09.24 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019.09.24 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2019.09.24 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා** ඃ- 2019.09.24 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

බොහොම හොඳයි. 100% ක් නිවැරදියි. සංශෝධන නෑ.

2019.09.24 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ සභාව තමයි මේ ආණ්ඩුවේ අන්තිම සභාව කියන එක අපි හිතනවා. මේ සභාව තමයි මේ ආණ්ඩුව යටතේ පවත්වන අන්තිම සභාව.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි. මේ ආණ්ඩුව ඉවර වුණාට පස්සේ එන්නේ අපේ ආණ්ඩුවක් නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊළඟට අපේ ජනාධිපතිවරයෙක් යටතේ තමයි ඊළඟ සභාව පවත්වන්න හැකිවන්නේ. අපේ අගමැතිවරයෙක් යටතේ, අපේ ජනාධිපතිවරයෙක් යටතේ තමයි ඊළඟට අපි සභාව පවත්වන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** 17 න් පස්සේ ඔක්කොම ප්‍රාදේශීය සභා ටික අපි විසුරුවනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කුලප්පු වෙනකොට පේනවා මොකද වෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි කෘෂිකර්මාන්තය දියුණු කරලා සංචාරක කර්මාන්තය වැඩි කරන්නේ නෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අවුරුදු 05 ක් ඔයගොල්ලෝ යහපාලනය කරා. ඒ ඇති. දැන් යන්න කාලය ඇවිල්ලා. ඔබතුමන්ලාට මඤ්ඤං වෙලා තියෙන්නේ. මට ආරංචි වුණා කියාස් මන්ත්‍රීතුමත් ඒ පැත්තේ මුස්ලිම් ජනතාවට කියලා තියෙනවා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට ඡන්දය ලබා දෙන්න කියලා. බොහොම ස්තුතිවන්ත වෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මුස්ලිම් ජනතාව ඡන්දය දෙනවා. ඔබතුමන්ලා තමයි මුස්ලිම් ජනතාවගේ ජාතිවාදය අවුස්සන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- ඒ ගැන කතා කරන්න එන්න එපා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මුස්ලිම් ජනතාව ගෝඨාභයට වැඩ කරොත් දේශප්‍රේමී. සජිත්ට වැඩ කරොත් දේශද්‍රෝහී. අතාවුල්ලා, හිස්බුල්ලා, පිල්ලෙයාන්, කරුණා අම්මාන්, වර්ධරාජා පෙරුමාල් දේශප්‍රේමී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හිස්බුල්ලා වෙනම අපේක්ෂකයෙක්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක නිසා ඒ ගැන පොඩ්ඩක් කතා කරන්න. ඊළාම් කොඩිය උස්සපු වර්ධරාජා පෙරුමාල් ඉන්නේ ඔයගොල්ලොත් එක්ක. කාත්තන්කුඩියේ මිනීමරපු කෙනා, දළඳා මාලිගාවට බෝම්බ ගහපු කෙනා ඉන්නේ ඔයගොල්ලොත් එක්ක. කරුණා අම්මාන්ලා, පිල්ලෙයාන්ලා දැන් දේශප්‍රේමී වෙලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ගොල්ලෝ අද ඊයේ නෙමෙයි අවුරුදු 10 ක් තිස්සේ ඉන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පරීක්ෂණ හැම එකක්ම කරාට කිසිම චෝදනාවක් නෑ රිෂාඩ් බදුර්දීන්ට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි හරි මන්ත්‍රීතුමා නොවැම්බර් 16 බලාගමු. 17 වෙනිදා එළිවෙනකොට මේ රටේ ජනාධිපති වෙන්නේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා. ලියලා තියා ගන්න. ඡන්ද ලක්ෂ 68 ක් අරගෙන එතුමා ජනාධිපති වෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මැතිවරණයෙන් පස්සේ සමහර විට මම සභාපති වෙන්නත් පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හීනෙන් තමයි. සභාව විසුරුවන්න බෑ. සජිත් ප්‍රේමදාසට වගේ මොලේ අමාරුව දැන් හැදිලා තියෙන්නේ. දැන් අපි බලන් ඉන්නේ අපේ ගෙවල්වලට එනකම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සජිත් ප්‍රේමදාසට නඩු නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් යන නඩු කාගෙද? නිවාස අධිකාරියේ නඩු ටික දැන් කාටද යන්නේ. පරීක්ෂණ කාටද කෙරෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මොනවද ඕන. සිරිපාදේ සණ්ටාරේ ඕන අපිට. මේ ඔක්කොම ජනතාව දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කතා ඕන නෑ. අපි බලමු ලබන සභාවේදී ජනාධිපති කවුද කියලා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභාපතිතුමා ඔට්ටුවක් අල්ලමුද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමාගේ හෘද සාක්ෂිය අනුව කතා කරොත් මම දන්නවා මේ රටේ තත්ත්වය මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමාට දැන් මෙතුමා හොඳද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ එහෙම එකක් නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගෝඨාභයට කතා කරනවා නම් දෙන්නා හොඳයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. විනාඩියක් ඇහුම්කන් දෙන්න විරුද්ධ පක්ෂයේ නායකතුමා.

ගරු සභාපතිතුමනි, මටත් පොඩි ජොලියක් තියෙනවා. අද වැඩේ තියෙන්නේ ඉස්සෙල්ලම බෝම්බේ ගැහුවේ සභාපතිතුමා. මට අද තියෙන ජොලිය ඒක නෙමෙයි. මොකද අද අපේ කියාස් මන්ත්‍රීතුමා ඇතුළු හුඟ දෙනෙක් නැගිටලා තියෙනවා. වොයිස්කට් දුන්නේ නෑ නේද ගිහිල්ලා. කියන්න බලන්න මොකක්වත් වොයිස්කට් දුන්නද කියලා. සභාපතිතුමාට දුන්නේ නෑ නේද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** දුන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එහෙමනම් කමක් නෑ. නැත්නම් මම බොරුවට කතා කරනවා. අරවා ටික අත්සන් කරලා දෙන්න ඕන කියලා දුන්නේ නෑ නේද?.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, මම මේ සභාවේ සභික මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට මුලින්ම ස්තුතිය ප්‍රකාශ කරනවා. මේ ගංවතුර තත්ත්වයේදී, පසුගිය දවස්වල ඇතිවෙච්ච ව්‍යසනයේදී එකමුතුව වැඩ කරා, මමත් ඒ ව්‍යසනයට ලක්වෙලා ඉඳපු මොහොතක. බොහෝමත්ම සහෝදරත්වයෙන් මගේ ගම්මානයටත් ඇවිල්ලා වැඩ කරා කවුරු කවුරුත් පක්ෂ භේදයකින් තොරව. ඒ කරපු ක්‍රියාමාර්ග වලට, ඒ කරපු උදවු උපකාර වලට හදවතින්ම ස්තුති කරනවා සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** බෝපෙ පෝද්දල දහම් පාසල් ගුරුභවතුන්ට උපහාර උළෙලක් පැවැත්වීම - 2019 දෙසැම්බර් (ගරු ලේකම්, බෝපෙ පෝද්දල දහම් පාසල් ගුරු සංගමය, කරාපිටිය.)

මේක ඉතාමත්ම වටිනා වැඩක්. දහම් පාසල් ගුරු මහත්ම මහත්මීන් නොමිලේ තමයි තමන්ගේ සේවය කරන්නේ. දහම් පාසල් ගුරු සංගමය ඉල්ලීමක් කරලා තියෙනවා මුළු බෝපෙ පෝද්දල සියලුම දහම් පාසල් ගුරුවරුන්ට උපහාර උළෙලක් පවත්වන්න. සභාවෙන් ඒකට යම් කිසි සහයෝගයක් බලාපොරොත්තු වෙනවා. ඒ අනුව තමයි මේ ලිපිය ඉදිරිපත් කරලා තියෙන්නේ. ඒකට අදහස මොකක්ද සභාවේ.

සභාවක් විදියට අපි යම්කිසි දායකත්වයක් ලබා දෙන්න ඕන දහම් පාසල් ගුරුවරු ඇගයීමට. අපි දන්නවා අද බොහොම අමාරුවෙන් තමයි දහම් පාසලකට ගුරුවරු ඇවිල්ලා වැඩ කරන්නේ. සාරියක්වත් ගන්න පුළුවන් මට්ටමක නෑ මම හිතන්නේ. ඒ උපහාර උළෙලට යම් දායකත්වයක් ඉල්ලනවා අපේ සභාවෙන් පූජ්‍ය ශාස්ත්‍රවේදී අක්මීමන ධම්මරතන හාමුදුරුවෝ. කවුරුත් දන්නවා ඒ සමථ මණ්ඩලයේ ගරු සභාපති ස්වාමීන් වහන්සේ. උන්වහන්සේ තමයි මේ සංගමයේ සභාපතිධූරය දරන්නේ. ඒකට මම යෝජනාවක් විදියට කරනවා රු. 30,000.00 ක මුදලක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ලබා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** නිල සෙවණ කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඉඩමක් ලබා ගැනීම. 124/ඒ, තුන්හිරිපාන (චන්දිම සී මුහන්දිරම්ගේ මයා, ප්‍රාදේශීය ලේකම් වැ.ආ., බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)

එතන බේකරියට අල්ලපු ඉඩම මේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා, ඔබතුමාට මේක පැහැදිලි කරන්න ඕන නෑ. පොදුවේ කිසි ප්‍රශ්නයක් නෑ. නිල සෙවණ අත්‍යාවශයයි. හැබැයි එකක් තියෙනවා ඒ වෙන්දේසි ඉඩමක කොටසක් වෙන්කරන්නේ පොදු පහසුකම් සඳහා. ඒ නිසා ඒ අයගේ අවසරය ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි අබේසේකර මන්ත්‍රීතුමා මම කියන්න ගියේ. මොකද පහුගිය ආණ්ඩුවේ අන්තිම කාලේ ගිහින් අපි මුල්ගලක් තිබ්බා ප්‍රජා ශාලාවක් හදන්න. ඔය තුන්හිරිපාන වසමටම පොදු රැස්වීමක්වත් තියන්න තැනක් නෑ. පන්සලක්වත් නෑ.

ගමේ අයත් එක්ක කතා කරලා අපි තීන්දුවක් ගන්න අවශ්‍ය වෙනවා. ඇතුලේ ඉඩම උද්‍යානයක් විදියට පාවිච්චි කරන්නේ. මල් වවලා ඒ මට්ටමේ තමයි පාවිච්චි කරන්නේ. ඇතුල්වෙන තැන දකුණු පැත්තේ ඉඩම මුළු ගමම ඉල්ලනවා, ස්වේච්ඡා සංවිධානවලින් ඉල්ලීමක් කරලා තියෙනවා එතන ප්‍රජා ශාලාවක් ඉදිකරන්න කියලා. මගේ අදහස ඔය කාරණා දෙකම ඉෂ්ඨ වෙන විදියක්. නිල සෙවණ හා ප්‍රජා ශාලාවක් යන කාරණා දෙකම ඉෂ්ඨ වෙන විදියට බලන්න වෙන්නේ බෙරලියදොළ වසම වගේ. ඒ විදියේ ක්‍රමයක් තමයි බලාපොරොත්තු වෙන්නේ.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභාපතිතුමා ඒ වගේ දෙයක් නම් ගොඩක් හොඳයි. මමත් නිල සෙවණට මුල්ගල් තියනවා. ඒක නිලධාරි මට්ටමෙන් තියන්නේ. මම සම්බන්ධ වෙන්නේ නෑ. මොකද හේතුව රටේ නීතිය දිහා බලලා මම එහෙම තීරණයක් අර ගත්තේ නිල සෙවණ ප්‍රශ්නය නිසා. මට ගමේ ඉන්න මිනිස්සු දිහා බැලුවහම පේනවා ගොඩක් අපහසුතාවයට පත් වෙනවා. ඒ වගේ දේකට අපේ එකඟතාවය ලබා දිය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වක්වැල්ලේ කොතනද?.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** වක්වැල්ලේ, බටුවන්තුඩාවේ දැනට ප්‍රජාශාලාව තියෙන ස්ථානයේ ඉතිරි කොටසේ. ඒක රජයේ ඉඩමක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දුවවත්තෙද?.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** බටුවන්තුඩාව පීල්ලට උඩින්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මුල්ගල් තියනවාද?.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** අපේ චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමාට දැනගන්න කියන්නේ අපි මුල්ගල් තියනවා කියලා ලොකු උත්සව තියලා, බැනර් දාලා මැතිවරණ නීති උල්ලංඝනය කරන්නේ නෑ. නිලධාරීන්, ගම්වාසීන් අවශ්‍ය දේ සපයනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- සංවිධායකතුමාට උද්ඝෝෂණ කරපු නිසාද?.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම කියන්නේ ගරු උප සභාපතිතුමා මම කරන දේ. මම කාගේවත් දේවල් නෙමෙයි කතා කරේ. මම කරන දේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමිය මාතෘකාවෙන් එහාට ගියා. මෙතන කතා කරේ අපි තුන්හිරිපානේ නිල සෙවණ ගැන. එතනදී අපි ඒ ගැන කතා කරමු. අපි ගමේ ස්වෙච්ඡා සංවිධාන එක්ක සාකච්ඡා කරලා ඉදිරි සභාවේදී මේකට තීන්දුවක් ගමු.

( ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**03.** සිමෙන්ති ලෑලි කැට 15 ක් ලබා ගැනීම සඳහා. (ත්‍රීරෝද රථ එකමුතුව, පැලවත්ත හන්දිය)

මම යෝජනා කරනවා සහා අරමුදලින් ස්ලැබ් කෑලි කිහිපයක් තාක්ෂණ නිලධාරීගේ අධීක්ෂණය යටතේ සකස් කරලා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

සභාපතිතුමා එතන හැදුවහම බස් රථ එනකම් රැඳී ඉන්න අයටත් පහසුයි. ඒක තවදුරටත් යොදන්න පුළුවන්නම් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**04.** නිවෙස් සඳහා යාමට ඇති පාර අවහිර කිරීම සම්බන්ධව. (එම්. එච්. සුමතිපාල මයා, 22/3, වී.සී. පාර, කලේගාන, ගාල්ල.)

මේකට කලිනුත් සභා තීන්දුවක් අරගෙන තියෙනවා. සභාවට දාලා අපි සාකච්ඡා කරපු දෙයක්. මේක දැන් වර්තමානයේ ප්‍රධාන සැලැස්ම උසාවියෙන් ලැබිලා තියෙනවා. ඒ මාර්ගය ඍජු මාර්ගයක් විදියට තිබුණට දැනට මේ පාර තියෙන්නේ එහෙම නෙමෙයි. තාප්ප හදලා වෙනස් විදියකට තියෙන්නේ. මෙයා ඉල්ලන්නේ මේ අනුබෙදුමේ විදියට මිනින්දෝරුවෙකු ලව්වා ඒක මැනලා දෙන්න කියලා. ඒකට මම යෝජනා කරනවා සහා අරමුදලෙන් මිනින්දෝරුවකු ලව්වා මැනුම් කටයුතු සිදු කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ කාරණයට එතුමා ගොඩක් මහන්සි වුණා. මේක තිස්ස වේවැල්වල මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයේ තියෙන ප්‍රශ්නයක්. අපි හිතන්නේ පර්චස් 07 කට යන්න තියෙන පාරක් මේ. අනවසර ඉදිකිරීම් තියෙනවා. අපි පරීක්ෂණයක් කරලා ඒ පිඹුරට සාපේක්ෂව ඒ කටයුත්ත කරන්න කියලා සභාවක් විදියට කියනවා. එතුමාට සහ සියලු දෙනාටම සාධාරණයක් ඉෂ්ඨ වෙන අයුරින් මේ කාර්යය කරන්න කියලා සඳහන් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මමත් ඒකට දෙපාරක් විතර ගියා.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**05.** අනුග්‍රාහකත්වය ලබා ගැනීම සඳහා. (පී. ඒ. ආර්. වසන්ත කුමාර මයා, ගජවත්ත, නරාවල, පෝද්දල.)

එතුමා බලාපොරොත්තු වෙන්නේ සභාවෙන් යම් කිසි දායකත්වයක්. එතුමාගේ සහතිකත් තියෙනවා. තෝරා ගැනීම පිළිබඳ විස්තරත් තියෙනවා. පුවත්පතේ පලවෙච්ච දැන්වීම පවා තියෙනවා. දෙරණ රූපවාහිනී නාලිකාවේ පවා එතුමාගේ දක්ෂතා ගැන ගියා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මේ තරුණයාට අත හිත දෙන්න. මම උදාහරණයක් කියන්නම්. 1999 දී මම ලංකාවේ ශක්තිමත්ම තරුණයා තෝරන තරඟයට ඉදිරිපත් වුණා රටවල් 16 ක් එක්ක. මම හිතන්නේ ඒක සජීවීව ලබා දුන්නා. එතනදී මට උළුකැට 600 ක් ගන්න මුදල් හොයා ගන්න අපහසු වුණා. මොකද ඒ කාලේ උළු කැටයක් රුපියල් දහයයි. රුපියල් හයදාහක මුදලක් හොයා ගන්න මම ගොඩක් අසරණ වුණා. දෙමව්පියෝ කැමති වුණෙත් නෑ මම තරඟයට ඉදිරිපත් වෙනවාට. ඒ වෙලාවේ යාළුවෝ තමයි මට උදවු කරේ. ඇත්තටම එතනදී මම ගොඩක් අසරණ වුණා. ශක්තිය ලෝකයට පෙන්නන්න ගිය අවස්ථාව. ඒ හින්දා මේ වගේ තරුණයන්ට අත හිත දෙන්න කියලා මම සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව දෙන්න වෙන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, රුපියල් එක් ලක්ෂ විසි දාහක් විතර යනවා ඒකට. රුපියල් විසිදාහක මුදලක් සභා අරමුදලෙන් ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මගේ කොට්ඨාශයේ මාත් එක්කම ජනතා විමුක්ති පෙරමුණෙන් තරග වැදුණ අපේක්ෂකතුමා මේ. අපි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව තුළ පක්ෂ පාට බලලා දේශපාලනය කරන්නේ නෑ කියලා මේකෙන් ඔප්පු කරලා පෙන්වනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔන්න අපේ ප්‍රජාතන්ත්‍රවාදය දැක්කද.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ-** නැත

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන කාර්යාලයට අයත් ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද වරිපනම් පනවා ඇති ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක් සඳහා වාර්ෂික වටිනාකම 2015 වර්ෂයේදී බලපැවැත් වූ තක්සේරුව 2019 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමටත්, පෝද්දල උප කාර්යාලයීය බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශය තුළ පිහිටා ඇති වරිපනම් බදු පනවා ඇති ප්‍රදේශයේ පිහිටි සෑම නිශ්චල දේපළක් සඳහාම වරිපනම් බදු අයකිරීම සඳහා වන වාර්ෂික වටිනාකම ලෙස 2017 වර්ෂයේ නියම කරන ලද තක්සේරුව පිළිගැනීමටත්, එකී පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ඉහතින් විස්තර කරන ලද වරිපනම් ප්‍රදේශය තුළ පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික වටිනාකමින් 7% බැගින් වරිපනම් බද්දක් පනවා අය කිරීමටත්, එකී පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යථෝක්ත වාර්ෂික වරිපනම් බද්ද 2020 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන් වලින් අවසන් වන කාර්තු 04 තුළදී සමාන වාරික 04 කින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බවටද, එකී පනතේ 134 (7) වැනි වගන්තිය ප්‍රකාර එකී වාර්ෂික බදු මුදල් වර්ෂ 2020 ක් වූ ජනවාරි මස 31 දින හෝ ඊට ප්‍රථම ගෙවුවහොත් එම වර්ෂයේ වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද දෙනු ලැබෙන අතර එක් එක් කාර්තුවේ පළමු මාසය තුළ ගෙවනු ලබන විට කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද ලබා දිය යුතු බවටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කරන කොට දාන්න ඕන ගිය අවුරුද්දේ කීයක් තිබුණද, මේ අවුරුද්දේ කීයක් වැඩි කරාද, ඒ ගාන සඳහන්

කරන්න ඕන. එහෙම සඳහනක් නෑ. අපි දන්නේ නෑ අයකරපු ගාන කොච්චරද, වැඩි කරපු ගාන කොච්චරද කියලා. ඒක නිවැරදි කරන්න. ඒක අපි දැන ගන්න එපැයි. ඒක දාලා නෑ. මේකේ සමහර ඒවා හුගක් වැඩි කරලා තියෙනවා.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ක්ෂේත්‍ර කිහිපයක වැඩි වීම වෙලා තියෙනවා. ඒ සම්බන්ධව සභාව දැනුවත් කරානම් ඉවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අයවැය හදන එකේ සාකච්ඡාවට එන්න කියලා දැනුම් දුන්නා. සහභාගි වුනේ නෑ කවුරුවත්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සාකච්ඡාවට ආවේ නැති එක නෙමෙයි ප්‍රශ්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාවට ඉදිරිපත් කරද්දි, ඉදිරිපත් කරන්න ඕන පහුගිය අවුරුද්දේ තිබුණේ මෙහෙමයි. මේ අවුරුද්දේ මෙහෙමයි කියලා. එතකොට තමයි නිවැරදි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක ඉදිරිපත් කරන්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම හිතුවේ ඇත්තටම බදු හුගක් අඩු වෙයි කියලා. හේතුව ජනාධිපති අපේක්ෂකතුමා කියලා තිබුණා බදු ඔක්කොම අයින් කරනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති අපේක්ෂකතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා ජනාධිපති වුණාම අඩුකරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එතුමා කියලා තියෙනවා බදු ඔක්කොම අඩු කරනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බදු අඩුකරනවා කියලා තියෙන්නේ එතුමා නෙමෙයි. 12% තියෙන බදු 8% ට අඩු කරනවා කියලා කිවුවේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔයාලා ජනාධිපති සිහිනයෙන් නිකං හරි ජනාධිපති වුණොත් එදාට ගේන්න මේක. සභාවේ ආපහු අඩු කරන්න වෙනවානේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** වැඩි කිරීමක් වෙලා නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** වැඩි කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අයදුම්පත්‍ර සඳහා වැඩි කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අයදුම්පත්‍ර සඳහා විතරක් නෙමෙයි තව හුගක් වැඩි කරලා තියෙනවා. ඔයගොල්ලෝ දුප්පත් ජනතාව ගැන කතා කරනවා. බදු ඔක්කොම 6% ට අඩු කරනවා කියලා තියෙනවා. මිනිස්සුන්ට සහාය දෙන්න ඕන කියලා තියෙනවා. මේක ඔබතුමාලා සිහිනෙන් හරි එතුමා ජනාධිපති වුණොත් ඊට පස්සේ ගෙනාවොතින් හොඳයි කියලා මම යෝජනාව කරනවා එහෙම කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක කාටවත් වළක්වන්න බෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** දැන් එතුමා බැංකු ණය පොළිය අඩු කරනවා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මං අහන්නේ දැන් සජිත් ප්‍රේමදාස මොන බදුද අඩු කරන්නේ. එතුමා මේ ආණ්ඩුවේ නෙමෙයිද?. එතුමා මොන බදුද අඩු කරන්නේ. කාබන් බද්ද ගැහුවේ මොන ආණ්ඩුවෙන්ද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ සභාව ආපු දවසේ ඉඳන් බදු ගහලා ගහලා වැඩි කරා. බිම් මට්ටමේ ඉන්න මිනිස්සුන්ව තලනවා බදු ගහලා. ජනාධිපති අපේක්ෂකතුමා කිවුවේ බදු අඩු කරනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොනවද වැඩි වෙලා තියෙන්නේ කියලා මට පෙන්වන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** තාවකාලික බලපත්‍ර ගාස්තුව තිබුණේ රුපියල් 50 යි. ගිය අවුරුද්දේ 500 කරා. මේ අවුරුද්දේ රුපියල් 1000 කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොන බලපත්‍රද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** තාවකාලික ඝාතන බලපත්‍ර. එළුවෙක්, කුකුළෙක් මරන්න බලපත්‍ර ගාස්තුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවා වැඩි වෙන්න ඕන. ඒවා බොහොම කීපයයිනේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ ඒකයි මම කිවුවේ. 100% ක් බද්ද වැඩි කරලා තියෙනවා. මුලින් 50 තිබුණ එක සභාව 500 කරා. දැන් රුපියල් 1000 යි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම පරණ එක ගෙනත් පෙන්වන්නම් මොනවද වැඩි වෙලා තියෙන්නේ කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** පරණ එකේ 500 යි. දැන් 1000 යි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙතුමාගේ ඉල්ලීම සාධාරණයි. අපිට ඉදිරිපත් කරන කොට වෙන වෙනම පෙන්වන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් පෙන්වන්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කොලේ වහලා ගහලා හරියන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ගෙනල්ලා පෙන්වන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කීපයක්නේ තියෙන්නේ. ඒ ටික පැහැදිලිව ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමනි, මේ බදුවල මේ පාර වෙච්ච එකක් නෙමෙයි මොකක් හරි වැරැද්දක් තියේ නම් නිවැරදි කර ගන්න බලන්න ඕන. දැන් බලන්න බත් කඩ කියලා තියෙනවා. බත් කඩ කිවුවහම පොඩි කඩත් තියෙනවා. නිකං පොඩි කෑම කීපයක් දෙන කඩ තියෙනවා. මේකටත් රුපියල් 1000 යි. ඊළඟට සංචාරක වෙළඳ ස්ථානයන්ටත් රුපියල් 1000 යි. ලොකු වරදක් තියෙනවා ඇත්තටම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ තියෙන්නේ වාර්ෂික වටිනාකම රුපියල් 1500 ඉක්මවන අවස්ථාව. මේක පනතේ තියෙන්නේ මෙහෙම අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පනතේ තිබුණට මේ බදු වැඩි කරන කොට වැඩි වන ප්‍රමාණය රුපියල් 1000 නම් සංචාරක හෝටලයකට, අයිස්ක්‍රීම් කර්මාන්ත ශාලාවකට රුපියල් 1000 ක් ගන්න එක අසාධාරණයි. ඒ නිසා ඒ පිළිබඳව ඕන බලන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඕක දැන් ක්ෂේත්‍ර කිහිපයකනේ වෙලා තියෙන්නේ. ඕක වෙනම ගෙනල්ලා කියවන්න. අඩු පාඩුවක් වෙලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අරකේ වෙනස්කම් ටික කියවන්නම් ලොකු වෙනස්කම් නෑ බදු වැඩිවීමක් වෙලා නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අයදුම්පත්‍ර කීපයක වැඩි වීමක් වෙලා තියෙනවා ඒක වෙනම කියවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** **:-** ඒක මම වෙනම කියවන්නම්.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** 2013.05.17 වැනි දින අංක 1811 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 වන දින අංක 1878 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද, 2015.04.21 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේදී ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන 2015.09.11 වන දින සිට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව විසින් 2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ 1 වැනි තීරුව දක්වෙන ව්‍යාපාරය /කර්මාන්තය සම්බන්ධයෙන් වන විට දී එයට ඉදිරියෙන් II තීරුව දක්වෙන එකී ව්‍යාපාරය කර්මාන්තය / කර්මාන්තය පවත්වාගෙන යන ස්ථානයේ හෝ පරිශ්‍රයේ වාර්ෂික වටිනාකමට අදාළව දක්වෙන බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්, එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය / ව්‍යාපාරය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එම මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගන්නා වූ හෝටලයක් / ආපනශාලාවක් / නවාතැන්පළක් වන අවස්ථාවක ඉහත කී උපලේඛනයේ II වැනි තීරුවේ කුමක් සඳහන් වුව ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන්පළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍රය සඳහා වන ගාස්තුව ඒ හෝටලය හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පළේ 2019 වර්ෂය තුළ ලැබූ ආදායමින් 1% ක් විය යුතු බවත් යෝජනා කරමි.

**උප ලේඛනය**

| **I තිරුව** | | **II තිරුව** | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව<br>**රු. ශත** | වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන එහෙත් රු.1,500 නොඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව<br>**රු. ශත** | වාර්ෂික වටිනාකම රු.1,500 ඉක්මවන අවස්ථාවක බලපත්‍ර ගාස්තුව<br>**රු. ශත** |
| 01 | මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | මස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | සිසිල් බීම කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 04 | කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 05 | බේකරි | 500.00 | 750.00 | 1000.00 |
| 06 | කිරිපට්ටි | 500.00 | 750.00 | 1000.00 |
| 07 | පිහිණුම් තටාක | 500.00 | 750.00 | 1000.00 |
| 08 | අයිස් කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 09 | බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | හෝටල් | 500.00 | 750.00 | 1000.00 |
| 11 | නවාතැන් පොළවල් | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ලොන්ඩරි | 500.00 | 750.00 | 1000.00 |
| 13 | කර්මාන්තශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 14 | සංචාරක වෙළඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 16 | යෝගට් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 17 | ක්ෂණික ආහාර විකිණීම හා නිපදවීම (පේස්ට්‍රි ෂොප්) | 500.00 | 750.00 | 1000.00 |
| 18 | ශීතකල මස් හෝ මාලු විකිණීම, ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | ඌරු කොටුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | මස් පිණිස, බිත්තර පිණිස, කුකුළන් කිකිළියන් ඇති කිරීම (කුකුළු කොටුවක් පවත්වාගෙන යාම) | 500.00 | 750.00 | 1000.00 |
| 21 | අවමංගල සේවා සපයන ස්ථානයක් (මල් ශාලාවක්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, මෙතන තියෙනවා මම දකින යම් කිසි වැරැද්දක්. වැඩියෙන් උපයන කර්මාන්ත තියෙනවා. ඒවාටත් එක සමාන ගානක් යන්නේ. අඩුවෙන් උපයන එකටත් එක ගානක් යන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මෙහෙමයි සුගත් මන්ත්‍රීතුමා මෙතනදී පනත අනුව තමයි කාරණාව ඉෂ්ඨ වෙන්නේ. දෙවැනි එක පරිසර බලපත්‍රය අනුව වෙන්නේ. උදාහරණයක් අපිට සභාව සතු භූමිය බදු දෙන කොට රුපියල් දාහකට වැඩිය අය කරන්න බෑ. ඒ වගේ සීමාවල් තියෙනවා මෙතනදී. අපි පරිසර බලපත්‍ර ලබා දෙන කොට දෙන තක්සේරුවට තමයි බදු තීරණය කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** පෞද්ගලික පාසල් තියෙනවා. ඒ පාසල්වලින් අය වෙන්නේ නැනේ. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික පාසල් තියෙනවා. ඒ පාසල්වල නොමිලේ උගන්වන්නේ නැනේ. මුදලක් අය කර ගෙන උගන්වන්නේ. ඒකයි වෙන්න ඕන. ඒ වගේ ඒවත් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මෙතන තියෙන්නේ සුගත් මන්ත්‍රීතුමා වෙළඳ බලපත්‍රයට අය කරන මුදල. ඕක අද ඊයේ නෙමෙයි හැමදාම ආපු දෙයක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මෙහෙමයි ඉතිං පනත සංශෝධනය වෙන්න ඕන. මේ දේවල් අපි දකින දේවල්. මේවට අවධානය යොමු කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැන් මෙතනදී එක කාරණයක් තියෙනවා. මෙතෙක් තිබුණේ අනතුරුදායක ගස් සඳහා කොස් ගසකට රුපියල් 800 යි, පොල් ගසකට රුපියල් 600 යි, වෙනත් ගසකට රුපියල් 200 යි. දැන් සියලුම ගස් සඳහා රුපියල් 500 යි. අන්න ඒ වගේ තමයි වෙනස්කම් කරේ. ඒක මම ඉදිරිපත් කරපු දෙයක්. කොස් ගහක් වුණාට අනතුරුවෙන මිනිහා තමයි මේක ඉල්ලන්නේ. කොස් ගහේ වටිනාකම වැඩියි කියලා වැඩියෙන් ගෙවන එක අසාධාරණයි. දැන් සියලු ගස් වලට රුපියල් 500 යි. ගහේ වටිනාකම නෙමෙයි මෙතනදී බලන්න ඕන. අපේ ලියකියවිලි වලට යන වියදම.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** අනතුරුදායක ගස් ඉවත් කිරීමේදී මීට වඩා ප්‍රමුඛතාවය දෙන්න. ගාණ වැඩිකරන වෙලාවේ ඒකත් කියන්න එපැයි.

( ගරු මන්ත්‍රිනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා මේ සම්බන්ධව ඇති ගැටළු පිළිබඳව ආදායම් පරීක්ෂකතුමාට සභාව දැනුවත් කරන ලෙස.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ආදායම් පරීක්ෂක එල්. වයි. අබේතුංග මයා පහත අදහස් දක්වා සිටින ලදී.

- පනවා ඇති බදු හා ගාස්තු ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව සිදු කර ඇති බව.
- වෙළඳ බදු උපයන ආදායම මත පනවන බව හා අයකළ හැකි උපරිමය රුපියල් 3000 ක් බව.
- ප්‍රාදේශීය සභා පනතේ අඩුපාඩු ඇති බවත්, පනත ඉක්මවා ක්‍රියාකිරීමට හැකියාව නොමැති බවත්.

කාරක සභා අවස්ථාවේදී ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා පහත අදහස් දක්වා සිටින ලදී.

- ප්‍රාදේශීය සභා පනතේ අංක 150/2 වගන්තිය අනුව අයකල හැකි උපරිම බදු හා ගාස්තු පිළිබඳව.
- 1987 දී සාදන ලද ප්‍රාදේශීය සභා පනත තවම ක්‍රියාත්මක වන බව.
- වැඩි වූ හා අඩු වූ බදු හා ගාස්තු පිළිබඳව

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) වැනි උප වගන්තියේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් එක් එක් කර්මාන්ත වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුරූප වන තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්ද 2020 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

**උපලේඛනය**

| | I වැනි තීරුව | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | **කර්මාන්තයේ ස්වභාවය** | **වාර්ෂික වටිනාකම රු:750/-ට වැඩි නොවන රු. ශත** | **වාර්ෂික වටිනාකම රු:750/- සිට 1500 දක්වා රු. ශත** | **වාර්ෂික වටිනාකම රු:1500 ට වැඩි ස්ථාන රු. ශත** |
| 1. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | වෙල්ඩින් වැඩපළක් හෝ ඩ්‍රිල් වැඩ පළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 3. | බලවේග යන්ත්‍ර මගින් නූල් නිෂ්පාදනය , පුළුන් සකස් කිරීම හා රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 4. | ස්ක්‍රීන් ප්‍රින්ටින් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 5. | කොන්ක්‍රීට් සිලින්ඩර් හෝ වෙනත් සිමෙන්ති භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 6. | සිමෙන්ති බ්ලොක්ගල්, මල් පෝච්චි , බීරළු නිපදවීම හෝ විකිණීම ස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. | වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, පරිගණක යන්ත්‍ර, සෙලියුලර්, අධිශීතකරණ, දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8. | මෝටර් කොයිල් එතීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 9. | පොහොර වර්ග, කෘෂි රසායනික ද්‍රව්‍ය , පොහොර නිපදවීම, සත්ව ආහාර වර්ග නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | ගල්වලක් හෝ අතින් ගල් කඩන ස්ථානයක් පැවැත්වීම (කබොක්, බොරළු, හෝ කළු ගල් ) | 500.00 | 750.00 | 1000.00 |
| 11. | බෝට්ටු එන්ජින් අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | වී පාහින මෝලක් පවත්වාගෙන යාම/ධාන්‍ය ඇඹරීම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | විදුලි බලයෙන් හෝ අත් යන්ත්‍ර මගින් ක්‍රියා කරන මුද්‍රණාලයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 14. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර, කැමරා වීඩියෝ, ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | අතින් පාවහන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | ගල් ස්මාරක, සිහිවටන පුවරු සෑදීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 17. | විදුලි උත්පාදක යන්ත්‍ර (ජෙනරේටර්) කුලියට දීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18. | ලී වෙළඳසැලක් පවත්වාගෙන යාම, යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම, ලෑලි සකස් කිරීම, පදම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | පොල් පරාල හා යට ලී ඉරන, ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | දර මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 21. | යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන වඩු මඩුවක් පවත්වාගෙන යාම/වඩුකර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22. | මැටි බඳුන් නිපදවීම, ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (විසිතුරු මැටි බඳුන් /කෝප්ප) | 500.00 | 750.00 | 1000.00 |
| 23. | කම්මලක් පවත්වාගෙන යාම. | 500.00 | 750.00 | 1000.00 |
| 24. | වැලි ගොඩදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25. | ත්‍රීරෝද රථ මෝටර් සයිකල් සර්විස් කිරීමේ ස්ථානයක් පැවත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 26. | පාපැදි අළුත්වැඩියා කිරීමේ (වින්කලයක්) ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 27. | මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක්/සේවා කිරීමේ ස්ථානයක් (ගරාජයක්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28. | යකඩ කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 29. | විදුලි භාණ්ඩ ශීතකරණ හෝ මහන මැෂින් හා අමතර කොටස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 30. | විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ නිපදවීමේ, අලි කැපීමේ ස්ථානයක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 31. | සම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 750.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 32. | කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 33. | වාහන ෂිට් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 34. | කිරුම් මිනුම් උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 35. | අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 36. | වානේ ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 37. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හා ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1000.00 |
| 38. | බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 39. | බලවේග රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 40. | සබන් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 41. | විදුලි කාර්මික වැඩ පළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 42. | ඉදල්, කොහු, පාපිසි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 43. | ගොඩනැගිලි ඉදිකිරීමේ උපකරණ බදු දීමේ (පලංචි ආදිය) ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 44. | පැන්ට්‍රි කබඩ් නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 45. | මැණික් ගල් කැපීමේ හා ඔපදැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 46. | කොප්පරා නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 47. | බහුකාර්ය වඩු කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 48. | සයිලන්සර් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 49. | ලෝහමය සුන්බුන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 50. | උළු හෝ ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 51. | යන්ත්‍ර මගින් කළුගල් කඩන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 52. | ලී බීරළු කැපීම | 500.00 | 750.00 | 1000.00 |
| 53. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති ගඩොල්/කැටගල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 54. | ගල් මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 55. | කොහු හා කොහු ලණුවලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 56. | තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි තැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 57. | මෙරට හෝ රට වේවැල්වලින් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 58. | බුරුසු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 59. | පොල් කටු අඟුරු පිලිස්සීමේ විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 60. | මෝටර් වාහන සඳහා බොඩි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 61. | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 62. | රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 63. | ලොරි බොඩි සෑදීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 64. | මැණික් කැපීම, ඔප දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 65. | බෑග් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 66. | අත පිසදමන කඩදාසි (සර්වියට් පේපර්ස්)/ බත් ඔතන කොළ (ලන්ච් ෂීට්) කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 67. | සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම, ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 68. | ජෑම්, සෝස්, සිරප්, පුඩිං, ජෙලි නිපදවීම හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 69. | විනාකිරි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 70. | රස කැවිලි නිපදවීම, කේක් වර්ග නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 71. | මිරිස්, ධාන්‍ය වර්ග, පිටි, මාංශ, බෙහෙත් ද්‍රව්‍ය කෙටීමේ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 72. | බැටරි චාර්ජ් කිරීම/ අළුත්වැඩියා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 73. | ෆයිබර් ග්ලාස්/ ප්ලාස්ටික් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 74. | කොහු මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 75. | පොල් ලෙලි හා දැව පල් කිරීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 76. | හුණු වැරටි පිළිස්සීම සඳහා පෝරණුවක් පවත්වාගෙන යාම ගබඩා කිරීම/ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 77. | හම් වර්ග පදම් කරන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 78. | හම් වර්ග වලින් හෝ රබර් වර්ග වලින් භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පැවතීම | 500.00 | 750.00 | 1000.00 |
| 79. | රබර් බුෂ් සාදන වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 80. | රබර් දුම් ගෙයක් පවත්වාගෙන යාම, රබර් ෂීට් නිපදවීම, රෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 81. | ගිණිකෙළි භාණ්ඩ, රතිඤ්ඤා නිපදවීම හෝ විකිණීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 82. | වාහන ගෑස් කිරීම හෝ ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 83. | ගෑස් ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 84. | රෙදි පින්තාරු, මුද්‍රණය, සායම් දමන ස්ථානයක් (බතික් වැඩපළක්) පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 85. | ස්වර්ණාභරණ නිපදවීම අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 86. | ස්වර්ණාභරණ පාට කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 600.00 | 750.00 |
| 87. | මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 88. | සබන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 89 | ලෝහ භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 90 | පිත්තල භාණ්ඩ නිපදවීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 91 | ටයර්, ටියුබ් වොල්කනයිසිං කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 92 | අලුත් හෝ පරණ ටයර්, ටියුබ් ගබඩා කිරීම, කට්ටා කැපීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 93 | කොප්පරා නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 94 | පොල් තෙල් හෝ වෙනත් තෙල් වර්ග නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධි විධාන යටතේ හෝ ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන් යටතේ හෝ බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නා වූ පහත උපලේඛනයේ පළවන කොටසේ දක්වෙන යම් ව්‍යාපාරයක් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පවත්වා ගෙන යන සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබූ ආදායම උපලේඛනයේ දෙවන කොටසේ පළමු තීරයේ දැක්වෙන පරාසය තුල පිහිටන විට එහි දෙවන තීරුවේ දැක්වෙන එයට  අනුරූපිතව ඇති බදු මුදල 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2020 වර්ෂයේ අප්‍රේල් 30 වන දිනට පෙර බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

**උප ලේඛනය**

**පළමු කොටස**

1. කොමිස් ඒජන්තවරුන්
2. බ්‍රෝකර්වරු
3. වෙන්දේසිකරුවන්
4. නීතිඥයින්
5. උකස් බඩු ගන්නන්
6. ගණන් පරීක්ෂවරුන්
7. කොන්ත්‍රාත්කරුවන්
8. රියදුරු පුහුණු ආයතන
9. ප්‍රවාහන නියෝජිතයන්
10. විදේශීය  රැකියා ඒජන්සි පවත්වන්නවුන්
11. නොතාරිස්වරුන්
12. මූල්‍ය  ආයතන හා බැංකු
13. මුදල්  සපයන්නන්  හෝ මුදල් ණයට දෙන්නන්
14. ගෘහ නිර්මාණ ශිල්පින්
15. රක්ෂණ නියෝජිතයන්
16. බැංකු පවත්වා ගෙන  යාම (වාණිජ බැංකු හා ග්‍රාමීය බැංකු)
17. ස්වර්ණාභරණ වෙළෙඳාම් කරන  ස්ථානයක් පවත්වාගෙන යාම
18. සම්ප්‍රේෂණ කුළුණක්  පවත්වාගෙන යාම
19. ඉන්ධන පිරවුම්හලක්  පවත්වාගෙන යාම
20. සාත්තු නිවාසයක්, විශේෂඥ වෛද්‍ය සේවා ස්ථානයක්, ශල්‍යාගාරයක් (පෞද්ගලික රෝහලක්) පවත්වාගෙන යාම
21. (රටබිම)  මත්පැන් විකිණීම වයින් ස්ටෝර්ස් එකක් පවත්වාගෙන යාම
22. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
23. අපනයනය සඳහා ඇඳුම් නිපදවීම
24. රේස් තුණ්ඩු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. පාවිච්චි  කළ හා /හෝ  අලුත්  මෝටර් රථ  ගෙන්වීම  හා/හෝ අමතර කොටස් වෙළඳාම් කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ අවසර නොගෙන වෙළඳාම් කිරීම ප්‍රදර්ශනය කිරීම.
26. ස්පයිස් තෙල් වර්ග, පින්තූර කාඩ් වර්ග, කුළුබඩු වර්ග විකිණීම හා වැවීම (සංචාරකයින් සඳහා )
27. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
28. ආරක්ෂක සේවා සපයන ස්ථානයක්  පවත්වාගෙන යාම (පෞද්ගලික)
29. සුදු යකඩ හා දැව වලින් භාණ්ඩ නිපදවීම, ගබඩා කිරීම හෝ විකිණීම
30. ලී මෝලක් හෝ දැව ගබඩාවක් පවත්වාගෙන යාම
31. ජාත්‍යන්තර පාසලක්  පවත්වාගෙන යාම
32. සුපිරි වෙළඳසැලක් (ෆුඩ් සිටි) පවත්වාගෙන  යාම

33. ත්‍රීරෝද රථ, යතුරු පැදි, මෝටර් වාහන විකිණීම
34. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
35. ට්‍රැවල් ඒජන්සියක් පවත්වාගෙන යාම
36. බැකෝ, ලෝඩර් යන්ත්‍ර , බැකෝ යන්ත්‍ර , ඩෝසර් හා මෝටර්ගේඩර් යන්ත්‍ර මාර්ග තලන හා පස් තලන යන්ත්‍ර , ට්‍රැක්ටර් හා ටිපර් කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර, කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. පොලිතින් බෑග් නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තැබීම ව්‍යාපාරයක් පැවැත්වීම
38. සිනමා ශාලාවක් පවත්වාගෙන යාම
39. වාහන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
40. රක්ෂණ සමාගමක් පවත්වාගෙන යාම
41. සැපයුම්කරුවන්
42. දේපළ වෙළඳාම් කිරීමේ සමාගමක් පවත්වාගෙන යාම
43. වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
44. ලොතරැයි නියෝජිතයින්
45. පෞද්ගලික අධ්‍යාපන පන්ති පවත්වාගෙන යාම
46. පෞද්ගලික පෙර පාසල් පැවැත්වීම
47. රැකියා ඒජන්තවරු
48. උත්සව පැවැත්වීම සඳහා ශාලාවක් පවත්වාගෙන යාම
49. උත්සව භාණ්ඩ කුලියට දීම
50. සිවිල් ඉංජිනේරු සම්බන්ධ උපදේශක සේවා සැපයීම
51. පෞද්ගලික හෙද විද්‍යාලක් පවත්වාගෙන යාම
52. පොල් එකතු කිරීමේ හෝ තොග හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
53. සහල් තොග හෝ සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. සාප්පු බඩු, මනි බඩු , සුවඳ විලවුන් ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. පාපැදි, මෝටර් සයිකල් හෝ ත්‍රී රෝද රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
57. විසිතුරු භාණ්ඩ හෝ කැටයම් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
58. බුලත්, පුවක්, කොහු, ඉදල්, කෙසෙල් කැන්, පලා වර්ග, මැටි භාණ්ඩ, තැඹිලි විකිණීම (සාමාන්‍ය වෙළෙඳාම)
59. ඉංග්‍රීසි බෙහෙත් බඩු විකුණන (ෆාමසි) ස්ථානයක් පවත්වාගෙන යාම.
60. සිංහල බෙහෙත් බඩු විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
61. ඉංග්‍රීසි හෝ සිංහල බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
62. දන්ත චිකිත්සාගාරයක් දත් බඳින ස්ථානයක්, ශල්‍යාගාරයක් එක්ස්රේ යන්ත්‍රයක් පවත්වාගෙන යාම
63. විකිණීම සඳහා බිම් මල් හෝ වෙනත් මල්, එළවළු, පළතුරු, පැල වර්ග බෙහෙත් පැලෑටි තවාන් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම
64. ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. ජ්‍යොතිෂ්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. මෙඩි ලැබ් එකක් (ලේ හා මුත්‍රා පරීක්ෂා කිරීමේ) ස්ථානයක් පවත්වාගෙන යාම
67. උළු, ගඩොල්, වැලි, ගල් සැපයීම හා විකිණීම
68. මනාලියන් හැඩ ගැන්වීම, කොණ්ඩා මෝස්තර දැමීම (බියුටි සැලූන්) උපකරණ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම/
69. රෙදි පිළි විකිණීමේ ස්ථානයක් (රෙදි කඩයක්) පවත්වාගෙන යාම
70. මසා නිමකළ ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
71. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (තනි මැෂිමක)
72. ඇස් කණ්ණාඩි (ඔප්ටිකල්ස්) නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
73. ඡායාරූප ශාලාවක් (ස්ටුඩියෝ) පවත්වාගෙන යාම
74. පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
75. සී.ඩී, වී.සී.ඩී. විඩියෝ කැසට් ගීත පටිගත කිරීම හෝ විකිණීම, කුලියට දීම, පවත්වාගෙන යාම, සංයුක්ත තැටි කුලියට දීම හා විකිණීම

76. ලිපිද්‍රව්‍ය , පුවත්පත් , සඟරා, පාසැල් උපකරණ (බුක්ෂොප්) පවත්වාගෙන යාම ගබඩා කිරීම හා විකිණීම.

77. දේශීය හා විදේශීය දුරකථන ඇමතුම් ලබාදීමේ ස්ථානයක් (කොමියුනිකේෂන්) පවත්වාගෙන යාම
78. ක්ෂණික ඡායා පිටපත් කිරීම, රෝනියෝ කිරීම, ලැමිනේටින් කිරීම, යතුරු ලියනය කර දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
79. පරිගණක යන්ත්‍ර විකිණීමේ, අලුත්වැඩියා කිරීමේ, පුහුණු පාඨමාලා පැවැත්වීම, සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
80. විදේශ චෙක්පත් (මුදල්) මාරු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
81. ගොඩනැගිලි ද්‍රව්‍ය (හාඩ්වෙයාර්) විකිණීමේ/ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
82. අටපිරිකර, පූජා භාණ්ඩ ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
83. සංගීත භාණ්ඩ කුලියට දීම හා නිපදවීම හෝ විකිණීම ස්ථානයක් පවත්වාගෙන යාම.
84. මදුරු දැල් මහන ස්ථානයක් හෝ විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
85. පුවත්පත් දැන්වීම් පළකිරීමේ ඒජන්සියක් හෝ පුවත්පත් විකිණීම සඳහා ඒජන්සියක් පවත්වාගෙන යාම
86. බෝට්ටු ඔරු (තොටුපොළක්) සේවාවන් පවත්වාගෙන යාම
87. ජුකී මැෂින් පුහුණු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
88. සෙලියුලර් දුරකථන හා දුරකථන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
89. පෞද්ගලික පාසලක් පවත්වාගෙන යාම
90. පරණ යකඩ බඩු, ප්ලාස්ටික් භාණ්ඩ, හිස් බෝතල්, පත්තර, ගෝනි ගබඩා කර තැබීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
91. පිඟන් භාණ්ඩ (පෝසිලේන්, සිල්වර් භාණ්ඩ ඇතුළු) ගබඩාකර තැබීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
92. මෝටර් රථ අමතර කොටස් විකිණීම
93. සුරතල් මසුන් ඇති කිරීම, විකිණීම හා මාලු ටැංකි සෑදීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
94. රේස් මුදල් ඔට්ටු එකතු කිරීමේ ස්ථානයක් (බුකී හා රේස් බයි ) පවත්වාගෙන යාම
95. ක්‍රීඩා භාණ්ඩ නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
96. ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් (කුටියක්) පවත්වාගෙන යාම
97. දැන්වීම් පුවරු ඇඳීම, ප්ලාස්ටික් අංක තහඩු සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම/ ස්ටිකර් කැපීම/ අකුරු ඇලවීම
98. ලී බඩු හෝ වෙනත් ඕනෑම ජංගම අලෙවිපළක් (salecenter) පවත්වාගෙන යාම (දිනකට)
99. ස්ථාවර හා ජංගම දුරකථන සම්බන්ධතා නිකුත් කිරීමේ තාවකාලික වෙළෙඳ කුටියක් පවත්වාගෙන යාම ( දින 01 සිට 07 දක්වා)
100. බැංකු වලින් උකස් කර බේරා නොගත් භාණ්ඩ වෙන්දේසි කිරීමේදී එක් දිනකට අය කිරීම.
101. පශු වෛද්‍ය ගිලන්හලක් හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
102. ඇලුමිනියම් භාණ්ඩ විකිණීම ගබඩා කිරීම
103. සත්ව ආහාර ගබඩා කර තැබීම , විකිණීම
104. පාවහන් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
105. මල් වෙළෙඳසැලක් පවත්වාගෙන යාම කෘතිම / ස්වභාවික
106. සිල්ලර කඩයක් පවත්වාගෙන යාම
107. තේ ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
108. රබර්/පොලිමර් සීල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109. මැටි භාණ්ඩ හෝ මල් පෝච්චි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
110. වීදුරු කපන ස්ථානයක් හෝ අලෙවිසැළක් පවත්වාගෙන යාම
111. ගඩොල් හෝ උළු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
112. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
113. පාවිච්චි කරන ලද ඇඳුම් විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
114. තේ දළු මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
115. ඒජන්සි තැපැල්හලක් පවත්වාගෙන යාම

116. ඇස්බැස්ටෝස් ගබඩා කර තැබීම හෝ විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම
117. හිරු එළියෙන් ක්‍රියාකරන (සෝලා පවර්) උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
118. ඇඟලුම් සඳහා ලේබල් නිෂ්පාදනය කිරීම
119. ආහාර ද්‍රව්‍ය තොග, සිල්ලරට විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
120. තොග වශයෙන් විකිණීම සඳහා පිටි , ලුණු හොණ්ඩර 15 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
121. ආරෝග්‍ය ශාලාවේ සිටින ලෙඩුන් සඳහා උපස්ථායක සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
122. කැලි රෙදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
123. සිමෙන්ති ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
124. ටේලර් සාප්පුවක් පවත්වාගෙන යාම
125. සිසිල් බීම එජන්සියක් පවත්වාගෙන යාම
126. සිසිල් බීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
127. අන්තර්ජාල සේවා සපයන ආයතනයක් පවත්වාගෙන යාම
128. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
129. කෘෂි රසායන ද්‍රව්‍ය/ පොහොර විකිණීම
130. ත්‍රී රෝද රථ/ මෝටර් සයිකල් අළුත්වැඩියාව
131. මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් (ගරාජයක්) සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
132. කුළු බඩු/ ධාන්‍ය තොග විකිණීමේ/ ආහාර පානතට ගැනෙන ඕනෑම ද්‍රව්‍යයක් නිපදවීම, ගබඩා කිරීම , ඇහිරීම, බෙදා හැරීම හා සිල්ලරට විකිණීම
133. කූල් ස්පොට් එකක් හෝ කිරිහලක් හෝ ස්නැක් බාර් පවත්වාගෙන යාම
134. පානීය ජලය බෝතල් කර ගබඩා කිරීම හා විකිණීම
135. එළවළු හා පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
136. පුද්ගලික රථ ගාලක් පවත්වාගෙන යාම
137. පපඩම් හෝ නූඩ්ල්ස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
138. කරවල, ජාඩි වේලීම හෝ ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
139. බුලත්, පුවක්, කොහු, ඉදල්, කෙසෙල් කැන්, පලා වර්ග, මැටි භාණ්ඩ (සාමාන්‍ය වෙළදාම)
140. බිත්තර සිල්ලරට හෝ තොග විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම
141. කුරුඳු තැලීම, කුරුඳු තෙල් මඩුවක් පැවැත්වීම හෝ කුරුඳු දර විකුණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

**දෙවන කොටස**

| | පළමු තීරුව<br>වර්ෂය සඳහා ව්‍යාපාරයේ ආදායම | දෙවන තීරුව<br>නියමිත බදු මුදල<br>රු.ශත |
|---|---|---|
| 1. | රුඃ 6000/- නොඉක්මවන අවස්ථාව | නැත |
| 2. | රුඃ 6000/- ඉක්මවන එහෙත් රුඃ 12000/- නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| 3. | රුඃ 12000/- ඉක්මවන එහෙත් රුඃ 18750/- නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| 4. | රුඃ 18750/- ඉක්මවන එහෙත් රුඃ 75000/- නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| 5. | රුඃ 75000/-ඉක්මවන එහෙත් රුඃ 150000/- නොඉක්මවන අවස්ථාවක | 1200.00 |
| 6. | රුඃ 150000/- ඉක්මවන අවස්ථාවක | 3000.00 |

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 148 (1) වැනි වගන්තිය යටතේ පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අනු ප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් 2020 වර්ෂය සඳහා නියම කිරීමටත් යෝජනා කරමි.

**උප ලේඛනය**

| | රුඃශත |
|---|---|
| 1. බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන වාහනයක් සඳහා | 25.00 |
| 2. පාපැදිය වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18.00 |
| 3. පාපැදිය වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4.00 |
| 4. සෑම කරත්තයක් සඳහා | 20.00 |
| 5. සෑම අත්කරත්තයක් සඳහා | 10.00 |
| 6. සෑම ජින්රික්ෂෝවක් සඳහා | 7.50 |
| 7. සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15.00 |
| සෑම ඇතෙකු සඳහා | 50.00 |

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** (176 වැනි අධිකාරිය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥා පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2020 වර්ෂයට පහත සඳහන් පරිදි අය කිරීමට යෝජනා කරමි.

**උප ලේඛනය**

1. චිත්‍රපට දර්ශන, සර්කස් සංදර්ශන, මැජික් සංදර්ශන, නාට්‍ය සංදර්ශන හෝ වෙනත් යම් සංදර්ශනයක් සඳහා

| | රුඃ ශත |
|---|---|
| එක් දිනකට බලපත්‍ර ගාස්තුව | 1000.00 |
| වැඩි වන සෑම දිනකටම | 200.00 |

| | |
|---|---|
| 2. සංගීත සංදර්ශන සඳහා එක් දිනකට | 2000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ IV (ආ) කොටසේ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක/දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උප ලේඛනයේ සඳහන් ආකාරයේ බලපත්‍ර ගාස්තුවක් 2020 වර්ෂය සඳහා පනවා 2020.01.01 දින සිට අය කිරීමට යෝජනා කරමි.

### උප ලේඛනය

| | | රු: ශත |
|---|---|---|
| 1. | බිත්තියක හෝ ස්ථිර පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩි 01 කට | 100.00 |
| 2. | බැනර් හෝ කටවුට් ප්‍රදර්ශනට කිරීම වෙනුවෙන් වර්ග අඩියකට | 50.00 |

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**08.** මෙහි පහත උප ලේඛනයේ දැක්වෙන ගාස්තු 2020 වසර සඳහා පනවා 2020.01.01 සිට අය කිරීමට යෝජනා කරමි.

### උප ලේඛනය

| | | රු.ශත |
|---|---|---|
| 01. | අනතුරුදායක ගස් පිළිබඳ දැනුම් දීමේ අයදුම්පත්‍ර ගාස්තු<br>වැඩිවන සෑම එක් ගසක් සඳහා රු. 100.00 බැගින් අය කෙරේ. | 500.00 |
| 02. | වරිපනම් සහතික ගාස්තු (වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික ගාස්තු) | |
| | වරිපනම් සහිත | 500.00 |
| | වරිපනම් රහිත | 750.00 |
| 03. | වීථි රේඛා සහතික නැවත නිකුත් කිරීම | 200.00 |
| 04. | ඒ.ටී. පෝරම (ඔප්පු සාරාංශ පෝරම) ගාස්තු | 500.00 |
| 05. | සංශෝධිත නම සහ අංකය වරිපනම් ලේඛනයේ ලියාපදිංචි කිරීමේ ගාස්තු (එක් නමක් සඳහා) | 200.00 |
| 06. | වරිපනම් ලේඛනයේ උධෘත පිටපත් නිකුත් කිරීම (එක් වර්ෂයකට) | 100.00 |
| 07. | කේ. පෝරම නැවත නිකුත් කිරීම | 100.00 |
| 08. | සහතික පිටපත් ගාස්තු (එක් වර්ෂයකට සෙවීමේ ගාස්තුව) | 100.00 |
| 09. | ජල සහතික ගාස්තු/ විදුලි / වෙනත් | 300.00 |
| 10. | රැස්වීම් ශාලාව බදු දීම (එක් දිනකට) | 2000.00 |
| 11. | ජල නල එළීම සඳහා පාරවල් පළුඳු කිරීමේ ගාස්තු | |
| | I. එක් පැත්තක 1(m) × 1(m) වළක් තැනීමේදී පමණක් | 1250.00 |
| | II. අවම 3(m) ක නලය එළිමේදී 0.3 (m)×3(m) | |
| | මාර්ග පළුඳු කිරීම සඳහා (තාර සඳහා) | 1300.00 |
| | මාර්ග පළුඳු කිරීම (කොන්ක්‍රීට් සඳහා) | 2000.00 |
| | III. වැඩිවන සෑම දික් 1(m) ක් අය කිරීම (තාර) | 435.00 |
| | අය කිරීම (කොන්ක්‍රීට්) | 600.00 |
| | අය කිරීම (පස්) | 600.00 |
| 12. | ප්‍රසිද්ධ වෙන්දේසියක් පැවැත්වීමේදී අවසර ලබා දීමේ ගාස්තු දිනකට | 250.00 |
| 13. | පුස්තකාල සාමාජික අයදුම්පත්‍ර ගාස්තු | 50.00 |
| 14. | පුස්තකාල පොත් ප්‍රමාද ගාස්තු දිනකට | 1.00 |
| 15. | පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීම | 25.00 |
| 16. | (i) සභාව සතු භූමි වල පවත්නා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා | |
| | අයකිරීම (දිනකට) | 2000.00 |
| | (ii) ආපසු ගෙවන ආරක්ෂක ඇප තැන්පත් | 1000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ඉඩම් අනුබෙදුම් /ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම**

**09.** නාගරික සංවර්ධන ප්‍රජා භූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් 2009.04.16 වන දින කොළඹදී රජයේ නිවේදන එල්.ඩී.බී.16/78 යටතේ ප්‍රකාශයට පත් කරන ලද අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පස්වන (V වන) උපලේඛනයේ සඳහන් ගාස්තු 2020 වර්ෂයට බලපාන පරිදි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ පනවා 2020.01.01 දින සිට අය කිරීමට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 01. | ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු | |
| | නේවාසික | 600.00 |
| | වානිජ | 1000.00 |
| 02. | ඉඩම් අනුබෙදුම් අයදුම්පත් ගාස්තු | |
| | නේවාසික | 500.00 |
| | වානිජ | 1000.00 |

අනුමත ගොඩනැගිලි සැලසුම් කාලය දීර්ඝ කිරීම (උපරිම කාලය දීර්ඝ කිරීම අවුරුදු 05 කි)

| | |
|---|---|
| පළමු වැනි අවුරුද්ද සඳහා | 200.00 |
| දෙවැනි අවුරුද්ද සඳහා | 250.00 |
| තෙවැනි අවුරුද්ද සඳහා | 300.00 |
| සිවුවැනි අවුරුද්ද සඳහා | 350.00 |
| පස්වැනි අවුරුද්ද සඳහා | 400.00 |

| | | |
|---|---|---|
| 03. | ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධ සහතික නිකුත් කිරීමේ ගාස්තු | 500.00 |
| 04. | 1990 ට පෙර ඉදිකරන ලද ගොඩනැගිලි වල සැලසුම්පත් අනුමත කිරීම අනවශ්‍ය බව සනාථ කරන ලිපිය සඳහා ගාස්තුව | 1000.00 |

**වෙනත්**

| | | |
|---|---|---|
| 01. | වතුර බවුසරය කුලියට දීම (ජලය රහිතව) | 2750.00 |
| | දිනක් රඳවා ගැනීම වෙනුවෙන් | 500.00 |

(දිස්ත්‍රික් මිළ කමිටු තීරණය පරිදි වෙනස් විය හැක.)

| | | |
|---|---|---|
| සතියේ වැඩ කරන දවස් 05 තුළ ජලයට අය කරන ගාස්තුව | 500.00 | 15% VAT මුදලක් ද අය කෙරේ. |
| සෙනසුරාදා ඉරිදා ඇතුළු අනෙකුත් නිවාඩු දිනවල ජලයට අය කරන ගාස්තුව | 650.00 | |

**<u>ගාස්තුවෙන් 25% ක් අඩුකිරීම</u>**

I. ජලය බවුසරය ලබාගැනීම ලියාපදිංචි වී ප්‍රතික්ෂේප කළහොත් 25% අඩුකිරීම රු. 562.50/-

II. ජල බවුසරය යාමට ඒමට 20 km කට වඩා වැඩිවුවහොත් 1km ක් සඳහා රු. 55.00 බැගින් අයකරනු ලැබේ.

02. ප්ලේට් කම්පන යන්ත්‍රය (රෝලරය) කුලියට දීම
පැය 8 ක් රු. 4025.00

වැඩි වන සෑම කි.මී. 1 සඳහා අයකිරීම රු. 55.00

(දිස්ත්‍රික් මිළ කමිටු තීරණය පරිදි වෙනස් විය හැක.)

03. ඩබල්ඩ්‍රම් කම්පන තලනය කුලියට දීම (පැය 8 ක කාලයකට) රු. 4200.00

04. සමර්හට් 10'×10' එකක් දිනකට කුලීයට දීම රු. 1500.00

05. ක්‍රීඩා භූමි බදු දීමේ ගාස්තු අය කිරිම
මුදල් අයකරන සංදර්ශන සඳහා

I. දිනකට රු. 2000.00
II. ආපසු ගෙවන ඇප තැන්පත් රු. 1000.00

මුදල් අයකරන සංදර්ශන හැර අනෙකුත් සෑම කටයුත්තක් සඳහා

I. දිනකට රු. 1000.00
II. ආපසු ගෙවන ඇප තැන්පත් රු. 1000.00

06. ඝාතන ගාස්තු අය කිරීම

තාවකාලික බලපත්‍රයක් මත කරනු ලබන ඝාතනයක් සඳහා අය කරනු ලබන ගාස්තු.

I. ගවයෙකු මැරීම සඳහා රු. 1000.00
II. එළුවකු මැරීම සඳහා රු. 1000.00
III. ඌරකු මැරීම සඳහා රු. 1000.00

**<u>පරිසර අංශය</u>**

01. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත් ගාස්තු රු. 200.00

02. පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ අයදුම්පත් ගාස්තු රු. 200.00

03. පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු රු. 4000.00

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමඟ කියවිය යුතු 267 වන අධිකාරය වූ 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සීමාව ඇතුළත පවත්වනු ලබන එකී ආඥා පනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළු වීම පිණිස කරනු ලබන ගෙවීමකින් (විනෝද බදු හැර) සීයට පහළොවක් (15%) බද්දක් පනවා අය කිරිමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 127 වැනි වගන්තියේ හා (231 වැනි අධිකාරය) සුසාන භූමි ආඥා පනතේ 03 වැනි වගන්තියේ හා 17 සිට 22 වගන්තිය අනුව සඳහන් කාර්යයන් සඳහා එකී ආඥා පනතේ ප්‍රාදේශීය සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාර, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මතු දැක්වෙන උප ලේඛනයේ පළමු කොටසේ සඳහන් සුසාන භූමි වල

භූමදාන කිරීමක්, ආදාහනය කිරීම හා තැන්පත් කිරීමක් සඳහාද, ස්මාරකයක් ඉදිකිරීමක් සඳහාද උපලේඛනයේ දෙවන කොටසේ සඳහන් ගාස්තුවක් 2020 ජනවාරි මස 01 වැනි දින සිට පනවා අය කිරීමට යෝජනා කරමි.

**උප ලේඛනය**

**පළමු කොටස**

1. හපුගල පොදු සුසාන භූමිය
2. පෝද්දල පොදු සුසාන භූමිය
3. ලබුදූව පොදු සුසාන භූමිය
4. වැලිපිටිමෝදර පොදු සුසාන භූමිය
5. බෝපෙ පොදු සුසාන භූමිය

**දෙවන කොටස**

| | | රුඃ ශත |
|---|---|---|
| 1. | වයස් සීමාවකින් තොරව එක් භූමදාන කිරීමක් සඳහා අවසර පත්‍ර ගාස්තු | 500.00 |
| 2. | වයස් සීමාවකින් තොරව එක් ආදාහන කිරීමක් සඳහා ගාස්තු | 2000.00 |
| 3. | වයස් සීමාවකින් තොරව එක් තැන්පත් කිරීමක් සඳහා (උපරිම බිම් ප්‍රමාණය වර්ග අඩි 18) | 5000.00 |
| 4. | ස්මාරකයක් ඉදිකිරීම සඳහා ගාස්තුව වර්ග අඩියකට (උපරිම වර්ග අඩි 3 1/2 ×2) | 2000.00 |

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 12.** උළුවිටිකේ කොට්ඨාශය සඳහා පුරප්පාඩුව ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරයට අයදුම්පත් කැඳවීමේදී සංවෘතව කැඳවා ඇති බවට කොට්ඨාශයේ පදිංචිකරුවන් ප්‍රකාශ කරයි. මේ පිළිබඳ අවධානය යොමුකර නැවත අයදුම්පත් කැඳවා විනිවිදභාවයෙන් යුතුව, අපක්ෂපාතීව සිදුකරන මෙන් දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර්තුමාට දන්වා යවන මෙන් යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගැසට් කරලා ඉවරයි. ගැසට් කරලා ඉවර වෙලා අයදුම්පත්‍ර කැඳවීම ප්‍රදර්ශනය කරන්න ඕන තැපැල් කාර්යාලවල, ග්‍රාම නිලධාරි කාර්යාලවල. හැබැයි ඒ දේ සිදු වෙලා නෑ. දැනට අයදුම්පත්‍ර දෙකක් කැඳවලා තියෙනවා. පක්ෂ කාර්යාලයකින් තමයි ඒ නම් දෙක යවලා තියෙන්නේ. ඒ නම් දෙකට විරෝධතා කැඳවලා තියෙනවා මේ දවස්වල. අපි කියන්නේ නැවත අයදුම්පත්‍ර කැඳවන්න කියලා. පක්ෂ කාර්යාලයකින් ඒ නම් දෙක යවලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තව කල් තියෙනවානේ සුදුසු කෙනාට දේවි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගම්වල තව සුදුසු මිනිස්සු ඉන්නවානේ. දැන් දාන්න බෑ. ඒකයි නැවත අයදුම්පත්‍ර කැඳවන්න කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වෙලාවට දාන්න එපැයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- වෙලාවට දාන්න ඒ මිනිස්සු දැනගන්න එපැයි. ඉල්ලීම කරන්න කියලා මම යෝජනා කරන්නේ. ලබා දෙන්න බැනේ මැතිවරණ කාලෙනේ කොහොමත්. අපි ඒක හෙට අනිද්දාට ලබා දෙන්නම් අවශ්‍ය විදියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මන්ත්‍රීතුමා ඒක කොහොමත් පවතින ආණ්ඩුවෙන් දානවා. දැන් කොහොමත් මේ කාලේ දෙන්න බෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- නැවත අයදුම්පත්‍ර කැඳවන්න කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 13.** එම්. පී සිරිසේන මහතාට අයත් ජස්ටින් කන්දේ පිහිටි සියඹලා ගස අනතුරුදායක අයුරින් පිහිටා ඇත. ඉවත් කිරීමට දැන්වුවද ඒ සඳහා වත්කමක් නොමැති බව පවසන බැවින් සුදුසු පියවරක් ගන්නා මෙන් යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 14.** ගොඩකන්ද, ගලබඩවත්තේ පිහිටි පහත් භූමිය ඇති ජලය බැසයන ඇළ මාර්ගය පවත්නා ආකාරයෙන් පවත්වාගෙන යාමටත් කුඹුරක් වූ ඉඩමට අනුමැතිය ලබා දී ඇත්නම් එය අත්හිටුවා පස් පිරවීම තහනම් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- මෙම ඉඩම ගොඩකන්දේ, හීන්ඇළ, ජස්ටින් කන්දේ සිට ආරම්භ වෙන්නේ. 2015 වර්ෂයේදී මේකට අනුමැතිය ලබා දීලා තියෙනවා. මේකත් කපලා තියෙනවා.

මේක කුඹුරු ඉඩමක්. ඇළ මාර්ගය වෙනස් කරනවා. හැබැයි මේක මේ විදියට ක්‍රියාත්මක වුණොත් නීතියක් නැති විදියට මම ඒ කොට්ඨාශයේ මිනිස්සුන්ට කියනවා ඕන දෙයක් කර ගන්න කියලා. ගොවිජන සේවා එකේ ප්‍රධාන ඇළ මාර්ගයක් මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අවහිරතාවය ඉවත් කරන්න සභා තීන්දුවක් ගමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- පවතින ආකාරයෙන් ඇළ පවත්වා ගෙන යන්න කියලා කියන්නේ මම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 15.** පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සිදුකර 2019-10-21 දිනට මාස 06ක් ගතවී ඇත. පරීක්ෂණ වාර්තාවද අතිගරු ජනාධිපතිතුමාට ලැබී ඇත. සැබෑ වරදකරුවන්ට කඩිනමින් නීතිය ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා** ඃ- ඔබතුමාලා හැමදාම මෙහේ යෝජනා ස්ථිර කරා. මේ වෙනුවෙන් පත්කරපු කමිටුවේ රවුෆ් හකීම්ලා හිටියා. ඉතිං ඒ ජනතාවට ශෝකය ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් අපි කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මාස 06 ක් තිස්සේ මේකට ක්‍රියාමාර්ගයක් නොගැනීමයි මේ ජනතාවට අත් වෙච්ච ඉරණම පිළිබඳවයි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සියලු මන්ත්‍රීතුමන්ලාගේ, මන්ත්‍රීතුමියන්ලාගේ බලවත් ශෝකයත්, රජයට අප්‍රසාදයත් පල කරනවා.

ඒ වගේම සියලු අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනවා අදාළ වූදිතයන් සමඟ දේශපාලන කටයුතු කරන්න එපා කියලා. මොකද පැහැදිලිවම දන්නවානේ දූරකථන සංවාද තියෙනවා කියලා.

ඡායාරූපත් තියෙනවා. අදාළ ත්‍රස්තවාදීන් සමග වැඩ කරපු හැටි. ඒකට සම්බන්ධ දේශපාලන නායකයින් ජනාධිපතිවරණයට එකතු කර නොගත යුතුයි කියන යෝජනාව කරනවා.

ඒ එක්කම අපි පත්වෙන ජනාධිපතිවරයාට බලපෑම් කරනවා අනිවාර්යයෙන්ම මහබැංකු සිද්ධියේ චූදිතයන්ට දඬුවම් දෙන්න කියලා. ඒ වගේම පාස්කු ප්‍රහාරයන්ට සම්බන්ධ චූදිතයන්ට දඬුවම් දෙන්න ඕන. ඒ වගේම පාතාලය සම්පූර්ණයෙන්ම මර්දනය වෙන්න ඕන. මත්ද්‍රව්‍ය වලට අත්අඩංගුවට ගත් අයට නිසි දඬුවම් දෙන්න ඕන. අපි බලාපොරොත්තු වෙනවා පත්වෙන ජනාධිපති මේ සියල්ල ඉෂ්ඨ කරයි කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවෙත් ඉතා හොඳ යෝජනාවක් අපේ ලියනගේ මන්ත්‍රීතුමා ගෙනාවේ. ඒ යෝජනාවට ඇත්ත වශයෙන්ම අපේ සහයෝගය ලබා දෙනවා. මම දන්න තරමින් පාස්කු ඉරිදි ප්‍රහාරයට සම්බන්ධ සහරාන්ගේ පුහුණු කඳවුරුවල ඉඳපු ඔක්කොම අත්අඩංගුවට අරගෙන තියෙනවා. ගැව්ච්ච, සම්බන්ධ වෙච්ච සියලුම අය අත්අඩංගුවට අරගෙන තියෙනවා. නමුත් දේශපාලඥයෝ වශයෙන් රවුෆ් හකීම් ඇමතිතුමා ගැන කියනවා. රිෂාඩ් බදුර්දීන් ඇමතිතුමා ගැන කියනවා. නමුත් රිෂාඩ් බදුර්දීන් ඇමතිතුමා ගැන පොලීසිය, රහස් පොලිසිය පරීක්ෂණ කරා. ඒ වගේම ජනාධිපතිතුමත් කරා.

අපි ගාවත් තියෙනවා ඡායාරූප මහින්ද රාජපක්ෂ මැතිතුමා සහරාන් එක්ක ඉන්න. ගෝඨාභය රාජපක්ෂ පඩි ගෙවීම සම්බන්ධව සාකච්ඡාවක් තිබ්බා. ඒ ඡායාරූපත් අපි ගාව තියෙනවා.

සහරාන් එක්ක පුහුණුව ලබපු සියලු දෙනා අත්අඩංගුවට අරගෙන තියෙනවා. ගැවෙච්ච සියල්ලෝම අත්අඩංගුවට අරගෙන තියෙනවා. නමුත් දේශපාලඥයෝ වශයෙන් රැස්වීමක් තිබ්බානම් ඒ රැස්වීමට යම්කිසි පුද්ගලයෙක් ආවහම ඒක සංවිධානාත්මකව වෙන්නත් පුළුවන්. ආවහම ඒකේ ෆෝටෝ ගෙනල්ලා පෙන්නුවහම එයා වැරදිකරුවෙක් වෙන්නේ නෑ. එයා කැඳවලා නෙමෙයි. රවුෆ් හකීම් සහරාන්ගේ පුහුණු කඳවුරට ගියේ නෑ. එතුමාගේ රැස්වීමකට එයා ඇවිල්ලා තියෙනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තමයි පඩි ගෙවලා පුහුණු කරේ. මේක විශේෂයෙන් සටහන් කර ගන්න. බෝම්බ පුපුරලා පළවෙනි සභාවාරයේදීම මම මේ සභාවේදී කිවුවා මේකට හිස්බුල්ලා සම්බන්ධයි කියලා. සභා වාර්තා අරන් බලන්න. රිෂාඩ් බදුර්දීන් සම්බන්ධ නෑ. රවුෆ් හකීම් සම්බන්ධ නෑ. සම්බන්ධ හිස්බුල්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කරන කාරණා නෙමෙයි මෙතන තියෙන්නේ. අපිට තියෙන ප්‍රශ්නය ඒ පරීක්ෂණය කරපු කණ්ඩායමේ ඉන්නවා රවුෆ් හකීම් ඇමතිතුමා. ඒ පත්කරපු කණ්ඩායමේ ප්‍රධානියා. හොරාගේ අම්මා හොරාගෙන් පේන අහනවා. ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂයේ වේදිකාවේ ඉන්නවා වෛද්‍ය සාෆි. මොහොමඩ් සාෆි බොහොම පැහැදිලිව සජිත් ප්‍රේමදාස මහත්තයාගේ පිටිපස්සේ ඉන්නවා. ඔය වගේ ගත්තම බදුර්දීන් ඉන්නේ යූ.ඇන්.පී. ආණ්ඩුවේ. බොහොම පැහැදිලිව හිස්බුල්ලා වෙනම ජනාධිපති අපේක්ෂකයෙක්. අපි කියන්නේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයා බොහොම පැහැදිලිව කියලා තියෙනවා කිසිම ත්‍රස්තවාදියෙක්ගේ, අන්තවාදියෙක්ගේ සහයෝගය ගන්නේ නෑ කියලා මැතිවරණයට. මැතිවරණයට උදවු කරන්න එන්න ඕන. ගෝඨාභය රාජපක්ෂ මහතා ඉන්න ස්ථාවරය තමයි කිසිම ත්‍රස්තවාදියෙක්ගේ, අන්තවාදියෙක්ගේ උදවු ගන්නේ නෑ කියලා. ඔබතුමාලා කියන්න ද්‍රවිඩ සංවිධානයේ ඉල්ලීම් වලට එකඟද නැද්ද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔබතුමා කියන්නේ සම්බන්ධන්ගේ යෝජනා ටික සාධාරණද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද ද්‍රවිඩ සන්ධානයේ යෝජනාවලිය ඉදිරිපත් කරලා තියෙනවා ප්‍රධාන අපේක්ෂකයෝ දෙන්නටම. ඒ යෝජනා වලට අපි එකඟ නෑ. ගෝඨාභය මහත්තයා එකඟ නෑ. මම අහන්නේ ඒ යෝජනාවලියට එකඟද නැද්ද?.

මම වගකීමෙන් කියන්නේ 2009 මැයි 18 වෙනිදා ත්‍රස්තවාදය අවසන් කරා. නමුත් අපි කවදාවත් හිතුවේ නෑ මේ රටේ නැවත ත්‍රස්තවාදයක් ඇති වෙයි කියලා. නමුත් අද චක්‍රලේඛයක් පාසල් සියල්ලටම එවලා තියෙනවා. අද චක්‍රලේඛයක් නිකුත් කරලා තියෙනවා සියලුම පාසල් වලට. දෙමව්පියන් පාසල් මුර කරන්න ඕන අද සිට. ඔන්න මේ රටේ තත්ත්වය. ඔන්න මේ ආණ්ඩුවේ තත්ත්වය. මම වගකීමෙන් කියන්නේ අද සිට සියලු පාසල්වල දෙමවුපියන් කණ්ඩායම් හැදිලා පාසල් මුර කරන්න ඕන. අද ආවේ චක්‍රලේඛය. මෙන්න මේ ආණ්ඩුවේ තත්ත්වය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ හොඳයි සංවාදය මෙහෙම යන එක. වැරැද්දක් නෑ. එකක් තියෙනවා අමතක කරන්න එපා. මොකද හේතුව, අමතක කරන්න එපා කියන්නේ පාස්කු ප්‍රහාරය එකක්. ද්‍රවිඩ ජනතාවට, මුස්ලිම් ජනතාවට මිදි පුංචිකම් මේ රටේ සියලු දෙනාගෙන් ඇතිවෙලා තියෙනවා. ඒක අමතක කරන්න එපා. ඒවා නිවැරදි වෙන්න ඕන. ගිවිසුම් තියෙනවද, නැද්ද, කියන එක නෙමෙයි ඒ සාධාරණ ඉල්ලීම් වලට ඒ වෙච්ච අඩුපාඩුකම් වලට ඒ මිනිස්සුන්ට සාධාරණයක් තියෙන්න ඕන. අපි මහ ජාතිය විදියට මොන පක්ෂය කොහොම තිබුණත් ගොඨාභය රාජපක්ෂ මැතිතුමා ආවත්, අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා ආවත් මේ ප්‍රශ්නය තියෙනවා. ඒක නිරාකරණය කළ යුතුයි. ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයේදි ඉතාම පැහැදිලිව තියෙන්නේ ඇත්තටම ලෝකෙ කොහේවත් මින් පස්සේ දේවල් සිද්ධ වෙන්නේ නෑ කියලා නෑ. එංගලන්තයේ වෙනවා. ජපානයේ වෙනවා. මේ හැම තැනකම වෙනවා. හැබැයි එකක් තියෙනවා ඒකට අවශ්‍ය පියවර ගත යුතුයි. මම දකින්නේ ඇත්තටම ඒකෙදි නම් ජනාධිපතිතුමා මේ සියල්ල ගොනුකරගෙන ඉන්නවට වඩා හොඳයි ඒක කරන්න පුළුවන් කෙනෙකුට, එතුමාම දන්නවානේ ජෙනරල් සරත් ෆොන්සේකා මැතිතුමා වගේ ඉන්නවානම් හොඳයි. නමුත් එකක් තියෙනවා නරකක් වෙනවාට ඉස්සෙල්ලා ආරක්ෂා කර ගන්න එක තමයි හොඳ. මොනවා වුණත් මේ කාලකන්නි සිදුවීම් තව නොවේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. අද මුලින්ම මම උප සභාපතිවරයා විදියට පසුගිය දින පැවැත්වූ ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්දයෙන් මුළු රටම සතුටු වෙන මොහොතක අපිට සහය දක්වන්න පැමිණි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට එකතු වුණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු දෙපළ අද පොහොට්ටු පක්ෂයට සම්බන්ධ වෙනවා. අපි ඉතාමත් ගෞරවයෙන් පක්ෂයක් හැටියට ඔවුන්ව පිළිගන්නවා.

අනිත් එක තමයි පසුගිය වසර හතර හමාරක කාලය තුළ මේ රජය කළ කාර්යයන් ටික අපි කල්පනා කරලා බැලුවොත් පළමු කාර්යය හැටියට මේ රටේ ආරක්ෂාව සම්පූර්ණයෙන්ම විනාශ කරලා බුද්ධි අංශ විසුරුවා හැරලා මේ රට අනාරක්ෂිතභාවයකට පත් කළා. ඒක තමයි පළමු අදියරේ කාර්යයක් හැටියට මේ රජය කළේ.

ඊළඟ කාර්යය හැටියට විල්පත්තු වන සංහාරය කරලා ජනතාව පදිංචි කරලා වනය විනාශ කරන්න මේ රජය කටයුතු කරා.

ඊළඟ කාර්යය හැටියට අපි දකිනවා මංගල සමරවීර ඇමතිතුමා සමලිංගික නීතිය පාර්ලිමේන්තුවට ගෙනල්ලා මේ වගේ බෞද්ධ රටකට නොහොබිනා ක්‍රියා රාශියක් කරන්න හැදුවා. ඒක ජනතාවගේ විරෝධය මත හකුළා ගත්තා.

ඊළඟට පාසල් දරුවන්ගේ නිල ඇඳුම වවුචරයකට සීමා කරා. මගේ ළමයි දෙන්නෙක් ඉන්නවා ඉස්කෝලේ යන. ඒ වවුචරයෙන් ඇඳුම් භාගයයි මහ ගන්න වෙන්නේ. මේ අවුරුදු හතර හමාරේ කෙරුවාව තමයි මම මේ කියන්නේ.

ඒ වගේම තමයි කාන්තාවන්ට සුරාසැල් වලට ගිහිල්ලා අරක්කු ගන්න අවසරය ලබා දුන්නා. සුරාසැල් රාත්‍රී 10 වෙනකම් විවෘත කරා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එක බලපත්‍රයක් දීලා නෑ අලුතෙන්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- අධ්‍යාපන ඇමති අකිල විරාජ් ඇමතිතුමා මහලොකුවට කියනවා බෝඩ් ප්‍රදර්ශනය කරන්නේ නෑ කියලා. අඩි 40 හදපු මාර්ගයට රුපියල් 10,000/- වියදම් කරලා බෝඩ් දානවා. ඒක අපි අපේ ඇස් දෙකට දැකලා තියෙනවා. අකිල විරාජ් ඇමතිතුමා කියනවා එයා ප්‍රචාරක කටයුතු කරන්නේ නෑ කියලා. මේ සැරේ බෙදපු පාසල් පෙළ පොතටත් කෝටි ප්‍රකෝටි ගණන් වියදම් කරලා එතුමාගේ වර්ණ ඡායාරූපයක් දාලා තියෙනවා. මේ වගේ දේවල් මේ අවුරුදු හතර හමාර තුළ කෙරුවා. මේ රටේ ජනතාවගේ මුදල් මංකොල්ලා කෑවා. මේ වගේ වර්ණ ඡායාරූපයක් කවදාවත් දාලා නෑ. මේ පක්ෂය බංකොලොත් වෙලා තියෙන්නේ. ඉටිපන්දම් එළිය අපි දැල්වූයේ සහරාන්ගේ සිද්ධියටත් එක්කම එක්සත් ජාතික පක්ෂයේ මළගමට කියලා මතක තියා ගන්න. අපි ආණ්ඩුව ගන්නවා. අපි ආණ්ඩුව ගන්නවා අවුරුදු දහයකට. සුරක්ෂිත රටක්, සංවර්ධිත රටක්, නීතියට වැඩ කරන රටක් බවට මේ රට පත්කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, න්‍යාය පත්‍රයේ මෙතුමාගේ යෝජනාවලට අදාළව කතා කරන්නේ. මේ පාස්කු ඉරිදා ප්‍රහාරය සම්බන්ධයෙන් කරපු යෝජනාවට සංශෝධනයක් ඉදිරිපත් කරනවා. මේකට සම්බන්ධ සියලු දෙනාටම දඬුවම් කළ යුතුයි. ඉදිරියේදී බලයට පත්වන කවුරුහෝ ජනාධිපති. මේ මොහොතේ හෝ ක්‍රියාත්මක කළ යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වෙන්නේ නැනේ. සැලසුම් කරපු අය නැනේ. සැලසුම් කරපු අය ඇමති මණ්ඩලයේ. දැනගෙන පල්ලි නොගිහින් ගෙදර ඉඳපු අය ආණ්ඩුවේ මන්ත්‍රීවරු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කරලා ඒකට සම්බන්ධ වෙච්ච සියලු දෙනාටම නීතියෙන් දඬුවම් කළ යුතුයි. ඔබතුමා නිවැරදිව ඒ යෝජනාව ඉදිරිපත් කළා ඒ වෙලාවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පක්ෂ භේදයකින් තොරව මම කියන කතාවක් තියෙනවා. අපි පාලනය කරේ 1994 ඉඳන් 2015 වෙනකම්. ඒ අතර අවුරුදු 02 ක් පාලනය කරා එක්සත් ජාතික පක්ෂය. වැඩි අවුරුදු ගාණක් පාලනය කරේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පොදු ජන පෙරමුණු ආණ්ඩුව.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** පොදු ජන පෙරමුණක් තිබුණේ නැනේ සභාපතිතුමා. පොදු පෙරමුණ තිබුණේ. ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ නෙමෙයි. ඔබතුමාට නමත් මතක නැද්ද?. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පාලනය කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. මේ මුස්ලිම් නායකයෝ ගොඩනැගුණේ ඒ එක්ක. නැහැයි කියන්න බෑ. ඔය නන්නත්තාර වෙලා ඉඳපු බදුර්දීන් ඇමතිතුමන්ලා ඇවිල්ලා එකතු වුණේ මේ ආණ්ඩුවට. බොරු කියන්න ඕන නෑ. ඒක පිළිගන්නවා. නමුත් මේ අන්තවාදී වැඩ කරන්න දුන්නේ නෑ. ඒ අයව පාලනය කරා. නමුත් අද අන්තවාදී කටයුතු වෙද්දි ඒ අයව ආරක්ෂා කරන එකයි වැරැද්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මෙතන කතා කරේ ඒ යෝජනාව සම්බන්ධයෙන්. එතුමා ඒකට නිවැරදි අදහස් ඉදිරිපත් කරා. මේකට සම්බන්ධව නිසි පරීක්ෂණයක් කරන්න. මේ රටේ ආරක්ෂාව නැති කරපු, මේ රටේ ආරක්ෂාවට තර්ජනයක් වෙච්ච මේ ක්‍රියාවලියට සම්බන්ධ වෙච්ච සියලු දෙනාම නිවැරදි පරීක්ෂණයකින් අත්අඩංගුවට අරගෙන ඒ අයට නිසි දඬුවම් නීත්‍යානුකූලව ලබා දිය යුතුයි. ඒ සම්බන්ධව කිසිම තර්කයක් නෑ. ඒ වගේම මේ රටේ ජනතාවගේ ජාතික ධනය සියල්ල විනාශ කරලා මේ රට ආර්ථික අගාධයට පත් කරපු සියලු දූෂිතයන්ට අපි යෝජනා කරනවා දඬුවම් කරලා මේ රටට යහපත් ආර්ථිකයක් ගොඩනගන්න පුළුවන් අවස්ථාව ලබා දිය යුතුයි කියලා ඒ යෝජනාවට මම සංශෝධනයක් එකතු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 16.** කරාපිටිය කොට්ඨාශයේ වීදි පහන් නඩත්තුව සඳහා නව වීදි ලාම්පු කට්ටල 50ක් අළුතෙන් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා ඃ- 17.** ගිංතොට, පියදිගම, උක්වත්ත පාර (විල්බට් හඳුන්නෙත්ති මහතාගේ නිවස අසල පාර) සහ දෙපස පැති කාණු කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා ඃ- 18.** සෝමාරාම මාවතේ සිට කනත්ත වත්ත මාර්ගය ආරම්භවන ස්ථානයේ ඇති බෝක්කුව හා කාණු පද්ධතිය පිළිසකර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා ඃ-** සභාපතිතුමා ගිහිල්ලා බලපු එකක් මේක. මගේ ප්‍රතිපාදන වලින් මේක ඉක්මනින් ඉවර කරන්න කියලා යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී තිස්ස වේවැල්වල මැතිතුමා ඃ-** මගේ ශ්‍රී මුඛයෙන් තමයි මේ යෝජනා ඉදිරිපත් කරන්නේ. මම ඒකට සමාව ගන්නවා.

(සභාව ඝෝෂාකාරි විය)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 19.** පැගිරිවත්ත, කනත්ත පාරේ අධික වර්ෂාව නිසා ගෙවල් 06ක් පමණ අඩි 03ක පමණ ප්‍රමාණයක් යටවන බැවින් පැති බැම්මක් සාදා ඇත. එයට තව අඩි 1½ පමණ බැම්මක් බැඳීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 20.** පැගිරිවත්ත, කනත්ත පාරේ දෙපස තිබෙන කාණු පද්ධතිය ජේ.සී.බී යන්ත්‍රයක් හෝ එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා සුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 21.** කලේගාන කොට්ඨාශයේ විදී පහන් නඩත්තුව සඳහා නව විදී ලාම්පු කට්ටල 15ක් අළුතෙන් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 22.** වක්වැල්ල, හපුගල, නිලදෙණිය, බෝපගේවත්ත, කලුපහන පාරේ ටවුන් ලේන් යන මාර්ගය සහ ලෝටස් ලේන් යන මාර්ග තාර දමා සංවර්ධනය කිරීමටත් එම පාරේ පැති කාණු ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන සුද්ධ පවිත්‍ර කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 23.** සභාව සතු සුසාන භූමිවල භූමදාන කටයුතු සඳහා ඉඩකඩ නොමැති බැවින් අධිකරණ නියෝගයක් ගෙන සුසාන භූමිවල ඇති සියලුම සොහොන් හා ස්මාරක ඉවත් කිරීම සිදුකර ඊට පසු සොහොන් බැඳ තැන්පත් කිරීමේ කටයුතු හා ස්මාරක ඉදිකිරීම තහනම් කිරීමටත් භූමදාන කටයුතු සඳහා පමණක් අවසර ලබා දෙන ලෙසත් යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා, මේ ස්මාරක ඉවත් කිරීම පිළිබඳව ඉතිහාසයක් තියෙනවා. ගාල්ලේ ඕලන්ද එක හදන කොට වුණත් මැරිච්ච මිනිස්සුන්ගේ මිනී අරන් ගිහින් තැන්පත් කරන ක්‍රමවේදයකට හැදුවේ. නැත්නම් මේකට වෙනත් වැඩපිළිවෙලක් හදන්න ඕන. ස්මාරක අයින් කරලා කොහේද දාන්නේ. එහෙම කතාවක් තියෙනවා. ඒක සාකච්ඡා කරලා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අවශ්‍ය ස්ථාන වලින් ඒකට අවසර ගන්න ඕන.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ- 24.** ගාල්ල, මාම්පිටිය, ඉසුරු පෙදෙසේ පළමු පටුමඟ එස්. ඒ. බී. කොඩිතුවක්කු මාවත නමින් නම් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රී කාංචනා මැතිණියගේ යෝජනා**

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රී කාංචනා මැතිණිය ඃ- 25.** ලබුදූව වෙළඳ සංකීර්ණය සතු ඉඩමේ ත්‍රීරෝද රථ නැවතුම්පොළක් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ සකස් කර දෙන බවට පොරොන්දු වී ඇති බැවින් ඒ සඳහා සුදුසු භූමි ප්‍රමාණයක් ලබා දෙන මෙන් යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රී කාංචනා මැතිණිය ඃ-** මේක ගැන මට පැහැදිලි කිරීමක් කරන්න ඕන. ලබුදූවේ ත්‍රීරෝද රථගාල හදන්න මාර්ග සංවර්ධන අධිකාරියෙන් අපිට මුදල් පාස් වෙලා තියෙනවා. ඒ වුණාට එතන ඉඩ ප්‍රමාණය මදියි. ඒ නිසා සභාවට අයිති ඉඩමෙන් අඩි දෙකක ප්‍රමාණයක් ලබා දෙනවා නම් හොඳයි. සිරිධම්ම විද්‍යාලයේ ළමයි පාර මාරු වෙන්නේ එතනින්. උදේට විශාල වාහන තදබදයක් එතනදී ඇතිවෙනවා. අඩි දෙකක ප්‍රමාණයක් තමයි මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලන්නේ. ඒකට සභාව හරහා අවසර ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මෙතන පොඩි ගැටළුවක් තියෙනවා. සිරිධම්ම විද්‍යාලයට ඇතුල්වෙන පාරේ එතනම තියෙන ත්‍රීරෝද රථ නිසා සිරිධම්ම විද්‍යාලයට යන ළමයින්ටත්, දෙමව්පියන්ටත්, වාහන වලටත් පොඩි අවහිරතාවයක් සිදු වෙලා තියෙනවා. ඒ නිසා අපි ඒකට සුදුසු ක්‍රියාමාර්ගයක් ගත්තොත් හොඳයි කියලා මම යෝජනා කරනවා. ඒ තියෙන ත්‍රීරෝද රථ කිහිපය අයින් කර ගන්නේ නැති නිසා වාහන තදබදයක් ඇති වෙනවා එතන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අඩි දෙකක් තව ඇතුළට යනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** අඩි දෙකක් තව ඇතුලට ගත්තොත් වඩා සුදුසුයි. මොකද එතන පාර අවහිරයක් නොවන ආකාරයට තමයි ක්‍රියාත්මක විය යුත්තේ. එහා පැත්තේ ත්‍රීරෝද රථ ගාලක් වෙනම තියෙනවා. ඒක හින්දා අවහිරයක් සිදු නොවන පරිදි කරානම් වඩා කාලෝචිතයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට කලින් මෙහෙම දෙයක් වෙන්න ඕන මන්ත්‍රීතුමිය. දැන් අපි ත්‍රීරෝද රථ ගාලකට අඩි දෙකක් දෙනවා නම් අපි දෙන්නේ ඒ ත්‍රීරෝද රථ ගාල නීත්‍යානුකූල හින්දා නේ. එහෙමනම් අපි මෙහේ ලියාපදිංචි වෙන ක්‍රමවේදයක් හදන්න වෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** දැනට එතන රථ ගාලක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ත්‍රීරෝද රථ ගාල් කරන ස්ථානයක් විදියට ඒ ස්ථානය මෙහේ ලියාපදිංචි වෙලා නෑ. මම ඒක අපේ ආදායම් පරීක්ෂකතුමාට දැනුම් දීලා තියෙන්නේ. මුළු බෝපෙ පෝද්දල තියෙන සියලුම ත්‍රී රෝද රථ ලියාපදිංචි කර ගමු කියලා. ඒක දිගින් දිගට ආපු ඉල්ලීමක්. ඒ වැඩපිළිවෙල ඔය අතරේ ක්‍රියාත්මක කරමු.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, අඩි දෙකක් දුන්නහම එතන ත්‍රී රෝද රථ ගාල් කරන්න පුළුවන්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට කොහොමත් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එතන අවහිරයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට තියෙන අවහිරය අවම වෙනවානේ ඇතුළට ටිකක් ගත්තහම.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** මම කියන්නේ අඩි දෙකට වැඩි ප්‍රමාණයක් ලබා දුන්නොත් වැඩිය හොඳයි අවහිරය ගොඩක් සිදුවන නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එතකොට වෙළඳ සංකීර්ණයේ රථගාලට අවහිරයක් වෙනවා.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රී කාංචනා මැතිණිය :-** වෙළඳ සංකීර්ණයේ වාහන එතන නවත්වන්නේ නෑ සභාපතිතුමා. එතන වාහන දාන්න බෑ. වාහන දාන්නේ වෙළඳ සංකීර්ණය කොනේ කුණු එකතු කරන තැන විතරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** අඩි දෙකකට වැඩිය දුන්නහම අපිට ගැටලුවක් වෙනවා සභාවේ භූමිය පිළිබඳව.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රී කාංචනා මැතිණිය :-** දැනට කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නෑ. මිනිස්සු රැඳිලා ඉන්නවා විතරයි. වාහනයක්වත් එතන නවත්වන්න බෑ. ගන්න බැරි විදියට හදලා තියෙන්නේ ඒකයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒක අඩි දෙකද, තුනද කියන එක තාක්ෂණ නිලධාරි එක්ක ගිහින් පරීක්ෂා කරලා ගමු. ඒ අවශ්‍ය අඩි ප්‍රමාණය අපි බලලා තීරණය කරමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, අනෙකුත් මන්ත්‍රීවරුනි මේ යෝජනාව ඉදිරිපත් කරන්න කලින් ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගිය ඔක්තෝබර් මාසයේ පළවෙනිදා කපුහේම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ පැවැත්වුණ 60 වන සංවත්සරය වෙනුවෙන් එතුමා විශාල සේවයක් කරලා තිබුණා. පාසල් භූමිය ශුද්ධ කර ගැනීම සඳහා සේවකයන් කීපදෙනෙක් යවලා තිබුණා. ඒ වගේම වතුර බවුසරය සම්බන්ධ මේ යෝජනාව දාන කොටත් මේ වතුර බවුසරය ඉස්කෝලයට වෙනත් මාර්ගයකින් සභාවෙන් ඉල්ලලා තිබුණා. ඒකට මගේ සම්බන්ධයක් තිබුණේ නෑ. 60 වන සංවත්සරයේ ආදි ශිෂ්‍ය සංගමයේ සංවිධායක කමිටුවේ මම හිටියා. ඒ කමිටුවේදී මම කිවුවා වතුර බවුසරය සභාවෙන් ලබාගන්න පුළුවන්ද කියලා ඇහුවහම, වතුර බවුසරය ගේනවා නම් සභාවට මුදල් බඳින්න ඕන කියලා. මම දන්නේ නෑ නොමිලේ ලබා දෙන්න සභාපතිතුමා එකඟ වෙච්ච සිද්ධියක්.

මුදල් ලබා නොදී වතුර බවුසරය ලබා දෙන එක සම්බන්ධව දිගින් දිගට සභාවට පැමිණෙන වෙලාවට ලේකම්තුමා කියනවා. විශාල මුදලක් අපතේ යනවා කියලා කියනවා එක එක මන්ත්‍රීවරු ඇවිල්ලා වතුර බවුසරය අරගෙන යනකොට. සභාවේ මුදල් තමයි මේකට යන්නේ. ජල සම්පාදන මණ්ඩලයට සල්ලි බඳින්න ඕන. ට්‍රැක්ටරයට ඉන්ධන ඕන. සියලු දේවල් ලබා දෙන්න ඕන. ඒ නිසා මේක දරා ගන්න බැරි දෙයක් වෙලා තියෙනවා සභාවට. මම විශ්වාස කරනවා මේ සියලු මන්ත්‍රීවරු කියන හැම උත්සවයකදීම ඒ සංවිධායක කමිටුව විසින් යම් මුදලක් හොයාගෙන තමයි මේක කරන්නේ. ඒ සංවිධායක කමිටුව යෝජනා කරන්න පුළුවන් වතුර බවුසරය ගන්නවානම් ඒකට මුදල් ගෙවන්න ඕන කියලා. මම ඒ පාසලේදී කිවුවා මුදල් බඳින්න ඕන කියලා. අපි මුදල් බැඳලා ඕන වතුර බවුසරය ලබා ගන්න. නොමිලේ ලබා ගන්න බෑ කියලා කිවුවා. නමුත් ඊට කලින් සභාපතිතුමා එකඟ වෙලා තිබුණා මේ වතුර බවුසරය ලබා දෙන්න. ඒ නිසා මට මේකෙදි කියන්න තියෙන්නේ මම මේ යෝජනාව දාන කොටත් සභාපතිතුමා එකඟ වෙලා තිබුණා කපුහේම්පල නන්දිමිත්‍ර විද්‍යාලයට වතුර බවුසරය නොමිලේ ලබා දෙන්න.

**26.** අප ප්‍රාදේශීය සභාව සතු වතුර බවුසර් නොමිලේ ලබාදීම සම්බන්ධව ගැටළු පවතින බැවින් වතුර බවුසර් නොමිලේ ලබාදීම නතර කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා :-** මම මේ යෝජනාව දාන්නේ මෙන්න මේ සභාවට ලැබෙන ආදායම් වලින් මේ විදියට මන්ත්‍රීවරුන්ගේ වුවමනාවට කතා කරලා වතුර බවුසරය අරගෙන යනවානම් ඒක දෙන ගාණට වඩා අඩුවෙන් හරි කමක් නෑ සභාවට යම් ආදායමක් ලැබෙන

ආකාරයට සකස් කරන්න. සම්පූර්ණ මුදල ගන්න පුළුවන්නම් එහෙම හරි සකස් කරන්න. ඒකට යන වියදම හරි ගන්න බලන්න. වතුර බවුසරයක් කොහේ හරි තැනකට යවන කොට යන වියදම හරි නැවත සභාවට ලබා ගැනීමේ ක්‍රමවේදයක් හදන්න. මේක සියලු මන්ත්‍රීවරුන්ට තියෙනවා. අපිට දැනගන්න ලැබුණු තොරතුරු අනුව සභා බලප්‍රදේශයෙන් පිටතට පවා මේ වතුර බවුසරය නොමිලේ ගිහින් තියෙනවා. ඒක පාලනය කරන්න. මේකට යන වියදම අඩු කරගන්න නම් සභාවේ යෝජනාවක් හැටියට ගේන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මම කියන්නම්. එකම තැනකට ගියා ඒ ගිංතොට මහා විද්‍යාලයට. මොකද දන්නවද හේතුව. සුගත් මන්ත්‍රීතුමා දම්නවා. අපි දිගින් දිගට ඒක සාකච්ඡා කරා. ගිංතොට මහා විද්‍යාලයේ 90% ක් විතර දරුවෝ ඉන්නේ අපේ බල ප්‍රදේශයේ බෝපෙ පෝද්දල. ඒක හින්දා නොදී බැරි තත්ත්වයක් ආවා. අපේ එහා පැත්තේ මායිමේ වුණාට 90%ක් යන්නේ බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ දරුවෝ. ඒකේදි ගිංතොට මහා විද්‍යාලයට දෙන්න වුණා. ඒක විතරයි බලප්‍රදේශයෙන් පිටට ගියානම් ගියේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම යෝජනා කරේ ඒකේ වියදම් වෙන මුදල හරි, භාගයක් හරි නැවත සභාවට අයකරගන්න. මන්ත්‍රීවරු යම් සංවිධානයක, උත්සවයක ඉන්නවා නම් කියන්න පුළුවන්. මේකට යන වියදමෙන් භාගයක් හරි සභාවට බදින්න වතුර බවුසරය ලබා ගන්න. ඒ සඳහා තමයි මේ යෝජනාව කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම නම් ඒ මතයට එකඟයි. මම නම් අපේ අනිල් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට එකඟයි. මොකද මේ සභාවක මෙහෙම වෙන්න ගියාම සීමාවක් නෑ ගරු සභාපතිතුමනි. මේක විතරක් නෙමෙයි, ඇත්තටම ආගමික මධ්‍යස්ථාන අරවට මේවට කියලා දෙනවා. අපි බුද්ධාගම්කාරයෝ විදියට අපේ පන්සලේ වැඩ ටික අපි කරගන්න ඕන. පල්ලියක් විදියට ඒ අය කරගන්න ඕන. අපේ පාරවල් ටික හදාගන්න බැරුව තියෙද්දි මෙහෙම දෙන්න බෑ. ඔබතුමාලා සාකච්ඡා කරලා තීරණයක් ගන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම නම් ඒ යෝජනාවට විරුද්ධයි. මොකද මේක කාගේවත් මන්ත්‍රීවරුන්ගේ වුවමනාවට ගන්න දෙයක් නෙමෙයි. මේක පොදු ජනතාවගේ යහපත වෙනුවෙන් තමයි ඉෂ්ඨ කරන්නේ. පොදු ස්ථානයකට වතුර බවුසරයක් සභාව මැදිහත්වෙලා දෙන්න පුළුවන්කමක් නැත්නම් මොකක්ද සභාවේ තියෙන වැදගත්කම. ජනතාවට සපයන සේවය මොකක්ද. මුදල් උපයනවා. සමහර අවස්ථාවල පෞද්ගලික වුවමනාවන් වලට ගන්න එවාටත් අපි මැදිහත්වෙලා මුදල් ගෙවලා ඇති සභාවට. පන්සලකට, පල්ලියකට, පාසලකට දෙන්න ඕන. පහුගිය ටිකේ කිඹීය ගාමිණී විද්‍යාලයේ ළිඳ යටවෙලා වතුර බොන්න විදියක් නෑ ළමයින්ට. ඒ පාර බද්දේගම ප්‍රාදේශීය සභාවට කතා කරලා වතුර බවුසරයක් අරන් දුන්නා. එහෙම ගත්තේ නැත්නම් බොන්න වතුර නෑ ඒ ළමයින්ට. ඒ වගේ වෙලාවට ප්‍රාදේශීය සභාව මැදිහත් වුණාම වැදගත් කමක් තියෙනවා. ඒ නිසා මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා මේ යෝජනාවට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ආපදාවකදී කිසි ප්‍රශ්නයක් නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මගෙන් ඒ යෝජනාවට විරෝධතාවය ප්‍රකාශකරනවා. ඇත්තටම බෝපෙ පෝද්දල බල ප්‍රදේශයට දවල් වරුවට ජලය කපනවා. දවල් වරුවට වතුර නෑ. බොහෝ ප්‍රදේශවල පල්ලියේ දානයක් ආවාම උයන්න වතුර නෑ. එතකොට වතුර බවුසරයක අවශ්‍යතාවය තියෙනවා. ප්‍රාදේශීය සභාවක් කියන්නේ සම්පූර්ණයෙන්ම ආදායම් උපයන ආයතනයක් නෙමෙයි. සමාජයට සේවයක් වෙන්නත් ඕන. ඒ නිසා පොදු ස්ථානවලට, පල්ලියකට, වගේ පොදු ස්ථානයකට වතුර බවුසරයක් ඉල්ලුවම ඒක දෙන්න පුළුවන්කම තියෙන්න ඕන. මේ සභාවෙන් ජනතාවට සේවයක් වෙන්නෙම නෑ. හැම එකටම සල්ලි. සල්ලි මත්තෙම නැහෙන්නේ නැතුව දෙන්නත් ඕන. ඒ යෝජනාවට මගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අපේ අනිල් මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධව මමත් අදහසක් දක්වන්න ඕන. මෙතුමන්ලා කිවුවා වගේම සභාව ආදායම් උපයලා සේවාවන් සපයන ආයතනයක් හැටියට කටයුතු කරනවා. නමුත් මෙතන ප්‍රශ්නය මතු වුණේ අපි නොමිලේ වතුර බවුසර් සේවාව සපයන කොට ඒකට අදාළ පොදු නිර්ණායකයක් නැති නිසා. එක්කෝ බලය තියෙන පුද්ගලයා කවුද, ඒ පුද්ගලයා සතුව රාමුවක් තියෙන්න ඕන. මේ රාමුව තුළ වැඩ කරන්න ඕන. පොදු ජනතාවගේ මුදල්නේ මේවා. බදු මුදල් වලින් තමයි නඩත්තු වෙන්නේ. ඒ වගකීම සභාවක් හැටියට අපිට තියෙනවා. මෙතුමන්ලා මතු කරා වගේම අපි කියන්නේ හදිසි ආපදා තත්ත්වයකදී, සමහර වෙලාවට පිරිවැයක් දරන්න බැරි ස්ථානයකදී මේකට අපිට විරෝධය දක්වන්න බැරි වෙන්න පුළුවන්. සභාවක් හැටියට ඒ වගකීම තියෙනවා. මේකට අපි මීට වැඩිය සාකච්ඡා කරලා

නිවැරදි නිර්ණායක මත ඉඳගෙන මේක නොමිලේ දෙනවානම් දෙන්න ඕන නිර්ණායක මත ඉඳගෙන, මේක නොමිලේ දෙනවා නම් මොන මොන තත්ත්වයන් යටතේද, නොමිලේ දෙන්න බලය තියෙන්නේ කාටද, එහෙමනම් කොයි සීමාවන් ඇතුළෙද ඒවාට නිශ්චිත රාමුවක් හදාගෙන කටයුතු සිදු කරනවා නම් හොඳයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, වතුර බවුසරය ලබා ගන්න ඉල්ලීමක් කරනවානම් ඒ ආයතනය හෝ දේවස්ථානයෙන් ඉල්ලීම් ලිපියක් දෙන්න ඕන සභාවට. ඒ ඉල්ලීම් ලිපිය දුන්නහම ඒක ඔප්පු වෙනවා පොදු ස්ථානයක් හැටියට. වතුර බවුසරය අරන් යන කෙනත් දන්නවා. එයා ගිහිල්ලා පෞද්ගලික තැනකට බාන්නේ නෑ කවදාවත්. ඒක එහෙම කරන්නේ නෑ. එහෙම බොරුවට වතුර බවුසරය අරන් යන්න අවස්ථාව නෑ මේ සභාවේ. වතුර බවුසරය ඉල්ලන පල්ලියෙන් හෝ පන්සලෙන් ඉල්ලීම් ලිපියක් ලබා දෙනවා. දායක සභාවෙන් ලියුමක් දෙනවා මෙහෙට. ඒ ලියුම දුන්නට පස්සේ තමයි වතුර බවුසරය ගෙනියන්නේ. ඒ නිසා එතනදි වංචාවක් දූෂණයක් සිදු වෙන්නේ නෑ. මෙතන තියෙන්නේ අපේ අනිල් මන්ත්‍රීතුමා දැනගෙන ඉඳලා නෑ ඉස්කෝල වලට වතුර බවුසරය නොමිලේ දෙනවා කියන එක. ඒක තමයි මෙතන තියෙන ප්‍රශ්නය. අපි සභා තීන්දුවක් අරන් තියෙනවා පූජනීය ස්ථානවලට, පල්ලි වලට, පන්සල් වලට, ඉස්කෝල වලට හා පොදු ස්ථාන වලට වතුර බවුසර් නොමිලේ ලබා දෙන්න කියලා. වතුර නිකං දෙන්නේ නෑ. වතුර වලට සල්ලි බඳින්න ඕන. ඒකත් මතක තියා ගන්න ඕන. වතුර වලට සල්ලි ගන්නවා මෙහෙන්. බවුසරය විතරයි නිකං දෙන්නේ. වතුර වලට සල්ලි බඳින්න ඕන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සමහර වෙලාවට මේ වතුර බවුසරය ලබා ගන්න යම් ආයතනයක හෝ යම් ස්ථානයක ඒ උත්සවය සංවිධානය කරන කොට සංවිධායක කමිටුවක් තියෙනවා. ඒ සංවිධායක කමිටුව තීරණය කරනවා ඒක කොහෙන්ද ගන්නේ කියලා. ඒකට සභාව නොමිලේ වතුර බවුසරය ලබා දිය යුතු ස්ථාන කතා කරගන්න පුළුවන් අපිට මේ සාකච්ඡාව ඇතුළේදි. හැබැයි මේක හරහා වෙනත් පිට තැන් වලට යන්න ඉඩ තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බෑ. එහෙම යන්න බෑ. එහෙම යන්න විදියක් නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේ වන තෙක් එහෙම වෙලා නෑ. අපේ සභාවේ ඉන්න කම්කරුවෝ පවා එහෙම ගිහින් බාන කොට එහෙම තැනක් නම් හරවාගෙන එනවා. එහෙම ගෙනියන්න බෑ. යම්කිසි කෙනෙක් එහෙම කරානම් ඒක නීතිවිරෝධියි. එහෙම ගෙනියන්න බෑ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම කියන්නේ එතනට මේක යන්න පුළුවන්. සභාවට ඒ පාඩුව විඳගන්න පුළුවන්ද කියන එක තමයි ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පාඩුවකට වැඩිය මන්ත්‍රීතුමා සේවාවක්. පොදු ආයතනයක් වුණාම අපි පොදු සේවයක් සපයන්න ඕන සභාවක් විදියට. ඒක සේවයක්. අපි 100% ක් එකඟ නෑ. අපේ කම්කරුවෝ යොදවන්න ඕන. ජලය මුදලට ගන්න ඕන. ඒ වගේම ගේන්න ඕන, ගෙනියන්න ඕන. අතිකාල දීමනා ගෙවන්න ඕන. ඔය ටික ගත්තහම අපිට දැවැන්ත පාඩුවක්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** සමහර තැන් වලට ගිහින් මේක අනතුරට පවා පත්වෙලා තියෙනවා. සමහර තැන්වල පෙරළිලා තියෙනවා මේක අරගෙන ගිහිල්ලා. ඒ වගේ අනතුරු වල්දී සිදුවෙන හානිය සභාව විඳදරා ගන්න ඕන. එතකොට මේක නඩත්තු සේවයක් කියන එකේ කිසිම අරමුදලක් නැත්නම් එක දිගට පවත්වා ගෙන යන්න බෑ. සභාවට නඩත්තු මුදලක් නැත්නම් මේක එක දිගට පවත්වා ගෙන යන්න බැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනිත් ජනතාවට දෙන ඒවාට අපි මුදල් ගන්නවානේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේ දේ විතරක් නෙමෙයිනේ ජනතාවට සහන දෙන්නේ. සභාවෙන් දෙන සියලු දේවල් සහන නේ. ඒක නිසා මේකට යම් වියදමක් දරනවා නම් සභාවෙන් මේකට යම් මුදලක් අයකරාට ප්‍රශ්නයක් නෑ. මම කලින් කිව්වෙත් ඒකයි. අපි උත්සව කමිටුවේ ඉන්න කොට අපි යෝජනා කරා සභාවට යම් කිසි මුදලක් ගෙවලා ගන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ජලයට මුදල් ගෙවන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඉතිං මෙහෙම වෙලාවල් තියෙනවා. ගොඩක් ඒවාට සමහර වෙලාවට මම දෙනවා. විජේපාල මහත්තයාට මම අතින් දෙතුන් දාහක් එහෙම දීලා ඇති.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ජලසම්පාදන මණ්ඩලයට දෙන මුදල්වත් ආපසු ගන්න ක්‍රමවේදයක් නෑ. සභාපතිතුමා කියනවානම් එතුමාගේ අතින් රුපියල් තුන්දාහක් දුන්නා කියලා, අරන් ගියේ කවුද කියලත් සභාපතිතුමා දන්නේ නැතුව ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ලියුම ආවට පස්සේ යවන්නේ. ඉල්ලීමක් තියෙන්න ඕන.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** අඩුම තරමේ ජලසම්පාදන මණ්ඩලයට ගෙවන මුදල්වත් අයකරගන්න ක්‍රමවේදයක් නැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනට කරන්නේ එහෙමයි. සමහර වෙලාවට පන්සලක හිතවත් හාමුදුරුනමක් ඉල්ලුවොත් අපිට හාමුදුරුවන්ට රුපියල් පන්සීය දෙන්න කියන්න බැනේ. ඒ නිසා මම රුපියල් පන්සීය දීලා වතුර ගහන් එන්න කියනවා. ඒ මුදල මෙහෙට කොහොමත් බැර වෙලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** එතකොට මේකෙන් සභාවට පාඩුවක් වෙනවද නැද්ද,

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පාඩුවක් තමයි සේවයක් ඉතිං. පාඩුවයි, සේවයයි යන්නේ. සමහර දේවල් සේවය විදියට ගණන් හදන්න බැනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේක විතරක් නෙමෙයි සභාවෙන් සේවයක් වෙන්නේ. මීට වඩා ගමේ ජනතාවට සේවයක් වෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඇත්තම කතාව මේකෙන් පාඩුවක් වෙනවා. වෙනවා කියලා ජනතාවගේ පොදු අවශ්‍යතාවය මත වතුර බවුසරයක් දෙන්න බැරිනම් සභාවක තේරුමක් නැනේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම නම් දන්නේ නෑ සභාව තීරණයක් ගන්න.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- ඒක දෙන්නේ අපි මෙහෙමයි. අපි කියමුකෝ තොටගොඩ පංචවූපාරාමයේ දානමය පිංකමක් තියෙනවා. විහාරස්ථානයෙන් ලිපිය එනවා. සභාපතිතුමා ඒක මිනිට් කරහම ඒකට බිල දානවා. අදාළ වතුර ප්‍රමාණයට ජල සම්පාදන මණ්ඩලයෙන් බිලක් කඩනවා. ඊට පස්සේ වතුර බවුසරයක් දෙනවා. නමුත් සභාවක් හැටියට අපේ සභාවේ වතුර බවුසරය එතන නවත්වලා තියෙන නිසා ඒක තමයි ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මම කියන්නේ ඕක විතරක් සේවයක් විදියට ගන්න එපා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මහායාන ඒවා ආවහම කොහොමද කරන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා** ඃ- ඒ සියලු දේවල් වලට දිය යුතුයි කියන මතයේ තමයි මමත් ඉන්නේ.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** හරි ඒකට සභාව තීරණයක් ගන්නකෝ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා ඃ-** දැන් මට මෙහෙම එකක් දැන ගන්න ඕන. ගිංතොට ඉස්කෝලෙට වතුර බවුසරය දුන්නා. ඒක දැන ගත්තට කමක් නෑ. ඇත්තටම මම මැදිහත් වුනේ නෑ ඒ කාරණයට. විදුහල්පතිතුමා ලිපියක් එවලා තමයි ඒ ඉල්ලීම කරේ. ඉල්ලීම කරාම ඒ වෙලාවේ මමත් ඒ අවස්ථාවේ හිටියා. හිටියට පස්සේ මම ඒකට කතා නොකර බැරි වුණා. මම කිව්වා මෙහෙමයි ඒක ප්‍රාදේශීය සභා බලප්‍රදේශයෙන් පිට. ඒක අපි පිළිගන්නවා. හැබැයි ඒ පාසලේ 90% ක් ඉන්නේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අය. වැලිපිටිමෝදර, ගිංතොට, ඒ ප්‍රදේශයේ ළමයි ඉන්නේ. එම නිසා ඒක ලබා දීම කිසි වැරැද්දක් නෑ කියලා කිව්වා. නමුත් වැඩේ තියෙන්නේ ජල බවුසරය අපි ලබාදෙන්න පුරුදුවෙලා ඉන්නවා බෝපෙ පෝද්දල ජනතාව වෙනුවෙන්. ඒක දෙන එකට අපි විරුද්ධ වුණොත් අපිට යම් කිසි නරක නාමයක් එනවා. මේ අය දෙන්න එපා කියලා

මතයක් ගොඩනැගුවා කියලා. වතුර කියන දේ බෝපෙ පෝද්දලට ඇත්තෙම නෑ සමහර වෙලාවට. අපි මලගෙදරක ගියොත් මුහුණපාන සිද්ධියක් තමයි වතුර නැති ප්‍රශ්නය. වතුර තියෙනවා අපිට නෑ. ඒ තැන් වලදී අපි අපහසුතාවයට පත්වෙලා තියෙනවා. ඒක නිසාම තමයි මේ කාර්යය වෙනුවෙන් බෝපෙ පෝද්දල ජනතාව මීට වඩා දියුණු වෙනකන්, මීට වඩා දියුණු තත්ත්වයට ආවාට පස්සේ ඒ කාර්යය ඉවත් කරාට කමක් නෑ කියලා. ඒ ජල කප්පාදුව අවසන් වෙනකම් හරි අවශ්‍යතාවය දැඩි සේ තියෙන නිසා එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ៖-** වතුර දෙන්න එපා කියලද කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා ៖-** ජලය ලබා දෙන්න කියන එක මම කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** මේ යෝජනාව අපි සංශෝධනයකට යටත්ව වෙනස් කරමු. ප්‍රදේශයේ ගැටළු රාශියක් පවතිනවානේ. ඒ තාක් දුරට මේක දෙන්න ඕනනේ. අපි ගැටළු විසඳ ගන්නකම් මේක කල් දාගන්න. මේ යෝජනාව අයින් කරගමු එතකම්.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ៖-** ගරු සභාපතිතුමනි, ඉදිරිපත් කරපු යෝජනා සම්බන්ධව මම හිතන්නේ බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ තියෙන වතුර සම්බන්ධ ගැටළුව විසඳුනාට පස්සේ හරි මේ යෝජනාව නැවත සලකා බලන්න කියලා යෝජනා කරමින් තාවකාලිකව මේ යෝජනාව න්‍යාය පත්‍රයෙන් ඉවත් කර ගන්නවා.

<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖- 27.** කිතුලම්පිටිය, ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ජාත්‍යන්තර පාසලේ අනතුරුදායක අනවසර ඉදිකිරීම සම්බන්ධව නීතිමය පියවර ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ៖-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** මේක දැන් මාස හයකට වැඩි නිසා මම ආයෙත් ගෙනාවේ. තව වෙනකං අරන් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක අබේසේකර මන්ත්‍රීතුමා අදාළ නීතිඥවරයාට භාරදීලා තියෙන්නේ. නාලනී අලහප්පෙරුම නීතිඥතුමියට භාර දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** දැන් මෙහෙම තියෙන්නේ. මේක ගැන කියන කොට මතක් කරන්න ඕන. දැන් මේ නීතිය පැත්තේ දේවල් වලට යන අපේ නිලධාරියා ගත්තම, නාවින්නේ ප්‍රශ්නයට අපි කවදහරි දවසක ඉතාම සාධාරණ විදියට එරෙනවා. මොකද මේ යන නිලධාරියා අවශ්‍ය ලේඛන ටික අරගෙන දෙන්නේ නෑ. මෙතනින් යනවා කියලා ගිහිල්ලා ඒ නිලධාරීන් ඊට පස්සේ හැරිලා එනවා මිසක් වෙන නෑ. දැන් මේ නඩු වාරය තියෙනවා 15 වෙනිදා. ඉතාම පැහැදිලිව කියන්නේ. මේ පාර නඩුකාරයාගෙන් බොහොම අමාරුවෙන් තමයි කල් ගත්තේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒකට මන්ත්‍රීතුමා අදාළ නීතිඥවරයා හෝ නීතිඥවරිය තමන්ගේ ලිපිකරුවා ලව්වා ඒ ලිපිගොනු ටික හදා ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** නෑ. අපි ගිහිල්ලා අරගෙන දෙන්න ඕන. අපි වෙන නඩුවකට වුනත් අරගෙන දෙන්න ඕන. අපේ සභාවෙන් ඒක අරන් දෙන්න ඕන. අපේ ඒකට යන නිලධාරියෙක් ඉන්නවානේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** ඒක මෙහෙමයි. ගිය වාරේ නඩුව තිබුණා. නඩුවේදී පැමිණිලි පාර්ශවය දීපු වාර්තා මහේස්ත්‍රාත්තුමාට ඇවිත් නෑ. එදා ඉඳලා මම කිවුවා. ගත්තෙම නෑ. කවදාහරි ඔක්කොම ඇතුළට දානවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** දැන් මන්ත්‍රීතුමා නීතිඥයා දෙනවා රෙජිස්ට්‍රාර්ට මේ ලියකියවිලි ටික ඕන කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** අපේ සභාවේ මිස් ගිහිල්ලා නඩු අංකය අරගෙන ඒවා ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නීතිඥයාගෙන් අපේ මිස් ඉල්ලීමක් කරන්න ඕන නෑ. නීතිඥයා ලියුමක් දෙනවා මේ ලියකියවිලි ටික අවශ්‍යයි කියලා රෙජිස්ට්‍රාර්ට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නීතිඥයා හම්බවෙලා ඒ ලියුම ඉල්ලගෙන යන්න ඕන. සභාවෙන් කරන්න ඕන. පෞද්ගලික නඩුවක් වුනත් ඒ මට්ටම තමයි තියෙන්නේ. 15 වෙනිදාට කලින් කරගන්නත් ඕන.

ඊළඟට ගරු සභාපතිතුමනි, මේ නඩු භාර දීලා වැඩක් නෑ. මොකක්ද ගන්න පියවර කියලා අහන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 28.** කිතුලම්පිටිය, ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ජාත්‍යන්තර පාසලේ අනවසර ගොඩනැගිල්ල සඳහා නියම කර ඇති දඩ මුදල සම්පූර්ණ ගොඩනැගිල්ල සෑදීමට පෙර නියම කරන ලද දඩ මුදලක් වන අතර එම දඩ මුදල ද නිවැරදි නොවන අතර ඉන්පසු ඉදිකර ඇති කොටස සඳහාද දඩ මුදල් අයකළ යුතුව ඇත. ඒ සම්බන්ධව නිවැරදි නීත්‍යානුකූල දඩ මුදල නියම කළ යුතු අතර ගතවී ඇති කාලය සඳහා අයවිය යුතු පොලී මුදලද එයට එක්කර එකවර ගෙවන මෙන් ලීඩ්ස් ඉන්ටර්නැෂනල් පාලනාධිකාරියට දන්වා යවන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම වුනත් අබේසේකර මන්ත්‍රීතුමා ඒ දඩ මුදල කීය වුනත්, නිවැරදි වුනත්, නැතත් ඒක ගන්න බෑ. අපි නීතිමය කටයුතු වලට ගිහින් තියෙනවා. අපිට ඒ අය ඉල්ලපු දේවල් භාරදීලත් නෑ. වරලත් ඉංජිනේරු වාර්තාවක් ඉල්ලලා තිබුණා. ඒවා භාරදීලත් නෑ. භාරදුන්නත් දැන් නීතිමය කටයුතු සිද්ධවෙන හින්දා දැන් ගන්න බෑ. ඒක ගත්තොත් අපි නීත්‍යානුකූල කරා වෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා එතනදි හරි. ඒක නෙමෙයි මම කියන්නේ. දැන් මේකේ දඩ මුදල පවා වැරදියි. දැන් නඩු ගාණකටත් ගිහිල්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 29.** මෙතෙක් මේ සභාවේ සේවය කළ නිලධාරීන්ට විධිමත් පරීක්ෂණයක් නොකොට යම් යම් දඬුවම් ලබා දී ඇත. එම තත්ත්වය හිතාමතාම එම නිලධාරීන් බේරීම සඳහා කරන ලද්දක් බව විශ්වාස කරන අතර ඔවුන් සඳහා විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකෙදි ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ගරු මන්ත්‍රීවරුන්ට මේක ගැන පැහැදිලි කරන්න ඕන. මේක තුළ වෙන්නේ දැන් මේ සභාවේම කීපයක් වෙලා තියෙනවා. දැන් මේ ලිපිගොනු අස්ථානගතවීම පිළිබඳ පරීක්ෂණ පවත්වලා තියෙනවා. මේ පරීක්ෂණ විධිමත් පරීක්ෂණ නෙමෙයි. නිකන් බලලා වාරිකයක් නතර කරනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ගියපු ගමන් විධිමත් පරීක්ෂණයක් කරපු නැති නිසා ඒක අහෝසිකරලා දානවා.

ඊළඟට ගරු සභාපතිතුමනි, මේ ලිපිගොනු පිළිබඳව මේකෙ නිර්ණායක දීලා තියෙනවා බොහොම පැහැදිලිවම. අද දවසෙත් මම ඔබතුමාගෙන් බොහොම පැහැදිලිව ඉල්ලා සිටිනවා. මේකට බොහොම කලින් තමයි මේවා අස්ථානගතවෙන්න පුළුවන් කියලා කිවුවේ. ඒ වගේම ඒ කාලෙම තමයි මම යෝජනා කරේ කැමරා පද්ධතියක් දාන්න කියලා. ඒ වගේම කරන ලද පරීක්ෂණයේදී බොහොම පැහැදිලිව යෝජනා කරලා තියෙනවා කැමරා පද්ධතියක් දාන්න කියන එක. ඒක නොදැමීම නිසා හොරකමට ඉඩකඩ හම්බවෙලා තියෙනවා. මේක ඔබතුමා දැන ගන්න ඕන. ලීඩ්ස් ඉන්ටර්නැෂනල් කිවුවම නඩු දානවා තාප්පයට. තාප්පයට විතරක් නෙමෙයි බිල්ඩින් එකටත් නඩු දාන්න ඕන බොහොම පැහැදිලිවම. මේ ෆයිල් එක උඩ එනවා. යට යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. දැන් දෙකටම දාලා තියෙන්නේ. තාප්පයටයි, බිල්ඩින් එකටයි දෙකටම නඩු දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ඒ යෝජනාවෙන් කියන්නේ විධිමත් පරීක්ෂණයක් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද නොකෙරුනේ කියලා ප්‍රශ්නය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** කවුද නිලධාරීන් කියලා දන්නේ නෑ?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මෙතන බොහොම පැහැදිලිවම ප්‍රශ්න මතුවෙලා තියෙනවා. ඉතාම පැහැදිලිව නම් විදියට කිවුවොත් අනුෂ්කා මිස්, චාමර මහත්තයා, මේ හිටපු අය. මේවට අවසර දුන්නේ මේ අය බොහොම පැහැදිලිවම. ගරු සභාපතිතුමනි, මේ ඔක්කොම මම ඔබතුමාට යොමු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා අනුෂ්කා මහත්මියට විධිමත් පරීක්ෂණයක් කරලා අදාල දඬුවම් නියම කරලා තියෙන්නේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් දීලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් දීලද තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔව්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මේ වී.සී පාරේ බොහොම පැහැදිලිවම 46/1 හරි, මොකක් හරි එකක්, හයිටෙන්ෂන් ලයින් එකක් යට එකකට අවසර දුන්නා. බොහොම පැහැදිලිවම දෙන්න බෑ. ඒක දුන්න එකේ ලිපිගොනුව නැතිවෙලා තිබුණා. දැන් එකේ ලිපිගොනුව තියෙනවා. ඉතින් දැන් අවශ්‍ය නීතිමය පියවර ගන්න ඕන. සමහර වෙන්දේසිකාරයොන්ට අපි කියනවා හයිටෙන්ෂන් ලයින් එක යට අවසර දෙන්නේ නෑ කියලා. ඒ අය ඒ කෑලි අයින් කරනවා. කෑලි අයින් කරලා වෙන්දේසිකාරයෝ ඒවා හොර රහසේ විකුණනවා. ඒක හින්දා ඒ ඉඩම් කෑල්ල සභාවට පවරාගැනීම කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ යෝජනාවට මොකද කරන්නේ පරීක්ෂණය කරලා තියෙන හින්දා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් චාමර මහත්තයට මම දන්නවා මොකද වෙලා තියෙන්නේ කියලා. මම කිවුවේ පොදුවේ විධිමත් පරීක්ෂණයක් කරන්න කියලා. කරලා තියෙනවා නම් ප්‍රශ්නයක් නෑ. කරලා නැත්නම් කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 30.** ප්‍රාදේශීය සභාවේ ආරක්ෂිත තාප්පය කැඩී බිඳී ගොස් අවුරුදු තුන හතරක් වන අතර සභාවේ දේපළ අනාරක්ෂිත තත්ත්වයක පවතී. මේ සම්බන්ධව ගරු අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමාගේ අවධානය යොමුකළ අතර ප්‍රතිපාදන ලබා දීමට එකඟ විය. ඒ අනුව අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඇස්තමේන්තුවක් සකස්කර දෙන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඇස්තමේන්තුවක් හදලා තියෙන්නේ. ඒක දෙන්නම්. ගම්පෙරළිය හරි මොකක් හරි එකකින් අපිට ඒ මුදල් ලබා දෙන්න. ඉස්සරහ තාප්පයට බැරිද දන්නේ නෑ?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පාර කැඩෙනකොට පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔික සජිත් ප්‍රේමදාස එන හින්දා තමයි වහන්නේ. නැත්නම් රෑට රෑට මෙහෙට එන්න ආවොත්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම මොනවා වුණත් අද දවසේ බොහොම සන්තෝෂ වෙනවා. අද විරුද්ධ පක්ෂ නායක භූමිකාව ඉෂ්ඨ කරා අපේ කියාස් මන්ත්‍රීතුමා ඉතාම හොඳට. මට ලොකු බයක් තිබුණා. රාවයක් ගියා එහෙන් මෙහෙන් අපේ සභාපතිතුමා ගිලගෙන ගිහිල්ලා කියලා. පොහොට්ටුවට ගිහිල්ලා කියලා. හැමතැනම ප්‍රචාරයක් ගියා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපේ සැලුන් දොර වහලා තියෙන්නේ අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** චූටි ඉඩක්වත් නැද්ද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ. දැන්ම තීරණයක් ගත්තොත්, අදම තීරණයක් ගත්තොත් පුංචි ඉඩක් තියෙනවා. මෙතුමත් ඇහුවා අපෙන් එන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට දුකක් තියෙනවා. ඒක මම ප්‍රසිද්ධියේ කියනවා. අබේසේකර යන්න ඉන්නවා කියලා කතාව ඇරියෙත් විරුද්ධ පක්ෂ නායකතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමත් අපෙන් ඇහුවා එන්න. මේ තියෙන වාතාවරණය තුල එතුමා ගැනීම පිළිබඳව අපිට ගැටලුවක් තියෙනවා. ඒක හින්දා අපි බෑ කිවුවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම බොහොම පැහැදිලිව ඉන්න තැන ඉන්නවානේ. ඒක ගැන කතාවක් නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ කිවුවේ විජේපාල මහත්තයා ගාවද ?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අහන ප්‍රශ්නය මගෙන් හරියට ඇහුවොත් උත්තර දෙනවා. විජේපාල මහත්තයාගේ පක්ෂයක් නෙමෙයිනේ මේක. ඔබතුමා හරියට ඇහුවොත් මම උත්තර දෙන්නම්.

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා ඃ-** මම අහන්නම් ප්‍රශ්නය හරියට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නම් ඊට වඩා හොඳට. අක්මීමණ ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා. එතුමා තමයි නායකත්වය අරන් වැඩ කරන්නේ. ඔබතුමා අද ඒ දේශපාලන ප්‍රවාහයේ එතුමත් එක්ක වැඩ කරන කරනවද, ඔබතුමා සජිත් ප්‍රේමදාස මැතිතුමා දිනවන වැඩ කරනවාද?

**ගරු මන්ත්‍රී සුගත් කළංසූරිය මැතිතුමාගේ යෝජනා ඃ-** මම අහන්න ගියේ ඒක නෙමෙයි. ඔබතුමා ඉන්නේ රනිල් වික්‍රමසිංහ මහත්තයා එක්කද, එහෙම නැත්නම් සජිත් ප්‍රේමදාස මහත්තයා එක්කද කියලා මම දැන ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මගේ ප්‍රශ්නයත් ඒකට එකතු කරගන්න. එකක් තමයි ආසන සංවිධායකතුමා ගහලා එලෙව්වා කියන එක. දෙවැනි එක තමයි ඔබතුමාගේ කොට්ඨාසය වෙනත් කෙනෙකුට භාරදීලා තියෙනවද කියන එක. විජේපාල මහත්තයාගේ කණ්ඩායම එක්ක එකතුවෙලා එතුමාට වැඩ කරනවාද, නැත්නම් එතුමාට විරුද්ධව වැඩ කරනවාද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔබතුමා මම ගැන හොඳට දන්නවා. මට 10ක් ගැහුවම එකක් හරි ගහනවා. මට ගහන්න බැරි නම් එකක් හරි ගහනවා. මගේ ලොකේ ගණන්කාරයෝ නෑ. ඒකට ඒ උත්තරය ඇති.

ඊළඟ කතාව තියෙන්නේ සභාපතිතුමා ඇහුවේ මේකෙ දේශපාලන බලධරියා, දැන් ඇත්තටම අපි දන්නවා ඔබතුමාලාගේ පක්ෂය ඇතුලෙත් බල අරගල තියෙනවා. ඉතින් ඔබතුමාලට කවදාවත් බෑ රමේෂ් පතිරණ මැතිතුමාව අතඇරලා දාලා චන්දිම වීරක්කොඩි මැතිතුමා ලඟට යන්න. ඉතින් ඒ වගේ වැඩක් තියෙන්නේ මේක ඇතුලේ දේශපාලනය කරන්න ඕන නම්. මහ මුහුදේ නිකන් හාල් මැස්සෙක් වගේ එක්කෙනෙක් තමයි විජේපාල හෙට්ටිආරච්චි කියන්නේ. මම ඒක වෙන කතාවකට කියපු දෙයක් නෙමෙයි. මම කිවුවේ 225ක් ඉන්නකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි නම් හිතුවේ තෝරෙක්, මෝරෙක් කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා ගැන ප්‍රශ්න අහලා මෝඩ වුන් එකක් ගන්නවා කට්ටිය. අබේසේකර මන්ත්‍රීතුමා ඕනම නායකයෙක් එක්ක කෙළින් කතා කරන මන්ත්‍රීකෙනෙක්. අබේසේකර මන්ත්‍රීතුමා අපේ ආසන සංවිධායකතුමා එක්ක විතරක් නෙමෙයි. රමේෂ් පතිරණ මහත්තයා එක්කත් ලෙඩ දා ගත්තා. අපේ හේමකුමාර නානායක්කාර මහත්තයා එක්කත් ලෙඩ දා ගත්තා. එතුමා කාටවත් නැවෙන්නේ නෑ. එතුමාට යම්කිසි දෙයක් නිරාකරණය කරගන්න තියේ නම් එතුමා වාද කරනවා. එහෙම ගියා කියලා එතුමාව අපි පක්ෂයෙන් එළවලත් නෑ. එතුමා

ගිහිල්ලත් නෑ. ඒ නිසා මෙතුමා විජේපාල මහත්තයා එක්ක පොඩ්ඩක් තරහා වුණා කියලා ඔබතුමාලා පොඩි චූන් එකක් ගන්න. චූන් එක ගත්තා කියලා මෙතුමා වෙනස් වුනේ නෑ කියලා මතක තියා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට තියෙන ප්‍රශ්නය එතුමා නෙමෙයි, ඔබතුමා එන්න අහපු එක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම මේ දේශපාලනයෙන් ඉතාම ඉක්මනින් සමුගන්නවා. සන්තෝෂයිනේ. කමක් නෑ. ඉතාම ඉක්මනින් සමුගන්නවා. හැබැයි ඒ දවසට මම ඇවිල්ලා ඔයගොල්ලත් එක්ක මීට වැඩිය බොහොම සුහදව කතා කරනවා. ඒක වෙන කතාවක්. මම දැකපු දේ ගැන සටන් කරපු මනුස්සයෙක්. මම මේ දේශපාලනයෙන් ගනිපු දෙයක් නෑ. මට කියන්න පුළුවන් එකම එක මගේ ලොකු දුවට රස්සාවක් දුන්නා කියලා විතරයි මේ අවුරුදු 55 ටම. මම බැංකුවේ රස්සාව දාලා ඇවිල්ලා දේශපාලනය කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒත් අපේ ආණ්ඩුවෙන්, මහින්ද මහත්තයාගෙන්

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මහින්ද මහත්තයාට මම අදත් ගරු කරනවා පෞද්ගලිකව. ඒක ගැන කතාවක් නෑ. අනිත් දුවටත් දුන්නා ගියේ නෑ. මම වෙන කිසි දෙයක් අරගෙන නෑ. සමහර දේශපාලඥයෝ දන්නේ නැති එක ගැන දුකයි. මම මේක මෙතන නෙමෙයි කියන්න ඕන තැන්වල කියනවා.

ගංවතුරක් ආවා. ගංවතුර කියන්නේ පෞද්ගලික දෙයක් නෙමෙයි. ඒකට දේශපාලනයක් නෑ. කවුරුත් ඇවිල්ලා වැටෙන්න ඕන තැනක්. චමින්ද මන්ත්‍රීතුමා මට ඇතිවෙනකම් නක්කලේ දැම්මා කෝ තමුන්නාන්සේලාගේ නායකයා කියලා. මට ඉතිං මොකක්ද කියන්න තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ආවේ නැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට පුළුවන්ද ආවේ නැති එක ආවා කියන්න. ආපු මිනිස්සු අගය කරනවා. ප්‍රසිද්ධියේ කියනවා මට ඒකට ප්‍රශ්නයක් නෑ. අපේ සහෝදර මන්ත්‍රීවරු දැන ගන්න ඕන නිසා කියන්නේ. එදා තිබුණා මූලික සාකච්ඡාවක් ආපදා කළමනාකරණයෙන් සියලුදෙනා කැඳවලා. කවුද ගිහින් හිටියේ. සුගත් මන්ත්‍රීතුමයි, සභාපතිතුමයි ගිහින් හිටියා. කියාස් මන්ත්‍රීතුමයි, මමයි ගිහින් හිටියා. අනිත් සියලුම මන්ත්‍රීවරු ඔක්කොම ඇවිල්ලා හිටියා. අපේ නායකයා නෑ. ඕපාතට ස්ථිරව බෝට්ටුවක් ඕන. වෙනදා තිබුණා එහෙම එකක්. අපි එතනදි ඉල්ලලා ඕන ඒක දාගන්න. ව්‍යසනයක් වුණාම ඒකේ වාසියක් ගන්න දෙයක් නෑ. මෙතුමා ගිහිල්ලා කෑම ටිකක් දුන්නා. ඒක වටිනවා. ඒක ගැන ගැටළුවක් නෑ. ඒක ඉතිං වෙලාවට දෙන්න බැරිවුණා. ඒ වගේ ගැටළු තියෙනවා. එතනට ගියහම නායකයා කෝ කියලා මාව කන්න හදනවා. එතනදී මම දෙන උත්තරය මොකක්ද?. එතකොට එහෙම කරලා මට කියවන්න ආවම කියන්න ඕන භාෂාවෙන් මම කිව්වා. මම බොහොම ගරු කරලා කතා කරේ.

මම හේමකුමාර නානායක්කාර මැතිතුමා එක්ක හැප්පුණා. මොකටද හැප්පුනේ, අන්න අර නරාවල ඉඩම් බෙදන්න ගිහිල්ලා. හැබැයි එකක් තියෙනවා එතුමා බොහොම ගෞරවනීය මනුස්සයෙක්. සංවර්ධන සභාවකට ගියාද, ඒකට වෙලාවට එනවා. දේශපාලනයේ සාදාකාලික මිතුරෝ, සතුරෝ නෑ කියලා තේරුම් ගන්න ඕන. ඒක තේරුම් ගන්න බැරි ගොන් තැරියෝ දේශපාලනයට ආවම වෙන දේවල් තියෙනවා, විනාශවල් තියෙනවා. ගොන් තැරියෝ එහෙමම තමයි කියන්න ඕන. වෙන වචන නෑ කියන්න. දැන් හේමකුමාර නානායක්කාර මැතිතුමාලා අපි හැප්පුණා. මම එතුමාට කියන ඕන දෙයක් එතුමා විශ්වාස කරනවා. ඒකට හේතුව එතුමා දන්නවා එදා ඒ වුණ ප්‍රශ්නය මොකක්ද කියලා. රිචඩ් පතිරණ මැතිතුමයි, මමයි කියන්නේ එක පැත්තකින් ඥාතියෝ. අනිත් පැත්තෙන් අපි සුහදව කාලේ ගෙව්වා සියලු දේශපාලඥයෝ ආපු තැන්වල. හැබැයි එකක් තිබුණා, අවසාන කාලයේදී එතුමයි, මමයි බොහොම කිට්ටු වුණා. ප්‍රතිපාදන දුන්නා. මේ සභාවට පවා ප්‍රතිපාදන දුන්නා. දේශපාලනයෙන් සදාකාලික හතුරෝ නෑ. හැබැයි එකක් තියෙන්නේ අඥබාලයෝ ඉන්නවා නම් මේ දේශපාලනයෙන් අතුගෑවිලා යන්න ඕන කොහේ හිටියත්. වපුරපු දේවල් ලැබේවි ඕන දේශපාලඥයෙකුට. මම වපුරපු දේවල් මට ලැබේ. හැබැයි එකක් තියෙනවා මේ ප්‍රශ්නයේදී ඔබතුමාලා ඇහුවා බොහොම පැහැදිලිවම. ඉතිං ඒකෙදි අපේ දිල්රුක් ගරු සභාපතිතුමා ගත්තම, මම කී වතාවක් කියලා තියේද අපි එකතු වෙලා වැඩ කරගෙන යමු කියලා. මම බොහොම පැහැදිලිව නිහතමානීව කියලා තියෙනවා ඔබතුමාට වෙනසක් පෙන්වන්න පුළුවන් තැන්. මම දැන් ඒවා ගැන කතා කරන්නේ නෑ. මම කියලා තියෙන්නේ. ඒ කිව්වේ අපි එකට වැඩ කරපු කට්ටිය. මම අද දවසෙත් ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා. බොහොම පැහැදිලිව ඉල්ලනවා. මේ සභාවේ කරන්න පුළුවන්

දේවල් තියෙනවා. ඉතාම පැහැදිලිව කරන්න පුළුවන් දේවල් තියෙනවා. ප්‍රගතියේදි කතා කරන්න ඕන. ඒක අපි කතා කරමු එතනදි. මම කිවුවේ ඔබතුමාලා අහපු එකට. ඒක තමයි උත්තරේ.

මට හැබැයි කවදාවත් එකක් තියෙනවා හේමකුමාර මහත්තයාගේ ගෙදර ගියහම කියලා නෑ බහිනවා දොට්ට කියලා කැඳවපු මනුස්සයෙක්ව. ඒක කියන්න ඕන. ගහලා එලෙව්වා කියලා කතාවක් තියෙනවා. මට ගැහුවා නම් මම ගහලා තමයි එන්නේ එතනදි. එහෙම නරකයි. ගෙදරට කැඳවපු මනුස්සයෙකුට එහෙම කරන්න නරකයි.

කියාස් මන්ත්‍රීතුමා මතක තියා ගන්න මම කකුල් දෙක දෙපැත්තේ ගහ ගන්නේ නෑ. මම ඉන්නවා නම් එතන ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියාස් මන්ත්‍රීතුමා අපේ පැත්තට එන්න ඇහුවනේ. උප සභාපතිතුමාලගේ ගෙදර ගියා. උප සභාපතිකම ඉල්ලුවා. කියාස් මන්ත්‍රීතුමා එන්න ඇහුවනේ. උප සභාපතිකම දෙනවානම් එනවා කිවුවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කාගෙන්ද දන්නේ නෑ ඇහුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බොරුද?, බොරුනම් නැගිටලා කියන්න බොරුයි කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** දේශපාලනය කරන කොට මෝඩ චූන් ගන්න එපා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරණයට එනකොට කිවුවේ මඩ ගහන්නේ නෑ කියලා. නමුත් දැන් සම්පූර්ණයෙන්ම මඩ තමයි යන්නේ. දැන් මේ ප්‍රාදේශීය සභාවේ මට ගහන මඩ බලන්න.

මමයි, සභාපතිතුමයි, සුගත් මන්ත්‍රීතුමයි කොළඹ ගියා පදනම් ආයතනයේ තිබුණ සම්මන්ත්‍රණයකට එතනදී කාගෙන්ද කෝල් එකක් ආවා. අපි කතා කර ගත්තා බැසිල් මහත්තයාගේ ගෙදර යනවයි, කියාස් මන්ත්‍රීතුමත් එක්ක යනවයි කියලා. අපි ගියේ පදනම් ආයතනයේ පරිසණක පාඨමාලාවකට. අර විහිළුවට කිවුවේ. සුගත් මන්ත්‍රීතුමා කිවුවා විහිළුවට කියන්න කියලා බැසිල් රාජපක්ෂ මහත්තයා හම්බ වෙන්න යනවා කියාස් මන්ත්‍රීතුමාවත් එක්ක යනවා කියලා. ඒක කාටද කොල් කරලා කිවුවා. ඒක තමයි දැන් පතුරුවන්නේ. මම පක්ෂ මාරුකරන දේශපාලඥයෙක් නෙමෙයි. ඒක හොඳට මතක තියා ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හෘද සාක්ෂිය දන්නවා නේද සුගත් මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම එක්සත් ජාතික පක්ෂයෙන් දේශපාලනය පටන් ගත්තේ. එක්සත් ජාතික පක්ෂයේ අසාධාරණකම් වෙන කොට මම ස්වාධීනව හිටියා. ස්වාධීනව දිනලා ආවා. දැන් ඉන්නේ පක්ෂයත් එක්ක. ඒක නිසා මෙතන මෝඩ චූන් ගන්න එපා. මෝඩ චූන් අරගත්තට තේරුමක් නෑ. මෝඩචූන් ටික පැත්තකට දාලා දිනවන්න මහන්සි වෙන්න.

දවසක් මම කොළඹ යනවා හයිවේ එකේ. එතකොට රමේෂ් පතිරණ මැතිතුමත් ඒ බස් එකේ හිටියා. මමයි, එතුමයි කොළඹ යනකම්ම කතා කර කර ගියා. මම කෝල් එකකුත් දීලා කිවුවා රමේෂ් මැතිතුමා ඉන්නවයි කියලා. දේශපාලඥයෝ වශයෙන් අපිට හතුරොත් නෑ මිතුරොත් නෑ. රමේෂ් මහත්තයා එක්ක මගේ කිසිම පෞද්ගලික තරහක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රාදේශීය සභා මැතිවරණය පරාජය වීමත් සමඟ ඔබතුමා අපිත් එක්ක එකතු වෙන්න බැලුවනේ. ඔබතුමා බලාගෙන හිටියේ මේකේ සභාපති වෙන්න. උප සභාපතිතුමාලගේ ගෙදර ගියා. රමේෂ් පතිරණ මැතිතුමා හමුවුණා. උප සභාපතිතුමාට යෝජනා කරේ නැද්ද?

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපි පොඩි චූන් එකක් දුන්නේ බලය පිහිටුවන්න. අපි කාටවත් කඩේ ගියේ නෑ. ඒක පෞද්ගලික කතාවක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම හිතන්නේ කතාව වෙන පැත්තකට ගියා. නමුත් එකක් තියෙනවා ඉතාම පැහැදිලිව කියන්න දේවල් ටිකක් තියෙනවා ඔබතුමාලන්ට. මම බොහොම පැහැදිලිව මේ සභා ඉතිහාසයේ මේ පහුගිය සභාවේ ඇරෙන්න හැම සභාවකම මම ඡන්දය ඉල්ලුවේ මාව සභාපති කරන්න කියලා. හැබැයි මේ සභාවේ විතරක් මාව සභාපති කරන්න ඉල්ලුවේ නෑ. පළවෙනි සභාවට එනකොට අපේ කියාස් මන්ත්‍රීතුමා ස්වාධීන

මන්ත්‍රීවරයෙක් විදියට ආවේ. ඡන්දේ ඉල්ලන කාලේ මම හැමදාම යනවා හුසේන් හජ්ජියාර් මහත්තයාලාගේ ගෙදර. ඔබතුමාගේ මාමාගේ ගෙදර. ගිහිල්ලා මම හැම තිස්සෙම කිවුවේ දිනාගෙන කොහොම හරි මේකට එන්න කියලා. ඉතිං අපි එහෙම සුහදකමක වැඩ කරේ. වැඩක් තියෙනවා මේ මැතිවරණයේදී පවා මම බොහොම පැහැදිලිව කිවුවා මුස්ලිම් ජනතාවගේ ඡන්දය ඕන. නිර්ලෝභීව මම ඉඳගෙන කිවුවා කියාස් මන්ත්‍රීතුමාව සභාපති කරන්න කියලා. මේකේ ඉඳපු හොඳම සභාපති කවුරුවත් නෙමෙයි හුසේන් හජ්ජියාර් මහත්තයා කියලා මම කිවුවා. ඒකේ යම් සත්‍යතාවයක් තියෙනවා. මම එහෙම කිවුවේ වෙන දේකට නෙමෙයි මොකද හේතුව ගියපාර සභාපතිකම ඉල්ලන්න මම නුසුදුසුයි කියලා නෙමෙයි කිවුවේ. නමුත් එකක් තියෙනවා මම ඇත්තටම බොහෝ දෙනෙක් ගැන කලකිරිලා තියෙනවා. ඒ කියන්නේ මම මේ දේශපාලනය වෙනස් කරන්න නෙමෙයි. මොකද හේතුව සමහර වෙලාවට අල්ලපු ගෙදර තියෙන දෙයක් හොරකම් කරන් යන කොට අල්ලපු ගෙදර එකා එක්ක හොඳ නැත්නම් හරි ජොලියක් යනවා. දන්නේ නෑ හැබැයි තමන්ගේ එක කොයි වෙලාවේ හරි හොරකම් කරන් යනකම් ඇවිල්ලා. ඒ වගේ මතක තියා ගන්න. අද කියනවා මම තමුන්නාස්සේලා හැමදෙනාටම මේ දේශපාලඥයෝ විදියට චණ්ඩි නෙමෙයි, ගණන්කාරයෝ නෙමෙයි. අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට කියනවා කොන්ද කෙලින් තියාගෙන තමන්ගේ දෙයක් ගොඩනගා ගන්න කියලා. ඒක තමයි මම ඉල්ලන පළවෙනි දේ. සමාවෙන්න මගෙන් වෙන වැරැද්දක් වුණා නම් ඔබතුමන්ලාට. අනිත් අයටනම් වෙන වැරැද්දක් නෑනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 31.** ලිපිගොනු අස්ථානගතවීම සම්බන්ධව කරන ලද පොලිස් පරීක්ෂණයේ විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් පොලිස් පරීක්ෂණය කරලා ඉවරයි. ඒ වාර්තාව දෙන්න පුළුවන්. අදාළ නිලධාරියෝ දෙන්නට පරීක්ෂණය ආරම්භ කරන්න තමයි පොලීසිය නිර්දේශ කරේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා ඔබතුමාට, අපි සියලු දෙනාටම තියෙනවා හෘද සාක්ෂියක්. මම ඒකයි කියන්නේ. අස්ථානගත වෙන්න බොහොම කලින් තමයි කතා කරලා ඒ ලියුම දැම්මේ මේවා අස්ථානගත වෙන්න පුළුවන් මේවා බලාගන්න කියලා. දැන් මේ කැමරා පද්ධතියක් දාන්න කියන්නේ වෙන දෙයක් නිසා නෙමෙයි. මේක යට කතාවක් තියෙනවා ඇත්තටම. කවුරු මොනවා කිවුවත් මේ ලිපිගොනුව නැතිවුණේ නෑ තියෙනවා. නමුත් එකක් තියෙනවා පොලිස් පරීක්ෂණ වලදී හරියට කරානම්, මම දන්නවා, මම කතා කරන්නේ නෑ මෙතන ඉන්න ලාල් කියන මහත්තයා එක්ක. එයා එක වෙලාවක කියනවා ඒ ලිපි ගොනුව අනුෂ්කා මිස් ගත්තා කියලා. බොහොම පැහැදිලිව කියනවා එයා ගත්තා කියලා. එහෙම කියලා ඊට පස්සේ පෙළඹවීම් වලට එහෙම කියන්න යන්නේ නෑ. එකක් තියෙනවා මේ ආයතනයේ ඇත්තටම එච්චර චෝදන තියෙද්දි ඒක මාරු කර ගන්න, ඒ විෂය මාරු කර ගන්න, මාස කීයක් අවුරුදු කීයක් ගියාද?. ඒක තමයි ඇත්ත. ඒක හින්දා මම දකින්නේ මේක අපි පෞද්ගලික දේකට බැලුවේ නෑ. නමුත් වැඩක් තියෙනවා ඉතාම පැහැදිලිව මේ අස්ථානගතවීම සම්බන්ධව පොලිස් පරීක්ෂණ අවුරුද්දක් තිස්සේ දෙන්න මොකද කරේ. අවුරුද්දට වැඩියි. අවුරුද්දට වැඩි කාලයක් මොකද කරේ පොලිස් පරීක්ෂණය. ඒ වාර්තාව මෙන්න මේකයි කියලා මීට ඉස්සර අපිට කිවුවද?. ඒ මොකද හේතුව. ඇත්තටම එකක් තියෙනවා. පොලීසියට මේක හොයාගන්න බැරිනම්, විනය පරීක්ෂණ කරලා දඬුවම් කරන්න කියලා පොලීසිය කියන්නේ. මේ කෝටි ගාණක් වටින ලියවිල්ලක් අස්ථානගත කරලා තියෙන්නේ. ඒකේ යට ගැහිල්ලක් තියෙනවා. ඒක හින්දා තමයි නැති වෙලා තියෙන්නේ. නමුත් එකක් තියෙනවා පොලීසිය පවා මේකෙදි යට වුණා මම දන්න තාලෙන්. කවුද කියන්න දන්නේ නෑ. පොලිසියට ඕක හොයා ගන්න තිබුණා. අදාළ දෙන්නගෙන් කාටහරි උසාවියේ නඩුවක් දාන්න තිබුණා. හොයා ගන්න බැරි වුණාද?. ඒවා බැලුවේ නෑ. පරීක්ෂණය හරියට කරේ නෑ. මේක තමයි සත්‍යය. ඒක හින්දා මම කියනවා පොලිස් කොමිසමට ලියන්න අවුරුදු ගාණක් කරපු මේ පරීක්ෂණය මොකක්ද කියලා. මම යෝජනා කරනවා ගරු සභාපතිතුමනි, ඒ දේ කරන්න කියලා. මොකද අවුරුදු ගාණක් යනකම් මොකක්ද මේකට කරේ. දැන් කියන්න මේකට ඕන දේ මේකයි කියලා. පොලිසියට හොයාගන්න බැරිද කවුද කරේ කියන එක. සී.අයි.ඩී. එකට දුන්නත් කමක් නෑ. ලක්ෂ 50 ට වැඩියි වටිනාකම. මේක තමයි ඇත්ත.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමාගේ යෝජනා**</u>

**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමා :- 32.** අප කාගේත් ගෞරවයට පාත්‍ර වූ ආචාර්ය රිචඩ් පතිරණ මැතිතුමා බෝපෙ පෝද්දල වරිපනම් ගෙවන ජනතාව ඕපාත මහා විද්‍යාලයට කැඳවා එවකට තිබුණු වරිපනම් බදු කිසිවක් නොගෙවන ලෙස උපදෙස් දෙන ලදී. එය එවකට ගනු ලැබූ නිවැරදි තීන්දුවකි. එම නිසා ජනතාව වරිපනම් නොගෙවා හරින ලදී. ඒ අනුව 2018 පටන් හිඟ වරිපනම් බදු මුදල් අදාළ දඩ මුදල සමඟ අයකර ගන්නා ලෙසත් කලින් ඇති වරිපනම් බදු කපා ඉවත් කරන ලෙසත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමා :-** මට මතක හැටියට 1999 දී හරි 1998 දී හරි දේශපාලන පක්ෂයක් නැතුව එතුමා කැඳවලා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව දියුණු තත්ත්වයක නොතිබුණු නිසා වරිපනම් ගෙවන එක කාටත් නවත්වන්න කිවුවා පස්සේ අපි තීන්දුවක් ගමු කියලා. ඒ කතාව නිසා හුගක් වරිපනම් ගෙවිලා නෑ බලප්‍රදේශයේ. ඒ නිසා තමයි මම යෝජනාවක් දැම්මේ 2018 වෙනකම් කපාහැරලා එතන ඉඳන් දඩ මුදල් එක්ක එකතු කරන්න කියලා. පහුගිය දවස්වල රතුබිල් ගිහින් තිබුණා තුන්දහස් ගණන් හාරදහස් ගණන්. සඟබෝවත්තේ මිනිස්සු ඇවිල්ලා කිවුවා. මේ තීන්දුව ගත්තේ ඒක නිසා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** ඒ කතාව සම්පූර්ණයෙන් නිවැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** බෑ මන්ත්‍රීතුමා. ඒකට ක්‍රමවේදයක් නෑනේ. අපි කොහොමද කියන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** වරිපනම් එකතු නොකරපු ප්‍රදේශවලත් දැන් එකතු කරනවානේ. වරිපනම් එකතු නොකරපු අපේ ප්‍රදේශවල දැන් වරිපනම් එකතු කරනවා. ඒවා අපි කියන්නේ. අනිත් ඒවා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** වරිපනම් එකතු නොකරපු කියන්නේ මොකක්ද?

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** වරිපනම් එකතු නොකරපු ගම්මාන කිහිපයක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඒ කොට්ඨාශවල සමහරු ගෙවන්නයි සමහරු නොගෙවන්නයි හේතුව මොකක්ද?.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමා :-** ඔප්පු හදාගන්න තියෙන මිනිස්සු ගෙවලා තියෙනවා. සුළු කොටසක් තව තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මුළු බෝපෙ පෝද්දලම නොගෙවන ජනතාවට එක තීන්දුවක් ගන්න ඕන. තිස්ස මන්ත්‍රීතුමා කියන්න පුළුවන් කලේගාන කොට්ඨාශයෙත් එහෙම කියලා තියෙනවා ඒවත් අඩු කරන්න කියලා. ඕක කොහොමද අපි පටන් ගන්නේ.

මම අහන දේ කියන්නකෝ. ප්‍රදේශයම ගෙවලා නැත්නම් අපිට කියන්න පුලුවන් හේතු සාධකයක් නිසා එහෙම වුණා කියලා. ප්‍රදේශයෙන් 25% ක්, 50%ක් විතර ගෙවලා නම් අපි කොහොමද අනිත් අය නොගෙවපු එක සාධාරණීකරණය කරන්නේ.

මම අහන්නේ ප්‍රදේශයකට දෙකකට කොහොමද ඕක කරන්නේ. එහෙමනම් මුළු බෝපෙ පෝද්දලටම තීරණයක් අරගෙන එහෙම වැඩපිළිවෙලක් හදන්න ඕන. අපි ඔය කොටසේ පවා ගෙවපු අයට කරන අසාධාරණයක් මේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ඔය ගෙවන්නේ වෙන කවුරුවත් නෙමෙයි. තමන්ගේ ඉඩමක් හරි නිවසක් හරි තියලා ණය මුදලක් ගන්න ගියහම වීථි රේඛා සහතික අරගන්න ඕන. ඒ අය ගෙවනවා. ඒ ඇරෙන්න වෙන අය ගෙවලා නැතුව ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** දැන් ඉතිං මමත් කැමතියි මේ යෝජනාව කරන්න පුළුවන්නම්. පොදුවේ කරන්න ඕන. උළුවිටිකේටවත්, ගොඩකන්දටවත්, හපුගලටවත් නෙමෙයි. කොට්ඨාශ දෙක තුනකට කරන්න බෑ. එතනින් මායිම් වන තව කොට්ඨාශ තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** සාමාන්‍යයෙන් නාගරික පහසුකම් තියෙන ප්‍රදේශ තියෙනවා. ප්‍රාදේශීය සභාවෙන් පහසුකම් දෙන සීමාවක් තියෙනවා. සමහර තැන්වලට යන්න පාරක්වත් නැති තැන් තියෙනවා. එහෙමත් තියෙනවානේ. කුණු එකතු කරන්නෙත් නෑ. ලයිට් එකක්වත් දාන්නෙත් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මම අහන්නේ මොකක්ද අපි ගන්න ක්‍රමවේදය. මුළු මහත් බෝපෙ පෝද්දල ජනතාවට එක සමාන වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ៖-** අදටත් වරිපනම් වලින් බැහැරව කියලා ලියුමක් නිකුත් කරනවානේ මේ සභාවෙන්. අන්න ඒ කොට්ඨාශ මොනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක අපිට තීරණය කරන්න බෑ. ඒක තක්සේරු දෙපාර්තමේන්තුව කරන්නේ. අපි දිගින් දිගට ඉල්ලලා තියෙනවා මුළු මහත් බෝපෙ පෝද්දලම එකම වරිපනම් ඒකකයක් කරන්නෙයි කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ៖-** අන්න ඒ දේ වෙන්න ඕන. දැන් එකතු කරන කොට්ඨාශත් තියෙනවා. කීපයක තමයි නොගෙවා හිටියේ. දැන් පහසුකම් ටික සමානව බෙදෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අපේ වරිපනම් එකතු වුණොත් සම්පූර්ණයෙන්ම ලක්ෂ 147 යි ලැබෙන්නේ. වාර්ෂිකව බිල් කරපුවා ලක්ෂ 147 යි. දැනට ලක්ෂ 61 ක් වත් එකතු වෙලා නෑ. දැන් ඒවත් අතඇරලා කොහොමද යන්නේ. වීථි පහන් නඩත්තුවට ලක්ෂ 30 ක් විතර ගෙවලා තියෙනවා. එතන තියෙන ප්‍රශ්නය අපි කොහොමද තීරණය කරන්නේ. උළුවිටිකේ වසම විතරක් තීරණය කරනවාද, ගොඩකන්ද වසම විතරක් තීරණය කරනවාද, කොහොමද මේක තීරණය කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ៖-** සියලුම කොට්ඨාශ වලට සම අයිතීන් ලැබෙන නිසා එකතු කරාට කිසි ගැටළුවක් නෑ. අළුතින් එකතු කරන්න කොට්ඨාශ වල දැන් හදලා තියෙනවා. ඒ කොට්ඨාශ වලටත් පරණ ඒවා එකතු වෙනවාද?, අන්න එතනයි තියෙන ගැටළුව.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** දැන් මැතිවරණයකදී විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා ගිහින් කියනවා සභාවට ඔයගොල්ලෝ සත පහක්වත් ගෙවන්න එපා කියලා. එතකොට මිනිස්සු ගෙවන්නේ නැතුව ඉඳලා තව අවුරුදු ගාණකින් ගෙවන්නේ නැති ටික ගෙවන්න කිව්වහම අහවලා ගෙවන්න එපා කිව්වා කියලා අය නොකර ඉන්නද?. මම දෙපැත්තටම නැතුව කියන්නේ. දේශපාලඥයෝ කරපු ප්‍රකාශ මත, විශේෂයෙන්ම මැතිවරණයකදී කියන ඒවා කරන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ៖-** කොයි වෙලාවකවත් ඒ දෙන්නා සංසන්දනය කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** මම කිව්වේ වර්තමානයේ එක්සත් ජාතික පක්ෂයේ ආසන සංවිධායකතුමා එතුමානේ. මැතිවරණයකදී කියන ඒවා කරන්න බෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ៖-** එහෙමනම් සභාපතිතුමා, මම කියන්නේ දෙසැම්බර් මාසෙන් පස්සේ ලබන ජනවාරි ඉඳන් එකතු කිරීම් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** අපි කොහොමද ඒක තීරණය කරන්නේ. මොන තැන ඉඳන්ද කරන්නේ

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** බදු නැති ප්‍රදේශ තිබුණනේ. ඒවාට දැන් අළුතෙන් බදු එකතු කරන්න තක්සේරු කරානේ. ඒවාට පරණ ඒවා නැතුව ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒ අයට අළුතෙන් ගන්නේ. අළුතෙන් පනවන අයට අළුතෙන්. ඒවාට හිඟ තියන්නේ නෑ. මෙතන ප්‍රශ්නය තියෙන්නේ ප්‍රකාශයක් කරා කියලා, ඕපාතේ ඒකාලේ ඉඳන් නොගෙවා ඉඳපු ඒවා ගන්න එපා කියලා නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ៖-** ඒ ප්‍රකාශය කරපු නිසා හිඟ ඒවාද තියෙන්නේ. එහෙමනම් අසාධාරණයි. ඒ අයට සහනයක් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජස්ටින්කන්දේ අය කිවුවොත් අපිටත් ප්‍රකාශ කරා. අපි ගෙව්වේ නැත්තේ ඒ හින්දා කියලා, එතකොට කාසල්හිල් එකේ අයත් කියනවා අපි ගෙව්වේ නැත්තෙත් මේ ප්‍රකාශය හින්දා කියලා. මැතිවරණ වේදිකාවේ කියන්න ඇති දිගටම ඕක. අපිට මැතිවරණ වේදිකාවක කියපු එකකට සභාවේ බදු නිදහස් කරන්න පුළුවන්ද?. මමත් කැමතියි. ඕක රිචඩ් පතිරණ මැතිතුමා කියද්දි අහන් ඉන්න ඇත්තේ අපේ මිනිස්සු. අපිට ඡන්දේ දීපු මිනිස්සු තමයි අහන් ඉන්න ඇත්තේ. මමත් කැමතියි සභාපති විදියට කරන්න පුළුවන්නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඕපාත රාහුල විද්‍යාලයට රිචඩ් පතිරණ මහත්තයා මිනිස්සු කැඳවලා ඕක කිවුවේ. මැතිවරණ වේදිකාවක නෙමෙයි කිවුවේ. ඕපාත රාහුල විද්‍යාලයට, ගොඩකන්දේ සංස්කෘතික මධ්‍යස්ථානයට කැඳවලා කිවුවේ. සාධාරණ දෙයක් කරන්න. මම එපා කියන එක නෙමෙයි කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද අපි මේකට ගන්න නිර්ණායකය. මුළු බෝපෙ පෝද්දලම නිදහස් කරනවාද?. එහෙම කොහොමද කරන්නේ. එතකොට ඔක්කොම අතඅරින්න වෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සම්පූර්ණයෙන්ම අරගෙන බැලුවහම ලොකු මුදලක් තියෙනවා. ඒ පාර ඒක ගෙවන්නෙම නෑ. නැත්නම් වාර්ෂිකව අපිට ගෙවන ක්‍රමවේදයක් හදා ගන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** රුපියල් තුන්දාහට වැඩිය කාටවත් නෑ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** තියෙනවා. මම ගාවට ආවා කීපයක්ම. ලොකු මුදල් තියෙනවා. 8100.00 ක් තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් ව්‍යාපාරිකයෙක් නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අටදාස් ගණන් තියෙනවා. අන්න එතනැයි අසාධාරණය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තට්ටු දෙකේ තුනේ මහා පරිමාණ ගෙවල් වෙන්න ඇති. සාමාන්‍ය මනුස්සයෙකුට නම් උපරිමය එන්න පුළුවන් රුපියල් 3000 යි. අපි මෙහෙම කරමු. සභා තීන්දුවක් ගමු වාරික වශයෙන් ගෙවන්න හරි එහෙම ක්‍රමයක් හරි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙම සහනදායි ක්‍රමවේදයකට යන්න. මොකද මේ තත්ත්වය තුළ මේ අවුරුද්දට ගෙවිය යුතු එකවත් ගෙවන්න මිනිස්සු පෙළඹෙන්නේ නෑ. ලොකු මුදලක් තියෙනවානේ. වර්තමානයේ තියෙන එකවත් ගෙවන්න පෙළඹෙන්නේ නෑ ලොකු මුදලක් ගෙවන්න තියෙන නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැනටත් පුළුවන් කොටස් වශයෙන් ගෙවන්න. ඇවිල්ලා සාකච්ඡා කරන්න කියන්න. ඒ අනුව කටයුතු කරමු. රුපියල් 500, 500 ගෙවන්න කියන්නකෝ. ඒ යෝජනාවට කොටස් වශයෙන් ගෙවීමට එකඟතාවය ලැබෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සුභ දවසක් සියලු දෙනාටම, ගරු සභාපතිතුමනි මම මේ වෙලාවේ මේ සභාවට යෝජනා කීපයක් ඉදිරිපත් කරනවා වගේම පහුගිය සභාවේ යෝජනා කිහිපයක් ඉදිරිපත් කරා. අධික වර්ෂාව නිසා පැමිණීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. නමුත් යෝජනා ටික සම්මත වෙලා තිබුණා. ඒ යෝජනා සම්මත කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. එතනදී ගරු සභාපතිතුමනි මට කියන්න තියෙන්නේ මම යෝජනා කරා බෝපෙ පෝද්දල උප කාර්යාලයේ ප්‍රීමික්ස් ව්‍යාපෘතිය සම්බන්ධව අඩුපාඩු වගයක්. ඔබතුමා මැදිහත් වුණා ඒ සම්බන්ධයෙන්. ඒක කරලා තිබුණා. ප්‍රිමික්ස් හදන තැන ප්‍රීමික්ස් අනන්න ඉඩ මදි. තව තහඩු සහ අවශ්‍ය උපකරණ අවශ්‍ය ප්‍රමාණයට ලැබුණේ නෑ කියලා කිවුවා. ඒකට අවධානය යොමු කළොත් හොඳයි. ඒ ඉල්ලීම කරන්නේ හේතු ගණනාවක් එක්ක. ඒ තියෙන පොඩි ඉඩේ කරන කොට වාහන දෙකක පටවන එක කරන්න දෙපාරක් යනවා. තව තහඩු කැල්ලක් දුන්නා නම් ඒ දෙකම එක පාර කරන්න පුළුවන් ඒ සේවක ප්‍රමාණයම මැදිහත් වෙලා. මම හිතන්නේ ඒ ඉල්ලීම කාලෝචිතයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක ඇත්තටම ආදර්ශ ව්‍යාපෘතියක් හැටියට පටන් ගත්තේ. ඉතාමත්ම සාර්ථකයි. තියෙන අඩුපාඩු ටික හදාගෙන ලබන අවුරුද්දේ ඉඳලා සාර්ථකව ක්‍රියාත්මක කරනවා. මූල්‍යමය තත්ත්වය පිළිබඳ ගැටළුවක් තියෙනවා. ඔබතුමාගේ යෝජනා ගිය සභාවේ සම්මත කරලා තියෙන්නේ. අඩුපාඩුවකට තියෙන්නේ තව තහඩුවක අවශ්‍යතාවය. ඒවට මිල ගණන් කැඳවලා තියෙන්නේ. ඒ ටික සම්පූර්ණ වෙනවා මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට තියෙන ප්‍රශ්නය තමයි පාරේ තියෙන කඩතොලු ගොඩක් විශාල වුණාම තමයි ගිහින් අළුත්වැඩියා කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි යෝජනා කරේ, පටන් ගත්තේ ඒකට තමයි. පාරක් කඩන කොටම එතනට දාන්න. දැන් ක්‍රියාත්මක වෙන්නේ වෙනත් ක්‍රමයක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** විශාල කඩතොලු ප්‍රමාණයක් ඇති වුණාම තමයි ඒක යොදවන්නේ. ඒකෙන් වෙන අලාභය වැඩියි. අපි ක්‍රමවේදයක් සකස් කර ගන්න එක හොඳයි ඉස්සරහට ඒක විධිමත් කර ගන්න. එතකොට අපිට ප්‍රීමික්ස් අඩු ප්‍රමාණයකින් ඒ අළුත්වැඩියාව කර ගන්න පුළුවන්. මේ සභාවේ කරපු යෝජනා දෙකක්ම තියෙන්නේ ප්‍රීමික්ස් දාන ඒවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අනන්න බෑ. අනලා දාලා වැඩකුත් නෑ. වැස්සේ දාපු ගමන් ආයෙම ගලවන් යනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** වතුරෙ නම් දාන්න බෑ. වැස්ස ටිකක් අඩු වුණාම පුළුවන්. හැමදාම එක දිගට වහින්නේ නෑ.

**33.** නරාවල, මුලන ජනපදයේ සිට පන්විල පාරට සම්බන්ධවන අතුරු මාර්ගය අබලන් වී ඇති බැවින් ප්‍රීමික්ස් යොදා වහාම පිළිසකර කිරීම සඳහා යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 34.** නරාවල ඒ.කේ. රංජි මහතාගේ නිවස අසලින් ගලා බසින ඇළ මාර්ගය අවහිරවීම නිසා වැසි ජලය පිටාර ගලා එම මාර්ගය සහ මුලන මාර්ගය වතුරට යටවී ගමනාගමනයට හා නිවැසියන් අපහසුතාවයට පත්වී ඇති අතර වහාම ඇළ මාර්ගය සුද්ධ කොට පහසුවෙන් ජලය බැස යාමට සැලැස්වීම සඳහා බැකෝ යන්ත්‍රය යෙදවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමත් ඒ ඇළ මාර්ගය බලන්න ගිහින් තිබුණා. ඒ ඇළ මාර්ගය අපි දන්න කාලේ ඉඳන් පළලට දිගට තිබුණා 6 කණුව ගාවට වෙනකම් සම්බන්ධ වෙමින්. නමුත් දැන් අතරමැදි තැන් වලින් ඒක වැහිලා, පටු වෙලා වතුර ගලා බහින්නේ නැතුව පාරටත් උඩින් වතුර දානවා. පාර යට වෙනවා අධික වර්ෂාවේදී නිතරම. මට කියන්න තිබුණේ ඇළ මාර්ගය පුළුල් කරලා පිළිසකර කරලා දෙන්න අපිට පුළුවන් වෙයි බැකෝ යන්ත්‍රය යොදලා. ඒ කටයුත්ත කරන්න. ඒකට ඔබතුමා මැදිහත් වෙන්න. එතුමා ඉල්ලීම් කරපු ලිපිය මම යොමු කරා. එතුමා කලින් ලිපියක් සභාවට යොමු කරලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒකට කම්කරුවෝ යොදවලා අවහිරතාවය ඉවත් කරන්න කටයුතු කරනවා ළඟදීම.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ- 35.** අබලන්ව ඇති මීපාවල ඉසුරු මාවත ප්‍රීමික්ස් යොදා වහාම පිළිසකර කරදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකට අපි ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගන්න වැඩ කරනවා නම් හරි. එහෙම නැති වුණොත් වැස්ස එක්ක පාරවල් දිගට කැඩී කැඩී ගිහිල්ලා විශාල කඩතොලු

ප්‍රමාණයක් වෙලා මීට වැඩිය අලාභයක් ඉදිරියේදී සිදු වෙනවා. ප්‍රීමික්ස් ව්‍යාපෘතිය මේ මොහොතේ ක්‍රියාවට නගන්න බැරි හේතුව මොකක්ද?. ප්‍රීමික්ස් ව්‍යාපෘතිය අතරමඟ නතර වෙලා තියෙන්නේ දැන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** විශේෂයෙන් වර්ෂා කාලයේ. එකපාරක් කරපු පාර ඊට පස්සේ වැස්සහම ප්‍රීමික්ස් ඔක්කොම ටික හෝදගෙන යනවා. හයිවෙන්නවත් වෙලාවක් වෙන්නේ නෑ. වතුර පාරවල් එන පාරවල් තමයි ඔය තත්ත්වයට පත්වෙලා තියෙන්නේ. පාර මැදින් වතුර ගලන ඒවා තමයි ඔහොම වෙලා තියෙන්නේ. ඒකෙදි ප්‍රීමික්ස් දාලා ඉවර වෙන කොටම වැස්සොත් ඉවරයි. ආම්ටේජ් හිල් පාර එහෙම වුණා. එතනදී කරලා එන්න හම්බවුනෙත් නෑ සම්පූර්ණයෙන් ගලවන් ආවා. ඒ නිසා සම්පූර්ණයෙන් පායලා ඉවර වුණහම කරනවා. දැනට මිල ගණන් කැඳවලා තියෙන්නේ අවශ්‍ය අමුද්‍රව්‍ය වලට. ඒ විදියට තමයි කරන්න වෙන්නේ. නිරන්තරයෙන්ම එක පාර දෙතුන් පාර ප්‍රීමික්ස් කරන කොට විගණනයට ලක්වෙනවා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා :-** යෝජනා අවසන් නිසා පොඩ්ඩක් කතා කරන්නේ. මාධ්‍යවේදී මහත්වරුන්ට දැනටත් ලියුම් යන්නේ නැහැලු. සභා වාර හතරකට උඩදී අපි කතා කරා. ලියුම් යවන්න කියන ඉල්ලීම කරා. අද වෙනතුරු ඒ කාර්යය සිදු වෙලා නෑ. ඒ සඳහා අවධානය යොමු කරන්න. ඒක දවසින් දවස කල් යවන්න එපා. සභාවකින් එන යෝජනා වලට ගෞරවය කෙළසීමක් ඒවාට කිසිම පිළිවෙලක් යොදන්නේ නැත්නම්. ඒ කාරණයට නැවත අවධානය යොමු කරන්න. ඊළඟ සභාවේදී මේ කාරණය මතු වෙන්න ඉඩ තියන්න එපා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** මම හිතන්නේ ගරු සභාපතිතුමා ඒක දුරකථනයෙන්වත් මාධ්‍යවේදීන්ට දැනුම් දීලා තිබුණේ නෑ. ඒ හින්දා ඒකට කඩිනමින් පියවරක් ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මතක් කරනවා අපේ සභාව උඩ තාම සුදු පිරුවටයක් තියෙන්නේ. ඒක හින්දා ඒකත් කඩිනමින් සකස් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** තාවකාලික පිළියමක් යොදලා තියෙන්නේ. වර්ෂාව නවතින්න ඕන. ලොකු අළුත්වැඩියාවක් තියෙනවා කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී ලිපියක් යොමු කරලා තිබුණා නඩුවක් තියෙන ඉඩමක ප්‍රශ්නයක් එක්ක. එම්. අයි. එෆ්. ෆරීනා මහත්මිය සභාවට යොමු කරලා තියෙනවා. මට පිටපතක් තියෙනවා. මේ සම්බන්ධව යම් ක්‍රියාමාර්ගයක් අරන් තියෙනවාද කියලා මම දැන ගන්න සතුටුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** තුන හතරක්ම ඉදිරිපත් කරලා තියෙනවා. මොකක්ද දන්නේ නෑ ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** එම්. අයි. එෆ්. ෆරීනා මහත්මිය හා එම්. අයි. එෆ්. නිසාම්දීන් මහත්මයා යොමු කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මොකක් සම්බන්ධවද?.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** උසාවි නඩු තීන්දුවක් තියෙනවලු. ඒකට එරෙහිව සභාව ක්‍රියාමාර්ග අරන් තියෙනවලු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මොකක් සම්බන්ධවද? එතුමාගේ පාර සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා. කුණු දැමීම සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා. ගසක් සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා. ඒ වගේම ගස් කීපයක් අල්ලපු ගෙදරට වැටිලා ඒකට අපි යනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** මේ සම්බන්ධව මේ වන විට තත්ත්වය මොකක්ද? පොඩ්ඩක් පැහැදිලි කරනවානම් හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** ඔබතුමා ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද?

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** බලප්‍රදේශයේ පුද්ගලයෙක් කරදරයට ලක්වෙලා ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ ඉල්ලීම සම්බන්ධයෙන් අධිකරණ තීන්දුවකට එරෙහිව අපි කටයුතු කරලා

තියෙනවා කියලා කියනවා. මට දැන ගන්න අවශ්‍යතාවය තියෙන්නේ මේ ඉල්ලීම හා මේ වෙන විට මේ ප්‍රශ්නයට මැදිහත්වීමේ තත්ත්වය මොකක්ද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම පැහැදිලි කරාම ඔබතුමන්ලාට ඒක පැහැදිලි වෙනවා. ඇත්තටම ගරු සභාපතිතුමනි, ඉන්දික විජයවික්‍රම මැතිතුමා මතුකරේ අරලිය වත්තේ ප්‍රශ්නය. මේ ප්‍රශ්නයේදී ඇත්තටම බොහොම පැහැදිලිව නඩුකාරයා ක්ෂේත්‍ර පරීක්ෂාවක් කරලා පාර ලකුණු කරලා දීලා ගියේ. ඒකේ තමයි කණු ගහල තියෙන්නේ. අද වෙනකොට බොහොම පැහැදිලිව ඒ ඉක්රම්ට හරි ෆරීනාට හරි කිසිම අයිතියක් නෑ. කිසිම භූමියක අයිතියක් නෑ. ඊළඟට මේ පහුගිය දවස්වල ඔබතුමා දන්නවා ප්‍රතිපාදන ගෙනල්ලා යසරත්න මන්ත්‍රීතුමා වැඩ කරන්න හදනකොට අපි සියලු දෙනා එතනට ගියා. පොලීසියේ නිලධාරීන් සම්බන්ධ වුණා. අපි සම්බන්ධ වුණා. සියලු දෙනා එතනට ගිහිල්ලා ඉඳගෙන කිව්වා දින කිහිපයක් ඇතුළත පාර ලකුණු කරලා දෙනවා කියලා. සල්ලි අහක යනවා නැත්නම්. දැන් ආණ්ඩුවෙන් පාර ලකුණු කරලා භාර දීලා ඉවරයි. අඩි 10 පාර. ඒකේ තිබුණ කොස් ගහ තමයි පහුගිය කාලේ කපලා දැම්මේ. එතකොට වැඩේ තියෙන්නේ ඒ පාර භාර දීලා ඉවරයි. මම අනන්ත කිව්වා මේ පාර සකස් කිරීම නතර කරන්න එපා කියලා. අපිට තියෙන්නේ නීතිඥයෙක් මගින් ඒගොල්ලන්ට කියලා අරින එක. බොහොම පැහැදිලිව කරන්න තිබුණේ ඒක. මේ පාර අපි දානවා. වෙනසක් වුණොත් එහි අලාභය දරා ගෙන අපි වැඩ කරනවා. මොකද හේතුව මේ කියන කියන පාරට මේකේ අයිතියකුත් නැති, කිසිම භූමියක අයිතිය නැති කෙනෙක් මේ. එහෙම තියෙද්දි ඇත්තටම මේ වගේ වැඩ කරන කොට සභාවක් විදියට මෙහෙම වෙන්න එපා. මේ පාරේ යන අය විඳින දුක ඔබතුමන්ලා ගිහින් බලාගන්නකෝ. නඩු පටලවලා දාලා කියලා නිකං බය වෙනවා.

( ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි කාටවත් නීතිය ක්‍රියාත්මක කරනවානම් ගන්න බෑ. අධිකරණයේ තීන්දුවක් තියෙනවානම් ඒක කියවලා බලලා ක්‍රියාවට නගන්න. කාටවත් බය වෙන්න වුවමනාවක් නෑ. මම කියන්නේ සභාවට. සභාවේ තීන්දුව පොදු තීන්දුවක් වෙන්න ඕන. ඒක තමයි ක්‍රියාත්මක වෙන්න ඕන. මම ඇහුවේ මේ ඉදිරිපත් වෙච්ච ලියවිල්ලට සභාවක් හැටියට ගනිපු ක්‍රියාමාර්ග මොනවද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතික්ෂේප කරපු එකක්. අපි තව ඇස්තමේන්තුවක් හදලා ඒ කර්මාන්තය සභා අරමුදලින් කරන්න හිටියේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාව වගකීම ගත්තා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි සල්ලි හරි ගෙනත් දෙන්නම්. ඒ පාර කරන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ පාරක් තියෙනවයි කියලා සභාව පිළිගන්නවාද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** නැත්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පාරක් තියෙනවා කියලා පිළිගන්නවා නම් මේ පාර සභාවේ වගකීමක් හැටියට සළකනවා වගේ. ඒ මාර්ගයේ නිරවුල්භාවය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා නම් ඒක අපි ගන්න ඕන නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හින්දා තමයි අපි කොස් ගහ කැපුවේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පාරේ ප්‍රමාණය ගැන අදහසක් තියෙනවාද?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පළල අඩි 10 යි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ පාර මේ මොහොතේ භෞතික වශයෙන් පවතිනවාද?.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** තියෙනවා. ඔබතුමා ගිහින් බලන්න. භෞතික වශයෙන් පවතිනවා. යන්න බෑ මනුස්සයෙකුට තියා බල්ලෙකුට. නිකං ඇළ පාරක්, දොළක් වගේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක සම්පූර්ණ කරන්න වගකීමක් අපිට නැද්ද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරද්දී තමයි ඔය ලියුම එන්නේ. දැන් ඔබතුමා ඉදිරිපත් කරන්නේ ඒකට විරුද්ධව.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** යොමු කරපු ලියුම ගැන මම ප්‍රශ්න කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඇස්තමේන්තු හදලා කර්මාන්තය කරන්න බලාපොරොත්තු වෙනවා. ඕක පිළිබඳව අපිට තීන්දුවක් ගන්න වෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙයා කියන්නේ ඒ පාර තව කෙනෙක් විසින් වහලා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** භුක්තිය භාර නොදීපු ප්‍රශ්නය තියෙන්නේ දැන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** භුක්තිය භාර දීලා තියෙන්නේ බොහොම පැහැදිලිව. මායිම්වල කිසි ප්‍රශ්නයක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අධිකරණයෙන් අපිට භුක්තිය භාර දුන්නා කියලා ගෙනත් දෙන්නම්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගෙනත් දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඕකේ තියෙන්නේ භුක්තිය භාරදුන්නේ නෑ කියලා නේද?.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** වෙනත් පාර්ශවයකින් අත්පත් කර ගෙන ඉන්නවා. ඒක නිරවුල් කර ගන්නකම් කරන්න එපා කියලා තියෙනවා. අපිට ඒ දෙපාර්ශවයේම කතා අදාළ නෑ. හැබැයි මෙහෙම එකක් තියෙනවා. සභාපතිතුමනි, ගම නැගුම හරි වෙනත් ව්‍යාපෘතියකින් හරි සල්ලි එනවා නම් ඒක කරන්න. අපි අරලිය වත්තට මේ සභාවේ අහිත් මිනිස්සුන්ගේ බදු වලින් කීයක් වියදම් කරනවාද?. මාසෙකට රුපියල් හැත්තෑපන්දහසකට වඩා යනවා අරලිය වත්තේ නඩු වලට. අනෙක් කොට්ඨාශවල මිනිස්සුන්ගෙන් එකතු කරන බදු මුදල් මේ. ඒකටම තියෙන පාරත් හදලා අරලිය වත්තේ මිනිස්සුන්ගේ ප්‍රශ්නය විසඳුවහම ඉවරයි. ඔය නඩු කටයුතු ටික ඉවර කරලා සමාදාන වෙනකම් තව සල්ලි යොදවන්න එපා කියලා මම කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකේ නීතිමය තත්ත්වය විසඳගන්න බලමු. දැන් අධිකරණයෙන් විසඳුම ගන්න ඕන. මෙයාලා කියන්නේ භුක්තිය භාර දීලා නෑ කියලා. අපිට භුක්තිය භාර දුන්නහම නීතිමය පැත්ත බැලුවම හරි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමා ඃ-** එතන මායිම් ප්‍රශ්නයක් තියෙන්නේ දැන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවේ මායිම්වල කිසි වෙනසක් නෑ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමා ඃ-** දැන් නඩුවක් දාලානේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ප්‍රදේශයේ පාරක වගකීම සභාවට තියෙනවා. ඒක පිළිගන්නවානේ. මාර්ගය නිරවුල්ව පැහැදිලි කර ගන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී යසරත්න මැතිතුමා ඃ-** ඒක හරි. ඒ අය කියන්නේ තාප්ප බැඳලා තියෙන්නේ පාරේ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකේ නීතිමය තත්ත්වය පිළිබඳ වෙනම බලමු. ඊළඟ සභාවේදී ඕකට උත්තරයක් දෙන්නම්.

<u>**(ඊ) කාරක සභාවල වාර්තා**</u>

<u>**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව.**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2019.10.10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි කමිටුවලට විරුද්ධයි. බෙදීමක් ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් 2019-10-10 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා බෙදීමකට යනවා.

ඉන්පසු ඡන්ද විමසීම ආරම්භ වූ අතර ඡන්දයේ ප්‍රතිඵලය පහත පරිදි විය.

පක්ෂව - 13

විපක්ෂව - 07

ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි - 01

සභා ගර්භයේ රැඳී නොසිටි - 01

**2019-10-10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා පක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
04. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
06. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
08. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
11. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
12. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
13. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**2019-10-10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා විපක්ෂව ඡන්දය ලබා දුන් පිරිස**

01. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
05. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
06. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
07. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**2019-10-10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය ලබාදීමෙන් වැළකී සිටි පිරිස**

01. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා

**2019-10-10 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව සම්මත කිරීම සඳහා ඡන්දය විමසීමේදි සභා ගර්භයේ රැඳි නොසිටි පිරිස**

01. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019-10-10 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා සැකසුම් කමිටු වාර්තාව වැඩි ඡන්ද හයකින් සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව** :- නැත

**03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව** :- නැත

**04. පරිසරය සහ පහසුකම් කමිටුව** :- නැත

**(ඌ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

04. වෙනත් ලේඛන

I. ප්‍රගතිය

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2019 වර්ෂයේ ඔක්තෝම්බර් මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කැමතියි දැන ගන්න කාරණා කිහිපයක් සම්බන්ධව කමිටු පත්කරගෙන සාකච්ඡා කිහිපයක් අරන් ගියා. එකක් පෙර පාසල සම්බන්ධයෙන්. ඒකට අපිට ඉදිරි ක්‍රියාමාර්ග ගන්න බැරිද කියලා දැනගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එස්. ඕ. එස්. එකද,

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔව්

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක එතනින් එහාට යන්න බෑ. පළාත් පාලන දෙපාර්තමේන්තුව ඒ පිළිබඳව එකඟතාවයක් නෑ. මේකත් හරියට කර ගන්න ඕන. තව බාහිර දේකුත් අරගෙන කරගන්න බෑ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ගැන එතනින් එහාට සභාව දැනුවත් වුනේ නෑ. ඒකේ තත්ත්වය පිළිබඳ අපිට පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

ඊට පස්සේ කමිටු පත්කර ගත්තා. ඒවා හරියට කැඳෙව්වේ නෑ. පරිසර කමිටු, පුස්තකාල කමිටු, පුස්තකාල සම්බන්ධයෙන් මට පොඩි ප්‍රශ්නයක් තියෙනවා. සාහිත්‍ය මාසය අවසන් වුණා. සාහිත්‍ය

මාසය අවසන් වෙන කොට සභාවක් හැටියට අපි අපේ ප්‍රදේශයේ පුස්තකාල පරිහරණය කරන සිසුන්ගේ හා වෙනත් පුද්ගලයන් වෙනුවෙන් ගනිපු ක්‍රියාමාර්ග ගැන කතා කළ යුතුයි. පුස්තකාල සම්බන්ධයෙන් කමිටුවක් පත්කර ගත්තා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒ පිළිබඳව කමිටුව කැඳවන්නම් සාකච්ඡාවකට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි අයවැයෙන් මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබුණා මේ වර්ෂයේ පුස්තකාල සඳහා පොත්පත් මිලදී ගැනීමට. රුපියල් ලක්ෂ තුනක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් ඒ කමිටුවේදී සාකච්ඡා කරමු. තුන් ලක්ෂ ගාණක පොත් අපිට ලැබිලා තියෙනවා. තව ලක්ෂයක් විතර වියදම් කරා. තව ලක්ෂයක මුදලක් ඔය සඳහා යොදවන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** තුන් ලක්ෂ ගාණක පොත් ලැබුණා කිවුවහම මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා. මේක සභාවේ කවුරුත් ඉන්න තැන පැහැදිලි කර ගත්තොත් හොඳයි. අපිට ලැබුණු පොත් සියල්ල පාඨක සමාජය, පුස්තකාලාධිපතිවරුන් ඉල්ලපු පොත් ලැයිස්තුව අනුව නෙමෙයි ලැබුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමියලා තෝරපු පොත් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එයාලා ඉල්ලීම් කරපු ලේඛනය අනුව නෙමෙයි ලැබුණේ. ලේඛනයක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ ලැබුණු පොත් ලේඛනයේ තිබෙන පොත්ද කියලා ගැටලුවක් තියෙනවා. අපිට රුපියල් ලක්ෂ තුනක මොනවා හරි ගෙනත් දුන්නා කියලා වැඩක් නෑනේ. දෙන්න ඕන අවශ්‍යතාවය අනුවනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තියෙන්නේ එයාලා ගිහින් තෝරලා ගෙනාපුවානේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ තියෙන්නේ මහ ඇමතිතුමාගෙන් ලැබුණ පොත්පත්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය කමිටුවක් දාලා තේරුවේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සාහිත්‍ය සම්මානලාභී පොත් පත් ලැබිලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කමිටුවේ හය දෙනෙක් හිටියා. අපේ පුස්තකාලයාධිපති එක්කෙනෙක් ඒ කමිටුවේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉදිරිපත් කරපු ලේඛනයේ තිබෙන පොත්පත් නෙමෙයි ඔක්කොම ලැබිලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉල්ලපු සියලුම දේ ලැබෙන්නේ නැතුව ඇති. නමුත් ලැබුණේ ඉල්ලපුවා. ඔය කාරණා දෙකට අපි කමිටුවේදී කතා කරමු. සාහිත්‍ය උත්සවය පිළිබඳවයි. මේකයි. පුස්තකාල කමිටුවක් කැඳවන්නම්.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, එම්. කේ. දිසානායක මහතා අනතුරුදායක ගස් පිළිබඳව කටයුතු කිරීමේදී අක්‍රමිකතාවයන් රාශියක් සිදු වී ඇති බවට ලිපියක් ලබා දීලා තියෙනවා. ඒකට ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ඒ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ලියාපදිංචි තැපෑලෙන් එවලා තියෙනවා. කොස් ගසක් සම්බන්ධව ප්‍රාදේශීය සභාවේ ගැටළුවක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක තුළ සභාපතිතුමා ක්‍රියාකරලා තියෙන විදිය වැරදියි. සභාව පිළිකුලට ලක්වෙනවා. ඒ කියන්නේ ඒක බලලා කියනවා ගස් තුනක් කපන්න තියෙනවා කියලා. අනිත් වෙලාවේ කියනවා එක ගහක් කපන්න. ඊළගට අපේ හිටපු මන්ත්‍රීතුමාගේ

ගෙදර ගස් ටික කපන්න යනවා. එතුමා ලංකාවේ ඇත්තෙත් නෑ. මේවා කරාම සභාව විහිළුවට ලක්වෙනවා.

( ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවීම හා ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අබේසේකර මන්ත්‍රීතුමා මෙහෙමයි. ඕක දෙපාරක් මම නැවැත්තුවා. නැවැත්තුව හේතුව තමයි පළවෙනි වෙන්දේසිය ග්‍රාම නිලධාරිවත් දැනුවත් නෑ. ඔක්කොම ගස් ටික වෙන්දේසියේ ගියාට පස්සේ මම නැවැත්තුවා. නවත්තලා නැවත වෙන්දේසියට දැම්මා. එතකොට අනතුරුම ගහක් තිබුණා මුල දිරලා. ඒකට ඕකිඩ් බේකරියේ පාර ඉඩම කියලා දැම්මේ. ඒකත් නැවැත්තුවා. ඒ අදාළ අය කිව්වා මේ නඩුවට 16 දෙනෙක් ඉන්නවා කියලා. හැබැයි අන්තිම පාර ක්‍රියාත්මක කරපු එක හරි. අන්තිම පාර කපපු එක හරි. මේ අයිරාංගනි මහත්මිය බලාපොරොත්තු වෙන්නේ මේක නොකරන්න. නමුත් මම පුද්ගලිකව ගිහින් බැලුවා. ගහේ මුල සම්පූර්ණයෙන්ම දිරලා තියෙන්නේ. ඒ කිට්ටුව ගස් දෙකක් වැටුණා. මේක වැටුණා නම් මට සම්පූර්ණ වගකීම ගන්න වෙන්නේ. ගස් තුනම අනතුරුදායකයි. අනතුරුදායක බව වැඩිම ගහ කපන්න තීරණය කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ප්‍රශ්නයක් නෑ. මේක විහිළුවක් වෙනවානේ. මේ යන නිලධාරීන් මොකක්ද කරේ කියන එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නිලධාරීන්ට අවශ්‍ය ගස් තුනම කපන්න. මට අවශ්‍ය එක ගහක් කපන්න. ඇත්ත කතාව ඒක. මොකද මම දකිනවා එතනින් අනතුරුදායක බව වැඩිම එක ගහයි තියෙන්නේ. ඔය ප්‍රශ්නය මතු වෙනකොට ගස් තුනම කපන්නේ නැතුව එක ගහක් කපපු එක හොඳයි. ඒ අය බලාපොරොත්තු වුනේ අර මිනිහගේ ගේ උඩට ගහ වැටෙන්න දීලා වැඩේ ඉවර කර ගන්න. මාස හතක් උත්සාහ කරා මේ ගස් කපන්න. මාස හතකට පස්සේ මේ කැපුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අමතක නොකර අර පොල් ගහත් කපලා දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකත් කපලා දානවා. අදාළ පාර්ශවය කියනවා ගහ කපලා දානකන් හැංගිලා බලන් හිටියලු. ඔය ගිය ගාණ හරි නැහැලු. එයාලත් ඉල්ලන්නලු හිටියේ. එයාලා දැන් ගන්නන්ලු ඊට වැඩි ගාණකට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාවේ වැඩේ ගිහින් හරියට කරා නම් මේ ප්‍රශ්න එන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හරි. දෙපාරක් වැඩේ විනාශ කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මට දැන ගන්න ඕන සිරිධම්ම විද්‍යාලයේ රාජකපුරු කියලා නාට්‍යයක් වේදිකා ගත කරනවා. මේ සඳහා අවසර ලබාගෙන තියෙනවාද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නාට්‍යවලට විනෝද බදු ගෙවන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි සීල් කරන්න ඕන නැද්ද?. අවසර ගන්න ඕන නැද්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නාට්‍ය වලට ගන්න ඕන නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකේ බොහොම දරුණු ගණයේ කතාවක් යන්නේ. ඉස්කෝලේ ළමයින්ව පට්ට ගහන කතාවක් යන්නේ. අද වෙනකොට බැනර් දාලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බැනර් වලට අය කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ කාරණයට ළමයින්ගෙන් රුපියල් දෙසීය ගානේ අර ගන්නවා. මේකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන්වත් අවසර අරගෙන නෑ. ඒක තමයි ඇත්තම තත්ත්වය. ඉස්කෝලේ විදුහල්පති කට්ටියත් එක්ක එකතු වෙලා කරන ව්‍යාපාරයක් මේක. අනිවාර්යයෙන්ම ගන්න ඕන. වේදිකා වාර තුනක් හතරක් තියෙනවා. නාට්‍ය වලට ගන්නේ නෑ කියන නිර්ණායකය තියේ නම් අපිට කරන්න දෙයක් නෑ. වැඩේ තියෙන්නේ "රාජකපුරු" පෙන්වන්නේ ළමයින්ට හිනා වෙන්න. හුණුවටයේ කතාව පෙන්නුවනම් ළමයින්ට වටිනවා.

ඊලඟට ගරු සභාපතිතුමනි, අනවසර ඉදිකිරීම් හා අනවසර ගොඩ කිරීම් වලට ගනිපු ක්‍රියාමාර්ග ගැන කියන්න. අර ඇක්සස් වෙන්දේසි ඉඩම, වතුර ටැංකිය පාරේ වෙන්දේසි ඉඩම. ඒක ඉතාම නරක විදියට දීලා තියෙන්නේ. මධ්‍යම පරිසර අධිකාරියෙන් ඒකට අවසර අරගෙන නෑ. ඔබතුමන්ලා ඒ විස්තර ගත්තේ නැතිවුණාම මම අන්තිමට ගත්තා. පහළ තියෙන වෙල ගොඩ කරලා. ඒකට අවසර අරගෙන නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට විගණන දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණයක් යනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** විගණන දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණයක් යනකොට ඇයි අපිව සම්බන්ධ කර නොගත්තේ. ඒ ඉඩමට මධ්‍යම පරිසර අධිකාරියෙන් අවසර ගන්න ඕන. නැත්නම් බෝපෙ පෝද්දල කිසි ඉඩමක් නෑ අවසර ගන්න ඕන. බොහොම පැහැදිලිව තොරතුරු පනතින් ගනිපු තොරතුරු එක්ක පහළ තියෙන වෙල් කැල්ල සඳහන් කරලා නැති නිසා ඒක අරගෙන නෑ කියනවා. දිගින් දිගටම කියලා තියෙන්නේ වරලත් ඉංජිනේරුවරයෙකුගේ සහතිකය ගන්න එක මහා කුණුහරුපයක්. පැතුම් උයන බලන්න යන්න පුළුවන්ද කියලා. සිලින්ඩර් කැඩිලා. ඊරියගහදූව පාර කැඩිලා ගිහිල්ලා. මේ පාරවල් නිකං අලවලා තියෙනවා. හදලා යන්න ඉස්සර වෙලා කැඩිලා ගිහිල්ලා. අවුරුදු පහක සේවා කාලයක් දෙනවා කියලා කියනවා. දැන් කරන්න වෙලා තියෙන්නේ සභාවේ සල්ලි වලින්. ඒවා අපිට වෙන තැන්වලට යොදවන්න පුළුවන් සල්ලි. මේ පිළිබඳව අපි විශේෂ සභාවක් අරගෙන හරි සාකච්ඡා කරමු. අද දවසේ හැමෝටම දේශපාලන වැඩ වලට යන්න තියෙනවානේ. අනවසර ඉදිකිරීම්, ගොඩකිරීම් පිළිබඳව වහාම ගන්න පියවරක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ප්‍රගතියේ දීලා තියෙනවා ගිංතොට ඇවිදින මංතීරුව ඉදිකිරීම සම්බන්ධව. එතකොට මේ ඇවිදින මංතීරුවේ වැඩ තාම නිම කරලත් නෑ. අනිත් එක තමයි ඒ මංතීරුවේ හැම තැනම පැලිලා. මේක ලක්ෂ 10 ක වැඩක් කියලා හිතුවේ. බලනකොට ලක්ෂ 23 ක වැඩක් මේක. අනිත් එක ගරු සභාපතිතුමනි, මේ ඇවිදින මංතීරුවට ප්‍රවේශ මාර්ගයක් නෑ. ප්‍රවේශ මාර්ගයක් නැතුව කොහොමද මේක හැදුවේ. මංතීරුවක් තියෙනවා නම් ප්‍රවේශ මාර්ගයක් තියෙන්න එපැයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙන් තමයි ඔක්කොම කරන්නේ. පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මෙහෙන් කරන්නේ. සභාවෙන් තමයි සියලු කටයුතු අධීක්ෂණය කරන්නේ. අනුමත කරන්න ඇත්තේ එහෙන්. මම හිතුවේ ඒක ලක්ෂ 10 ක වැඩක් කියලා. සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙනුත් මම ඉල්ලීමක් කරනවා පොඩ්ඩක් ගිහින් බලන්න ඒක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා ඒක මතුකරපු එක හොඳයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඊට අමතරව තවත් වැඩක් කරලා තියෙනවා. ගංවතුරට ළමයි දෙන්නෙක් ගඟේ ගියා. ඒක නිසා වැටක් ගහන්න සල්ලි පාස් කරලා තියෙනවා ලක්ෂ 20 ක්. ලක්ෂ 10 ක විතර වැටක් ගැහුවා. තාප්ප ගහලා කණු වගයක් දාලා හැදුවා. මේ පාර ගම්පෙරළියෙන් ඒකට සල්ලි වගයක් පාස් කරලා අපි වැට ගැහුවා. වැට ගැහුවට පස්සේ වැටේ ඉඳලා අඩි එක හමාරක් විතර තියලා පස් ටික හාරලා. දැන් තාප්පෙත් ගලවන් වැටෙන තත්ත්වයක් තියෙන්නේ. ඒක නිසා මම මෙහෙට ලියුමකුත් දීලා ඇති. ඒක නිසා ඒ ගෙවීම් කරන්න එපා. ලක්ෂ ගාණක ගෙවීම් කරලා හදපු තාප්පය කඩන් වැටෙයි. ඒ තාප්පය වැටීමේ අවධානම නැති කරන්න ඕන. එයාම තමයි ඒක කපලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක ගිහින් බලමුද?.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා එන්න. ඒක ගිහින් බලමු. එතකන් ඒකට ගෙවීම් කරන්න එපා. ඒකට දැඩි විරෝධතාවය ප්‍රකාශ කරනවා. සම්පූර්ණයෙන්ම ඔබතුමා ඒක ඇස් දෙකෙන් බලන්න. බැලුවට පස්සේ කටයුතු කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වතුර පිළිබඳ ප්‍රශ්නයට ප්‍රගතියක් නෑ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** කාසල් වත්තේ අනවසර ඉදිකිරීම් සම්බන්ධව මම දිගින් දිගට කතා කරනවා නඩු දාන්න කියන එක. ඒක ප්‍රගතියට ඇවිල්ලත් නෑ. නඩු දාලත් නෑ. ඒ වගේම පියවරගම මාර්ගය මනින්න ගිහිල්ලා ඒකට නඩු දානවා කිව්වා. ඒ මිනිස්සුන්ට ලියුම් එවලා කිවුවා. ඒ ගමේ මිනිස්සු අහනවා ලියුම් ටික කෝ කියලා. හම්බවෙලා නෑ කියනවා. යෝජනා කරනවා

විතරයි. සභාව තුළ කාරණා කෙරෙන්නේ නෑ කියලා තමයි අපිට සිහිපත් වෙන්නේ. යෝජනා කරනවා විතරයි. එතනින් එහාට දෙයක් සිද්ධ වෙන්නේ නෑ. ඒ වගේම ගරු සභාපතිතුමනි, කපිල මහත්තයාගේ ප්‍රශ්නයටත් පියවරක් අරන් නෑ. අඩි ගාණ පාරේ තියෙනවා. මාටින් පෙරේරා මාවත කියන්නේ අඩි 17 ට ගැසට් කරපු පාරක්. ඒ නඩු දාන්න කලින් කපිල මහත්තයාලගේ ගෙදර කාණුවක් කැපුවනේ. ඒ මිනිස්සු ආයේ ඒ කාණුව වහලා තියෙනවා. ඒකට පියවරක් ගන්න. ඒ අය සභාවෙන් කපපු කාණුව වහලා තියෙනවා. ඒකත් හොයලා බලලා කටයුතු කරන්න.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ සභාව තුළ යම් යම් මන්ත්‍රීවරු බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග නම් කිරීම පිළිබඳව යෝජනා ඉදිරිපත් කරා. මමත් යෝජනා ඉදිරිපත් කරා. ඒ වගේම භාවිතයට ගැනීමට අපහසු, සෞඛයට අහිතකර පොදු ළිං කිහිපයක් තියෙනවා. ඒවා වහන්න යෝජනා කරා. ඒවා යෝජනා කරාට පස්සේ මාර්ග නම් කිරීම සම්බන්ධව විරෝධතා බැලුවද?. ළිං වහන එක බැලුවද?. ඒ පිළිබඳව කටයුතු කරන්න කියලා මම ඉල්ලීම කරනවා. මොකද යෝජනාව විතරයි එතනින් එහාට මුකුත් නෑ. මාස ගාණකට කලින් කරපු යෝජනා මේ. ඒවා ඉදිරියට එන්නේ නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මාර්ග නම් කරන යෝජනා මොනවද දන්නේ නෑ නේද?.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** උදුල මන්ත්‍රීතුමා යෝජනා කරා. මම යෝජනා කරා කාසල් වත්තේ මාර්ගයක් නම් කරන්න. පණ්ඩිත මන්ත්‍රීතුමා යෝජනා කරා. ගයාත්‍රී මන්ත්‍රීතුමිය යෝජනා කරා. ඒවාට ගමට ගිහින් විරෝධතා බලලත් නෑ තවම. සෞඛ්‍ය අනාරක්ෂිත ළිං වගයක් වහන්න කියලා යෝජනා කරානේ. ඒ ළිං ටික වහන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට මතකයි වඩුඩ් මන්ත්‍රීතුමාගේ නමින් පාරක් නම් කරන්න යෝජනා වුණානේ. ඒකවත් ගියේ නැනේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ වගේම කාසල් වත්තේ නො. 259 නිවස අසළ ප්‍රාදේශීය සභාවේ සල්ලි යොදවලා පෙට්ටි බෝක්කුවක් සකස් කරා මගේ යෝජනාවක් යටතේ. දැන් අසල නිවසේ අය පස් ටික ඇදලා පාර දෙපසට දාලා පහුගිය කාලේ වරුසාවත් එක්ක පස් ටික ඔක්කොම කාණුවට ඇවිල්ලා බෝක්කුව හිරවෙලා තියෙන්නේ. තාමත් ඒ පස් ගොඩ තියෙනවා. කවුරු හරි යවලා ඒ ගෙදරට කියලා හරි පස් ටික අස් කරන්න. ඒ අය කියන්නේ සභාවෙන් අනුමැතිය ගත්තා කියලා පස් ටික පාරට දාන්න. සභාපතිතුමා ප්‍රශ්නයක් නෑ කිවුවා කියලා තමයි අවට මිනිස්සුන්ට කියලා තියෙන්නේ. මගේ ගෙවල් ලඟ නිසා මටත් ප්‍රශ්නයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද?.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** 259 ගෙවල් ගාව. සභාවටත් ආවේ අනූෂා දමයන්ති කියලා කෙනෙක්. අපේ ගෙවල් වලට යන පාරේ. සභාපතිතුමත් ගියා බලන්න. තාප්පේ ගඩොල් වලින් බැඳලා කඩාගෙන ආවේ. අන්න ඒකේ පස් ටික ඇදලා පාර දෙපැත්තෙන් ගොඩ ගහලා තියෙනවා. දැන් ඔක්කොම හෝදන් ඇවිල්ලා කාණුවේ. ඒ ගොල්ලන් කිවුවේ සභාවේ අනුමැතිය අරගත්තා කියලා. සභාපතිතුමා කිවුවා කියනවා දාන්න කියලා. මටත් හොඳ නෑ. අහල පහළ මන්ත්‍රීවරයා විදියට සහය දුන්නා කියලා හිතනවා. දැන් ඉදිරිපත් කරේ ඒක. කලින් කියපු එකක් නෙමෙයි. මේ කාරණා ටික ප්‍රගතියට ආ යුතුයි. ප්‍රගතිය කියලා අපි යෝජනා කරපු දෙයක් අද වෙනකම් ඇවිල්ලා නෑ.

( ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, අපිට දැන් ඩයලොග් බිල දිගින් දිගට එනවා. භාවිතා කරෙත් නෑ ගොඩක් මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන්. ශ්‍යාමිකා මන්ත්‍රීතුමිය එපා කියද්දිත් එයාටත් සිම් එක ලබා දීලා තිබුණා. එයාටත් රු. 1222.00 ක බිලක් ඇවිල්ලා තියෙනවා. මාත් භාවිතා කරේ නෑ. කීප දෙනෙක් විතරයි මේක භාවිතා කරන්නේ. මේක මම හිතන්නේ ඉවත් කර ගත්තොත් හොඳයි කියලා කියනවා. එදා මම යෝජනා කරා ඒ ආපු නියෝජිතයාට ඩයලොග් ආයතනයෙන් මේක අපේ සිම් එකකට හරවා ගන්න පුළුවන්ද කියලා. එයා කිවුවේ ටික දවසකින් හරවලා දෙන්නම් කියලා. මම එයාගෙන් ඇහුවහම කිවුවා පහුවෙලා තමයි කර ගන්න වෙන්නේ සභාපතිතුමයි, ලේකම්තුමයි අත්සන් කරලා ලියුමක් ගේන්න කිවුවා. නමුත් දැන් දිගින් දිගට බිල් එනවා භාවිතා නොකර. ගොඩක් මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට මේ ගැටලුව ඇති. ඒ නිසා මේ සම්බන්ධව කිසියම් පියවරක් ගන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තමන්ගේ දැන් දුරකථන අංකයට මාරු කරන්න ඕන අය ඒ ඒ විස්තර දෙන්නකෝ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එතකොට සභාපතිතුමා මේ බිල් දෙකම ගෙවන්න වෙනවාද?.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඔව් ගෙවන්න වෙනවා. මම ඇහුවා. ඒක දැන් තමන්ගේ තියෙන එකට හරවලා දෙනවා. මේ ඇරියස් එක ගෙවන්න වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ සිම් එක පාවිච්චි කරලම නැද්ද?

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපි පාවිච්චි කරලම නෑ.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමාගෙන් අවසරයි. සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ඉල්ලලා කතාවක් ගත්තේ මොකටවත් නෙමෙයි. සභාවේ වාඩිවෙලා ඉන්න විදිය ගත්තහම එක පැත්තක් නිහඬයි. අනික් පැත්ත කෑගහනවා. අදහස් නැතුව නෙමෙයි අදහස් බොහෝ ආවා. මම කැමති නෑ දහයක් විතර කෑ ගහන කොට කතා කරන්න. එක්කෙනෙක්වත් කියන දේ කාටවත් තේරෙන්නේ නෑ. අපි නිහඬව හිටියේ ඒ නිසා. ඒ නිසා මම ගෞරවනීය මන්ත්‍රීතුමියලා, මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලනවා මම කතා කරන අදහස් වලට යම් යම් ආකාරයෙන් ඔබතුමන්ලාට උත්තර දීම අවශ්‍ය වුණත් මගේ කතාව අවසන් වන තුරු කතා කරන්න එපා. එහෙම නැත්නම් ඒක තේරුමක් නෑ. ගරු සභාවක් විදියට ගමට, කොට්ඨාශයට වගකියන මන්ත්‍රීවරයෙක් විදියට අපි ඔක්කොම ඇවිල්ලා ඉන්නේ සභාවට වැඩක් කරන්න. පක්ෂ විපක්ෂ එක වෙනම එකක්. අදහස් ප්‍රකාශ කිරීම පැහැදිලිව එක එක්කෙනා ප්‍රකාශ කරනවානම් මේ තියෙන ගැටළුකාරි තත්ත්වය ඇති වෙන්නේ නෑ. ඒ නිසා මම බොහොම වගකීමෙන් කියනවා ඔබ හැම දෙනාම නිකරුණේ කතා කරන්න එපා. වචන ගොඩක් තිබුණත් මම ප්‍රකාශ කරන්නේ නෑ. එක්කෙනෙක් කතා කරලා ඉවර වෙන තුරු තව කෙනෙක් කතා කරන්න එපා කියන ඉල්ලීම කරනවා. මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් ඉන්නවා මට වැඩිය වැඩිහිටි අය. ඒ හැම දෙනාගෙන්ම ඉල්ලනවා. හේතුව ගත්තහම සද්ද කර ගත්තහම කිසි දෙයක් තේරෙන්නේ නෑ. එතුමන්ලත් කෑ ගහනවා, මෙතුමන්ලත් කෑ ගහනවා. ඝෝෂාකාරී තත්ත්වයක් විතරයි වෙන්නේ. මාධ්‍යයට යන්නේ විනයක් නැති, හික්මීමක් නැති සභාවක් විදියට. ඒ නිසා බොහොම ගෞරවයෙන් ඒ ඉල්ලීම ඉල්ලනවා. මා කතා කරලා අවසන් වෙන තුරු ඔබතුමන්ලා අදහස් ප්‍රකාශ කරන්න එපැයි කියලා ඉල්ලනවා. එතකොට මට කතා කරන්න බැරි වෙනවා. ඒ නිසා බොහොම ගෞරවයෙන් මතක් කරන්නේ සියලු දෙනාටම.

පොහොට්ටුවේ මන්ත්‍රීවරු එකොළොස් දෙනාම ඡන්දය දිනලා පත්වෙලා ආපු මන්ත්‍රීවරු. ඒ වගේම ගෞරවයෙන් කතා කරන්න ඕන. ඒ නිසා ඒ මන්ත්‍රීවරුන් තේරුම් ගන්න කවුද තේරිලා ආව මන්ත්‍රීවරු කියලා.

ඊළඟට මෙතුමියලා කතා කරා ජනාධිපතිතුමන්ලා ගැන. ජනාධිපති අපේක්ෂකතුමන්ලා ගැන. දෙපැත්තෙම අපේක්ෂක තරඟයක් හා විවාදයක් යනවා. ජනාමාධ්‍ය තුලින්, සමාජ මාධ්‍ය තුලින් නොයෙකුත් දේවල් අපි දකිනවා. නමුත් මෙතනදී ඒක කාරණයක් කරගෙන රණ්ඩු වෙන එක මම තරයේ හෙළා දකිනවා. නමුත් තව කරුණු තියෙනවා. ඒවා මට වැඩිය හොඳට ඔය ගොල්ලෝ දන්නවා. යුද්ධය ආරම්භ කරේ කොහොමද කියන්න දන්නවා. ඒවා නොදැන නෙමෙයි මේ කතා කරන්නේ. ඒ ගැන විරුද්ධව කතා කරපු අය ඒක හරියි කියනවා මම දැක්කා. යාපනයේ පුස්තකාලය ගිනි තියලා කොහොමද යුද්ධයට අර ඇද්දේ කියන එක මම නැවත මතක් කළ යුතු නෑ. මම බොහොම කෙටියෙන් සඳහන් කරන්නේ.

සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පියාණන් හිල්ටන් හෝටලයට ඇන්ටන් බාලසිංහම් ගෙනල්ලා මුදල් දුන්නේ කොහොමද කියලා කතාවක් මේ රටේ ජනතාව තුළ තියෙනවා. වැඩිහිටි සියලු දෙනාම, ගම්වල ඉන්න සියලු දෙනාම ඒක දන්නවා. ඒ නිසා ඒ පිළිබඳවත්, විවෘත ආර්ථිකය ලංකාවට ගෙනල්ලා මේ සිංහල ජාතියට, මේ සිංහල රටට වෙච්ච හානිය පිළිබඳව අපි අමුතුවෙන් කතා කළ යුතු නෑ. අපිට වරද නිවැරදි කර ගෙන යන්නයි ඕන. රටට අවශ්‍ය වන්නේ හොඳ නායකයෙක් කියන එක අපි තේරුම් ගන්න ඕන. ගම්වල අපි නායකයෙක් විදියට ඉන්නවානම් ගමට වැඩ කරන්න ඕන නම් ඇවිත් රණ්ඩු කරලා, ඝෝෂා කරලා හැසිරීම නෙමෙයි කළ යුත්තේ. තමන්ගේ අදහස් ප්‍රකාශ කරලා සභාවේ යෝජනා ස්ථිරත්වය අරගෙන ඒ වැඩ ටික කරන එක විතරයි තියෙන්නේ. හමුදාවේ වසර 22 ක් ඉඳපු නිසා මට යම් ආකාරයක දැනීමක් තියෙනවා. ලුතිනන් බැදිසිංහ කියන ලුතිනන් වරයා මොන ආකාරයටද ආයුධ ටික දුන්නේ, ආයුධ ටික අරන් ගිහිල්ලා එනකොට එතුමා මරන්න සූදානම් කරේ කවුද කියන එක පිළිබඳව රහසක් නෙමෙයි මේ රටට. ඒවා කරේ කවුද කියන එක

පිළිබඳව දන්නවා. එතුමා පැනලා ගිහිල්ලා ත්‍රී.ෆයිව්.සික්ස් එක නැවත ගෙනල්ලා මම මේ ආකාරයට බේරුණා කියලා ඔප්පු කරපු යුගයක් මේකේ තිබුණා. ඒක හැම දෙනාම දන්නවා. නිකං බොරුවට අද මඩ ගහනවා. ගෝඨාභය මහත්තයා රු. 1000.00 ක් දෙනවා කිව්වහම ප්‍රේමදාස මහත්තයා රු. 1500.00 ක් දෙන්නම් කියනවා වතු කම්කරුවන්ට. රු.50.00 වැඩි කර ගන්න බැරි වුණා එතුමට. එතුමා ඒ රජයේ හිටියා. දැන් කියනවානම් කිසි දෙයක් විදේශීකරණය කරන්නේ නෑ කියලා හම්බන්තොට වරාය විකුණනකොට එතුමා හිටියා. ඒ නිසා මේ කියන කතාව පරස්පරයි, විරුද්ධයි. මම ඒකට විරෝධය පානවා. බොහොම ගෞරවයෙන් නැවත වාරයක් මතක් කරනවා සභාවක් විදියට තියෙන පිළිවෙලට, තියෙන යෝජනා වලට අදහස් ප්‍රකාශ කරන්න. ඒවාට උත්තර දෙන්න සභාපතිතුමා. අපි ඒවා ස්ථිර කරන්නම්. ඝෝෂාකාරි ලෙස හැසිරෙන්න එපා. මේක විහිළුවට ගන්න එපා. මේ ගෞරවනීය විදියට කරගෙන යමු. සභාපතිතුමාට ගරු කරමු. එතුමා ඒ කියන වැඩ කටයුතු කරමු කියන ඉල්ලීම කරනවා සියලු දෙනාගෙන්ම. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි අපිට ප්‍රගතිය ගැන කතාකරන මේ අවස්ථාවේදී යමක් ප්‍රකාශ කළ යුතුව තියෙනවා. පහුගිය මාසය තුළදි ඇතිවෙච්ච අයහපත් වර්ෂා තත්ත්වය නිසා මේ ප්‍රදේශයේ සමහර මංමාවත් අබලන් තත්ත්වයට පත් වුණා. ඇළ මාර්ග අවහිර වුණා. කාණු පද්ධති අවහිර වුණා. ජලය බැස යාමේ ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. ඒ තත්ත්වය වළක්වාලීම සඳහා ඒ තත්ත්වයට සුදුසු පිළියමක් සොයා ගැනීම සඳහා පහුගිය සභාව විසින් යෝජනා කරනු ලැබුවා කුලී පදනම මත එක්ස්කැවේටර් යන්ත්‍රයක් හා අවශ්‍ය වෙනත් වාහන කුලී පදනම මත ලබා ගෙන එම වෙච්ච ආපදාව නැවත යථා තත්ත්වයට පත් කරන්න. නමුත් අපිට කණගාටුවෙන් වුණත් ප්‍රකාශ කරන්න තියෙනවා අපිට ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණේ කොතෙක් දුරටද කියලා. සමහර විට දිගින් දිගටම පැවති අයහපත් කාලගුණය නිසා සමහර ඇළ මාර්ග, සමහර කාණු පද්ධති වතුර පිරිලා නිසා පවිත්‍ර කර ගැනීමේ හැකියාවක් නෑ. නමුත් අපි කුලී පදනමට ගැනීමට යෝජිත එක්ස්කැවේටර් යන්ත්‍ර සඳහා මිල ගණන් කැඳවලා කාලගුණ තත්ත්වය යහපත් වූ වහාම එම වරද නිවැරදි කර ගැනීමට උත්සාහ ගත යුතුයි. ඒ නිසා ගරු සභාපතිතුමනි ඒ සඳහා ඉක්මනින් ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඊළඟ කාරණය තමයි මේ අනතුරුදායක ගස් පිළිබඳව මතු වෙච්ච අදහස්. ඒ අදහස් වලදි අනතුරුදායක ගස් කැපීමට මිනිස්සුන් විසින් පෙළඹුණු තත්ත්වයක් ඇති වුණා මේ සුළං කාලය එක්ක. ඒ නිසා සභාවක් හැටියට යම් පහසුවක් ඇති වුණා මම හිතන්නේ මේ ගස් ඉවත් කිරීමේ ගැටළුව. තවත් තියෙනවා අනතුරුදායක ගස්. ඉදිරියට එන්නේ මෝසම් සුළං කාලය. ඒ නිසා ඉක්මනින් ඒ අනතුරුදායක ගස් ඉවත් කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. අපි මීට වඩා වේගයෙන් වැඩ කරන්න පුළුවන් ප්‍රාදේශීය සභාවක්. නමුත් අපිට තියෙන මූල්‍ය ප්‍රතිපාදන අඩු වීම නිසා, මධ්‍යම රජය විසින් අප ප්‍රාදේශීය සභාවට මුදල් ලබා නොදුන්න නිසා පළාත් සභාව විසින් අප වෙත මුදල් ලබා නොදුන් නිසාත් අපිට යම් කිසි පසුගාමීත්වයක් ඇති වෙලා ඇති බව කවුරුත් පිළිගන්නවා. නමුත් අපි ඉදිරියේදී මීට වඩා හොඳ වැඩපිළිවෙලක් කරා යන්නට ලබන සභා වාරය වන විට මේ රටේ ස්ථිර වශයෙන් පිහිටුවන නව පොදුජන පෙරමුණේ රජයක් යටතේ මේ ප්‍රාදේශීය සභාව ඉතාමත් කාර්යක්ෂමව ඔප් නංවන්න හැකියාවක් ලැබේවායි ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා. ඔබ සැමට ස්තුතියි.

( ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මේ මුල් අවස්ථාවේ මෙතන වාදයක් යන විට ප්‍රකාශ වුණා පක්ෂ විපක්ෂ දෙපැත්තෙන්ම කියවුණා යම් කතාවක්. හැබැයි මේ අය දන්නේ නැතුව ඇති එයාලා තරග වැදුණේ පවතින මැතිවරණ නීතිරීති යටතේ බව. එතකොට අද ඔබ සතුටු වෙනවා ඇති වීරයෝ වගේ කොට්ඨාශයේ. හැබැයි අපිත් තරග වැදුනේ කොට්ඨාශයටම තමයි. හැබැයි අපි කාගේවත් කර පිටින් ආවේ නෑ. කාගේවත් රූප ගහගෙන නෙමෙයි අපි ඡන්දය ඉල්ලුවේ. මේ අපිට දුන්නේ පෞද්ගලිකව අපිට ඡන්ද. නැත්නම් ඒවත් ජයග්‍රාහි කණ්ඩායමට ලැබෙන්න ඕන. හැබැයි මතක තියා ගන්න ලබන වාරයේ ප්‍රාදේශීය සභාවට තරග වදින කොට වෙනත් කණ්ඩායමකට ජයග්‍රාහණය හිමි වුණොත් ඔබතුමන්ලත් ඒ කියපු මන්ත්‍රීවරු වෙයි. මම මේ පක්ෂ විපක්ෂ කාටත් කියන්නේ. ඒ නිසා පවතින මැතිවරණ නීති රීති යටතේ ප්‍රතිපත්ති රාමු යටතේ තරග වදින කොට අරහෙම මන්ත්‍රීවරු කියලා කවුරුහරි කියනවානම් ඒක වැරදියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රීතුමා කියන්න ඕන කියපු අයටමයි.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මම කිවුවේ දෙපැත්තටම.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකද ඒකේ ඇඟිල්ල දික් වෙන්නේ මේ පැත්තට.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මම කිවුවනේ පක්ෂ විපක්ෂ කියලා

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දැන් කියන්නේ ඔබතුමාලා දිනලා එන කොට වෙනස් වෙයි කියලද?.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මෙතුමාගේ කතාවෙන් කියවුණා. ඒ මන්ත්‍රීවරු කවුද කියලා තම තමන් දැන ගන්න. ලබන වාරයේ ඔබතුමන්ලා විපක්ෂයට ආවොත් ඒ මන්ත්‍රී තමයි වෙන්නේ. මම මේ ඔබතුමන්ලාට නෙමෙයි අනිත් අයටත් දැන ගන්න එක්කයි කියන්නේ. අනිත් එක එහෙම මන්ත්‍රීවරු වෙන්න අපි කාගේවත් රූප කොට්ඨාසයේ ගහ ගත්තේ නැහැ මහත්තයෝ. මම ගැහුවේ මගේ රූපය පමණයි. චූටියටවත් කාගේවත් රූපයක් ගහගෙන ඒ පිනෙන් ගොඩ ආපු අය නෙමෙයි අපි. ඒ නිසා පක්ෂ විපක්ෂ දෙපැත්තටම කියලා කිවුවේ ඒකයි. ලබන වාරයේ ඔය කොට්ඨාශ ජයග්‍රාහකයෝ ලිස්ට් එකෙන් එන්න පුළුවන්. ඒක නිසා මේක වාර්තා ගත වෙනවා නම් එදාටත් මට කියන්න කරුණු තියෙනවා. නැත්නම් ඔය කතාව වාර්තාගත කිරීමෙන් ඉවත් කරන්න.

( ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉවත් කරන එකට මමත් එකඟයි. මේ මැතිවරණයේදී කාගේවත් රූපයෙන් නෙමෙයි තමන්ගේ ප්‍රතිරූපයෙන් කවුරුත් ආවේ. ඕක දිගින් දිගට කතා කරන්න එපා. ඔබතුමත් නියෝජනය කරේ රටේ ජනාධිපතිගේ පක්ෂය. රටේ ජනාධිපති නියෝජනය කරමින් තමයි ඔබතුමා තරඟ කරේ. අපි තරඟ කරේ ඊට විකල්ප ආණ්ඩු බලය නැතුව මහින්ද රාජපක්ෂ මහතා නියෝජනය කරමින්. ඒ වගේම එක්සත් ජාතික පක්ෂය රනිල් වික්‍රමසිංහ මහතා නියෝජනය කරමින් තරඟ වැදුණා. ජනතා විමුක්ති පෙරමුණ අනුර කුමාර දිසානායක මහතා යටතේ තරඟ වැදුණා. පක්ෂ නායකත්වය ගැන මම කිවුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔය තත්ත්වයට ආවොත් මට ගොඩක් දේවල් කියන්න පුළුවන්. ඔබතුමා කියපු විදියට කොට්ඨාශ තරඟ වැදුණේ තමන්ගේ අභිමතයට නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැතෙයි කියන්න එපා. අපි දැම්මේ ලැයිස්තුවේ ඉඳපු කෙනා.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** හැබැයි කොට්ඨාශයේ තරඟ වැදුණු අපේක්ෂකයාට වැඩිය තිබුණේ වෙනත් කෙනෙක්ගේ පින්තූර කියන එක මම කිවුවේ. ඒකත් සභායක් වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මිනිස්සුන්ගේ මතය. මිනිස්සුන්ගේ හද ගැස්ම. එහෙමනම් ඔබතුමා ඉල්ලුවේ ඡන්ද ලක්ෂ 62 ක් ගනිපු ලංකාවේ ඉන්න ජනප්‍රියම ජනාධිපතිවරයාගේ පක්ෂයෙන්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඉතිං අපි යූ.එන්.පී. කාරයෝ කියලා කිවුවා. ඔබතුමාලා තමයි වැඩියෙන්ම අපිට ගැහුවේ මේ මැතිවරණයේදී

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද ගැහුවේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** අපි මෛත්‍රීගේ පිලේ ඒක තමයි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඕක දිගින් දිගට යන්න ඕන නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ප්‍රියන්ත මන්ත්‍රීතුමා කියපු එකක් මම අනුමත කරනවා. මේ මැතිවරණ ක්‍රමය තුළ මන්ත්‍රීවරු විසිදෙදෙනෙක් මේකට එන්න ඕන. කොහොම හරි තමන්ගේ පක්ෂය නියෝජනය කරමින් විසි දෙදෙනෙක් ඇවිල්ලා ඉන්නවා. මේකට ආවට පස්සේ විසිදෙදෙනාම මන්ත්‍රීවරු. මෙන්ම මේ වචනයේ වැරැද්ද වුණේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙතුමා පෞද්ගලික ප්‍රකාශයක් කරා. ඒ ප්‍රකාශයට අපි ඒ අවස්ථාව ලබා දුන්නා. ඒ අවස්ථාවේ එතුමා ප්‍රකාශ කීපයක් කරා. මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු සම්බන්ධයෙන් කාරණයක් මතු වුණා. ඒ කාරණය එතරම් සාධාරණ නෑ. මෙතන එහෙම මන්ත්‍රීවරු කවුරුවත් නෑ. එහෙම නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කිවුවේ කවුද?

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කිවුවයි කියලත් කියනවානේ. ඔබතුමා හිතන්නේ මෙතන කොට්ඨාශ 11 ක් දිනාගෙන ආපු මන්ත්‍රීවරුන්ට එතුමිය ඇඟිල්ල දිගු කරා කියලා කියනවානම් එහෙම මන්ත්‍රීවරු කියලා ඔබතුමා මොකද හිතන්නේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මම කිවුවේ පොල්ලෙලි වගේ ආවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොල්ලෙලි වගේ ආවේ නෑ. කොහොම හරි කමක් නෑ ඡන්දයකට ගිහින් ආවේ. මාර කතාවක්නේ ඒක. එහෙම කතා කරන්න එපා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ කාරණය පොදුවේ අපි කවුරුත් සම්බන්ධ කාරණයක්. මටත්, අපිටත් තියෙනවා ඒ සම්බන්ධව කතා කරන්න. හැමදාම මම දැකපු කාරණාවක් තමයි ඔක්කොම කතා කරද්දි කෑ ගහනවා. ඒක නවත්වන්න. මෙතන හසුරුවන්න.

තිබුණු මැතිවරණය යටතේ අපේ නියෝජනය තමයි මේ තියෙන්නේ. මන්ත්‍රීවරු දෙදෙනෙක් නියෝජනය කරන්න අපිට හම්බ වුණා. සමානුපාතික නියෝජනය අනුව හමු වුණු අවස්ථාව මේ. ඔබතුමන්ලා කොට්ඨාශ ජය ගත්ත එක හරි. අදාළ නියෝජනය ලැබිලා තියෙනවා. ඒ කරපු අර්ථ නිරූපණය වැරදියි මන්ත්‍රීවරු සම්බන්ධයෙන්.

මෙතුමා ජාතික දේශපාලනය සම්බන්ධව කාරණා කතා කරා. පහුගිය කාලයේ යුද්ධය වෙච්ච හැටි, අවි ගනුදෙනු සම්බන්ධයෙන් කතා කරා. ඒ ජාතික දේශපාලනය ගැන කතා කරන කොට අපිටත් කතා කරන්න පුළුවන් කාරණා ගොඩක්. එතකොට පහුගිය කතාකරන කාලයේදී රූපවාහිනියේ ප්‍රවෘත්ති කියන කොට "පීක්" කියලා තමයි ඉතුරු ටික කිවුවේ. එහෙම කාලයක් අපි අත්වින්දා. මිනිස්සුන්ට කරපුවා නෙමෙයි, රජයේ ආයතන වලට ඒක බලපෑවා. මාධ්‍ය නිදහස ඒවා කතා කරනවානම් අපිට ඕන තරම් කතා කරන්න පුළුවන්. මේවා රටේ මිනිස්සු දන්නවා. හැබැයි මේ රටේ අපි, ජනතාව කවුරුත් ලෙඩක් හැදුනහම ලෙඩේට හොඳම දොස්තර හොයා ගන්නවා. වහල හදන්න ගියොත් හොඳම වඩුවා හොයා ගන්නවා. ගේ හදන්න හොඳම දක්ෂ මේසන් බාස්ව හොයා ගන්නවා. හැබැයි අපි රටේ පාලකයා, බලය දීලා නියෝජනය දීලා අපිව පාලනය කරන කොට ඒ පාලකයා කොහොම තෝරනවාද කියලා අපිට පේනවා. රට ගෙනාපු තැන දැක්කම අපිට ඒක තේරෙනවා කවුද තෝරන්නේ කියලා. ජාතික දේශපාලනය ගැන අපිටත් කතා කරන්න පුළුවන්. මේ කාරණා හරියට තේරුම් අරන් දේශපාලනය කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි බොහොම ස්තුතියි. ප්‍රගති වාර්තාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම**

**1. පොදු ගෙවීම් ඃ-** නැත

**2. කර්මාන්ත ගෙවීම් ඃ-** නැත

**3. සේවක ණය ගෙවීම් ඃ-**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** එස්. ටී. ජී. සී. ද සිල්වා මයා, දසමස් වැටුප් අත්තිකාරම් ගෙවීම රු. 242,900.00

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ගෙවීම ඒකමතිකව සහා සම්මත විය.

**<u>III. ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම ඃ-</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** තොටගොඩ, මහවත්ත පාර කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම. රු. 425,000.00

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 02.** ඇලබඩ පන්සල අසල කොළඹ වත්ත පාර සංවර්ධනය කිරීම. රු. 50,000.00

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>IV. මිල ගණන් කැඳවීම් ඃ-</u>** නැත

**<u>V. ලිපි ඉදිරිපත් කිරීම ඃ-</u>** නැත

**<u>(උ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා</u> ඃ-** නැත

මීළඟ මහා සභා රැස්වීම 2019.11.19 වන අඟහරුවාදා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.